# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,255 — 1964 දෙසැම්බර් 11 වැනි සිකුරාද — 1964.12.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1803 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 1838 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1813 | ආණ්ඩුවේ නොවන දන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම ... ... ... | 1821 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම ... ... | 1835 | වෙන්දේසි කිරීම පිළිබඳ දන්වීම්... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1836 | විවිධ දන්වීම් ... ... ... ... | — |


## තනතුරු ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පල කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය නොක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත්

## විශේෂ නිවේදනයයි

1964 දෙසැම්බර් 25 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින් 1964 දෙසැම්බර් 24 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම් සඳහා එවන සියළුම දන්වීම් සහ නිවේදන, 1964 දෙසැම්බර් 19 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව සැමගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 දෙසැම්බර් 4 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් ලැබුණ බව දන්වනු ඇත. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට සත් දිනක් ඇතුළත තම අයදුම්පත ලැබුණ බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වේ නම්, වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 දෙසැම්බර් මස 7 වන දින,
තැ. පෙ. 500, කොළඹ 1,
ගාළු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

12-574—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලඝු ලේඛන තනතුරු

ලංකා විදේශ දූත මණ්ඩලවල ලඝු ලේඛක තනතුරු සඳහා ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ ස්වකීය පත්වීම්වල සේවයෙහි ස්ථිර කරනු ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම තනතුරු පිරවීම සඳහා තෝරාගනු ලබන නිලධාරීන්ට ඔවුන් දැනට දරණ තනතුරට අයත් වැටුපම ලැබෙන අතර, ලංකාවේදී ගෙවන ගෙවල් කුලී දීමනාව, ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වෙනුවට විදේශ දීමනාවක් ගෙවනු ඇත. අනෙකුත් සේවා කොන්දේසි විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ඇති අන්දමටය.

3. මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන නිලධාරීන් විදේශ සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසුදැයි බලාගනු වස් වෛද්‍ය පරීක්ෂණයකට භාජන විය යුතුය. තවද, හතර අවුරුදු කාලපරිච්ඡේදයක් විදේශයේ සේවය කිරීමට ඔවුන්ට නියම වනු ඇත.

4. අයදුම්පත් පහත දැක්වෙන උප ලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට විය යුතු අතර, ඒවා සාමාන්‍ය කාර්යාලීය මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු ය. තවද, විදේශ සේවය සඳහා අයදුම්කරු සුදුසු බවට හා තෝරාගනු ලැබුවහොත්, දැනට දරණ තනතුරෙන් වහාම මුදා හැරීමට හැකි බවටද අයදුම්කරු දැනට සේවය කරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් සටහනක් අයදුම්පත මත විය යුතු ය.

5. මීට ඉහතදී මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කොට ඇති අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. අයදුම්පත් 1964 දෙසැම්බර් මස 25 වැනි දින හෝ ඊට ප්‍රථම මෙම අමාත්‍යාංශයට ලැබිය යුතුය.

ඇන්. කිවු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
සෙනෙට් මන්දිරය,
කොළඹ 1,
1964 දෙසැම්බර් මස 4 වැනි දින.

### උපලේඛනය

අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

ජාතිය :————.

විවාහක, අවිවාහක බව :————.

විවාහක නම් දරුවන් සංඛ්‍යාව :————.

අධ්‍යාපන සුදුසුකම් :————.

දැනට ලැබෙන වැටුප :————.

උපන් දිනය :————.

ලඝු ලේඛක සේවයට ඇතුලුවූ දිනය :————.

(අ) ලඝු ලේඛනය හා (ආ) ටයිප් ගැසීමේ වේගය :————.

දැනට කරණ රාජකාරියේ ස්වභාවය :————.

සිංහල විෂයයෙහි හා සිංහල යතුරු ලිවීමේ දැනට ඇති ප්‍රවීණතාව :————.

වෙනත් සුදුසුකම් :————.

12-512—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුව

### මෝටර් වාහන පරීක්ෂක තනතුරු

මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පත් පිළියෙල කොට, 1965 ජනවාරි මස 13 වැනි දින හෝ ඊට පෙර මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් කාර්යාලයට ලැබෙන සේ, මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්, තැපැල් පෙට්ටිය 533, කොළඹ 5 යන ලිපිනයට එවිය යුතු ය.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 2,100—120 වැඩිවීම් 15 සහ 180 වැඩිවීම් 5—රු. 4,800 (කායික්ෂමතා කඩඉම් රු. 2,940 ට හා රු. 4,080 ට පෙර.)

3. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම—

(i) 1965.1.13 වැනි දිනට, වයස අවුරුදු 21ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතු ය.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(iii) සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය යන විෂයයන් ද ඇතිව, විෂයයන් හයකින්, පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී තිබිය යුතු ය.

(iv) අපේක්ෂකයින්ට මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුමක් තිබිය යුතු අතර, ඔවුන්, පිළිගත් මෝටර් ගරාජයක හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයක ආධුනිකයකු වශයෙන් හෝ පුහුණුව ලබන ඉංජිනේරුවකු වශයෙන් තුන් අවුරුද්දක් වැඩ කොට, ඉන්පසු පිළිගත් මෝටර් ගරාජයක පරිපාලන තනතුරක දෑවුරුද්දක් වැඩකොට තිබිය යුතු ය.

(v) මනා චරිතයකින් යුක්ත විය යුතු ය.

සංලක්ෂ්‍යය.—සිංහල මාධ්‍යයෙන් උගෙනීම ලත් සිංහලයකු නම්, ඔහු සිංහල භාෂාව යන විෂයයෙන් හෝ ඒ හා සමාන වෙනත් විෂයයකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ ඒ හා සමාන විභාගයක දී සාමාර්ථයක් ලබා තිබිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටි නිලධාරීන්ට මෙම අවශ්‍යතාවය අදාල නොවේ.)

4. සේවා කොන්දේසි.—

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) ආධුනික කාල සීමාව අවුරුදු තුනකි. ඔහුගේ සෞඛ්‍ය භාවය, කායික්ෂමතාවය, වැඩට ඇති රුචිය අවශ්‍ය තත්ත්වයේ නොපැවතියහොත් ආධුනික කාලය තුළ ඔහු සේවයෙන් පහ කළ හැකි ය.

(iii) ආධුනික කාල සීමාව තුළ ඔහු විසින් සිංහලය පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv) ආධුනික කාල සීමාව අවසානයේ දී ඔහු පත්වීමෙහි ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර නියමිත කාල සීමාවත් ඇතුළත දී නියමිත ප්‍රමාණයේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ වලින් සමත්වීම ද මත රඳා පවතී. නියමිත කාල සීමාවත් තුළ දී මෙම පරීක්ෂණවලින් සමත් නොවුවහොත් වැටුප් වැඩිවීම අත්හිටවනු ලැබීමට හේතුවන අතර නියමිත කාල සීමාවත් අවසන් වීමෙන් පසු හය මසක් ඇතුළත දී එම පරීක්ෂණවලින් සමත් නොවුවහොත් එම " අත්හිටවීම ", " නතර කිරීමකට " පරිවර්තනය කරන අතර, පරීක්ෂණ යෙන් සමත්වන තෙක් එම " නතර කිරීම " ක්‍රියාත්මකව පවතී.

(v) ආධුනික කාල සීමාව අවසානවීමට පෙර, නියමිත ප්‍රමාණයේ සිංහල ප්‍රවීණතාවය ලබා නොගතහොත් අංක 120 සහ 121 වැනි පාලන රෙගුලාසි බලපවත්වනු ඇත.

**සංලක්ෂ්‍යය.**—දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන් බඳවා ගන්නා ලද අය සම්බන්ධයෙන් ඉහත සඳහන් (iii), (iv) සහ (v) වැනි කොන්දේසි අදාළ වේ.

(vi) (1) පත්වීමෙහි ස්ථිර කළ දින සිට අවුරුදු දෙකක් ඇතුළත ඔහු විසින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග තත්ත්ව යේ සිංහල භාෂාව පිළිබඳ, නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතු ය. මෙම පරීක්ෂණයෙන් සමත් නොවුවහොත් වැටුප් වැඩිවීම පමා කිරීමට හේතුවනු ඇත.

(2) රුපියල් 2,100—120 සහ 180—4,800 යන වාර්ෂික වැටුප් ක්‍රමයේ රු. 2,940 ට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීම, රඳා පවත්නේ මේ සමාන සේවාවන්හි නිලධාරීන් සඳහා විභාග කොමසාරිස්වරයා විසින් පවත් වනු ලබන, දෙමළ (කථා කිරීමේ සහ තේරුම් ගැනීමේ) විභාගයකින් සමත් වීම මත ය.

5. අයදුම්කරුගේම අත් අකුරින් ලියන ලද අයදුම් පත් පහත සඳහන් සහතික වල පිටපත් (මුල් සහතික නොවේ) සමඟ එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය (සැලකිය යුතුයි : දිවුරුම් පෙත්සම්, බෞතීස්ම සහතික හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා නිකුත් කරන ලද සහතික පත් භාර ගනු නො ලැබේ).

(ආ) සාමාර්ථය ලබා ඇති උසස්ම විභාගය පිළිබඳ සහතික පත්‍රය.

(ඇ) අයදුම්කරු සේවය කර ඇති ගරාජයෙන් හෝ සමාගමෙන් මෝටර් යාන්ත්‍රික ක්‍රමය පිළිබඳ ඔහුගේ නිපුනත්වය දැක් වෙන, සහතිකයක් සහ

(ඈ) අයදුම්කරුගේ චරිතය හා මේ තනතුරට ඇති යෝග්‍යතාවය සම්බන්ධයෙන් මෑතක දී ලබා ගන්නා ලද සහතික පත්‍ර තුනක්.

**සැලකිය යුතුයි.**—මෙම සහතික පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍ය විය හැකි ය.

7. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබ, නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් භාර ගනු ලබන්නේ ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත නියමිත දිනට පෙර ලැබී, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස හේතු සහිතව නිර්දේශ කලහොත් පමණි.

8. තෝරා ගනු ලබන අපේක්ෂකයන් විසින් ඔවුන්ගේ රාජකාරී ගමන් බිමන් සඳහා සේවයට යෝග්‍ය තත්ත්වයේ මෝටර් රථයක් තබා ගත යුතු ය.

9. මෙම ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ දෙවන ඡේදයේ පළ වී ඇති රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි බලනු මැනවි.

10. මෙම තනතුරු පිළිබඳ අයදුම්පත් හා ඒ පිළිබඳ සියළුම ලිය කියවිලි, මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්, තැපැල් පෙට්ටිය අංක 533, කොළඹ 5 යන ලිපිනයට එවිය යුතු අතර, ඒවා පුද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට නොඑවිය යුතුය.

ඩබ්ලිව්. පතිරණ,
මෝටර්රථ ප්‍රවාහණ කොමසාරිස්.

මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 533,
කොළඹ 5, 1964.12.7.

## ඉහතින් සඳහන් කර ඇති අයදුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**මෝටර් වාහන පරීක්ෂක තනතුර සඳහා ඉදිරිපත් කරන අයදුම් පත**

1. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(ii) ලිපිනය :————.

2. උපන් දිනය සහ 1965.1.13 වැනි දිනට සම්පූර්ණ වයස : ————.

3. ජාතිය :————.

4. (අ) අයදුම්කරු උපන් ස්ථානය :————.
(ආ) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
(ඇ) අයදුම්කරුගේ පිය පාර්ෂවයේ මුත්තා උපන් ස්ථානය : ————.
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා උපන් ස්ථානය :————.

**සංලක්ෂ්‍යය.**—අයදුම්කරු ලංකාවෙහි උපන්නේ නම් (අ) සමඟ (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුය. අයදුම්කරු උපන්නේ ලංකාවෙහි නොවේ නම් (අ) සමඟ (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුය.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.

6. පාඨශාලාවෙන් අස්වූවාට පසු කල රැකී රක්ෂා පිළිබඳ දිනයන් සහිත විස්තර :————.

7. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ පළපුරුද්ද සහ අයදුම්කරු සේවය කර ඇති ගරාජයන්හි/සමාගම් හි නම් සහ ලිපින යන් :————.

8. එක් එක් ගරාජයෙහි/සමාගමෙහි සේවය කරන ලද කාලය : ————.

9. සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.
(1) ————.
(2) ————.
(3) ————.

10. වෙනත් විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර : ————.

11. පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා ඇත.
(අ) උප්පැන්න සහතිකය.
(ආ) අධ්‍යාපන සහතික.
(ඇ) මෑත දී ලබාගත් සහතික පත් තුනක්.
(ඈ) ගරාජ පළපුරුද්ද ආදිය පිළිබඳ සහතික.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–558—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ IV වැනි ශ්‍රේණියේ පරිපාලන ඕවර්සියර් තනතුරු

ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ හතරවැනි ශ්‍රේණියේ පරිපාලන ඕවර්සියර් තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව ඉල්ලුම් පත් 1965.1.11 වැනි දිනට හෝ එදිනට කලින් මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වන්නේ වසර කට රු. 1,044 න් පටන් ගෙන රුපියල් 42 බැගින් වාර්ෂික පඩි වැඩිවීම් 8 කින් රු. 1,380 දක්වා වැඩිවෙන එකකි.

3. **සේවයට බඳවා ගැනීමේ හා සේවා කොන්දේසි.**—සේවයට බඳවා ගනු ලබන්නේ 4 වෙනි ශ්‍රේණියේ තාවකාලික පරිපාලන ඕවර්සියර් තනතුරුවලටය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. තෝරාගනු ලබන අපේක්ෂකයා " නව ප්‍රවේශක නිලධාරියෙක් " වන්නේ නම් ඔහු වසර තුනක ආධුනික කාලයක් මත තබණු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බව ඔප්පු කළ යුතුය :—

(අ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ
(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, හෝ
(iii) ඊට සම හෝ උසස් විභාගයකින් සමත්වී, ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන පහත සඳහන් පාඨමාලාවන්ගෙන් එකක් සමත්වී සිටීම.
(ඒ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව (වසර දෙක),

(බී) මිණින්දෝරුවන්ගේ හා මට්ටම්කරුවන්ගේ පාඨමාලාව (වසර එකයි),

(සී) නාගරික ඉංජිනේරු ශිල්පය, නිර්මාණ ඉංජිනේරු ශිල්පය හෝ ගොඩනැගිලි තැනීම පිළිබඳ අර්ධ කාලීන පාඨමාලාව, හෝ

(ඩී) ඉහත සඳහන් (ඒ), (බී), (සී) ඡේදයන් අඩංගු පාඨමාලාවට සමාන හෝ ඊට වඩා උසස් යැයි ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්‍ෂ තැන විසින් සලකනු ලබන කාර්මික විද්‍යාව පිළිබඳ පිළිගත් ආයතනයක හෝ විද්‍යාලයක් මගින් පවත්වන ලද පාඨමාලාවකින් සමත් විය යුතුයි.

(ආ) 1965.1.11 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 25ට නොවැඩි විය යුතුය.

(ඇ) මනා චරිතයක් සහ කායික ශක්තියක් තිබිය යුතුය.

5. අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ : යු : බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ) ;

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන සහතික පත්‍ර ;

(ඉ) ලබාගත් වෘත්තීය සහ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඊ) චරිත සහතික දෙකක් (රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට මේ උප ඡේදය යටතේ සහතික පත්‍ර එවීමට නියම කරනු නොලැබේ) ;

(උ) සිංහල හා/හෝ දෙමළ පිළිබඳව ලබාගත් උසස්ම සහතිකය.

6. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රය එවිය යුතුයි. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත් නියමිත දිනයට පසුව මෙම කාර්යාලයට ලැබුණහොත්, එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත් ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් එම ඉල්ලුම් පත් භාරගන්නා ලෙස නිර්දේශ කළහොත් මිස ඒවා සලකා බලනු නොලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වන ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

8. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රත්මලානේ ජල සම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂතැනට හැර දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

සී. රාසසියා,
ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්‍ෂ.

ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව,
රත්මලාන,
1964 දෙසැම්බර් මස 3 දින.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය
### IV වෙනි ශ්‍රේණියේ පරිපාලන ඕවර්සියර් තනතුර
### ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව

1. සම්පූර්ණ නම :————.
   (අ) වාසගම් නාමය :————.
   (ආ) අනිකුත් නාමයන් :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය සහ 1965.1.11 දිනට වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
   අවුරුදු :——, මාස :——.
4. පුරවැසි බව හා එය ලබාගත් අන්දම—
   (අ) පරම්පරාවෙන් ද නැතහොත් :————.
   (ආ) ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.
5. උපන් ස්ථානය—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පස මුත්තාගේ :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පස මී මුත්තාගේ :————.
6. විවාහකද අවිවාහකද යන බව හෝ වැන්දඹු යන බව :————.
7. සාමාන්‍ය අධ්‍යාපනය ලැබූ පාඨශාලාවල හා විද්‍යාලයන්හි නම් (ඇතුළත් වූ දිනයත් අස්වූ දිනයත් සඳහන් කළ යුතුය) : ————.
8. අධ්‍යාපනික සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) : ————.
9. වෘත්තීය සහ කාර්මික සුදුසුකම් ලබාගෙන ඇත්නම්, එය මොනවාද සහ ඒවා ලබාගත් දින (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.
10. පාඨශාලාව හෝ විද්‍යාලය හැරයාමෙන් පසු නියුක්ත වී සිටි රැකියාවල් (ඒවාට බැඳුන දිනයත් සඳහන් කළ යුතුය) : ————.
11. විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පුහුණුවීම් හෝ පළපුරුදුවල විස්තර :————.
12. සිංහල පිළිබඳව ලබාගත් උපරිම සුදුසුකම් :————.
13. අයදුම්කරු පිළිබඳ තොරතුරු සොයා දැනගත හැකි තිදෙනෙකුගේ නම් හා ලිපිනයන්—
    1.————.
    2.————.
    3.————.
14. වෙනත් වැඩිපුර විස්තර ඇත්නම් :————.

මේ අයදුම් පතෙහි මා සඳහන් කර තිබෙන විස්තර නිවැරදි බවද, සත්‍ය බවද, මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව ඔප්පු වුවහොත්, එසේ ඔප්පු වූයේ මා තනතුරට තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් ඒ කරණකොටගෙන මා නුසුදුසු කෙනෙකු වන බවත් තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා පහකර දමනු ලැබීමට හේතුවන බව දන්නා බවත් මෙසින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12-471—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
### සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයේ අන්දමට තමන්ගේම අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් 1964.12.31 දිනට පෙර ලැබෙන සේ "ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්‍ෂ, තැ. පෙ. 563, කොළඹ 7" යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු අතර පුද්ගලිකව මා නමට හෝ මෙම කාර්යාලයේ අන් කිසි නිලධාරියකු නමට නොඑවිය යුතුය.

**2. වැටුප් ක්‍රමය, විශෙෂ දීමනා හා සේවය පිළිබඳ කොන්දේසි.**— රු. 3,180 න් පටන්ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් ද, රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් හා රු. 240 වාර්ෂික වැටුප් වැඩිවීම් 6කින් ද යුක්තව රුපියල් 6,780 දක්වා උසස් වන වාර්ෂික වැටුප් ක්‍රමයක් මේ තනතුරට අයත් වේ. රු. 4,080, රු. 4,800 හා රු. 5,580 වාර්ෂික වේතනයන්ට පළමු නියම කරන ලද කාර්යක්‍ෂමතා කඩඉම් විභාගයන්ගෙන් සමර්ථ විය යුතුය. තවද, පත් වීම් ලබන අයදුම්කරුවෝ ඉහත සඳහන් කාර්යක්‍ෂමතා කඩඉම් වලින් ඔබ්බට උසස් වීම් ලබනු සඳහා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන හෝ වෙනත් නියම කරනු ලබන විභාග ආදියෙන් සමර්ථ විය යුත්තෝ වෙති.

**3. සේවාවට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු තුනක ආධුනික සේවා කාලයකට යටත්වනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම ඔහු හෝ ඇය පහත සඳහන් සුදුසුකම් හිමි බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලාංකිකයකු බව ;

(ආ) 1964.12.31 දිනට අවුරුදු 22 ට නො අඩු හෝ අවුරුදු 35 ට නොවැඩි බව (යටත් පිරිසෙයින් පස් අවුරුද්දක අඛණ්ඩ කාලයක් ජනලේඛන හා/හෝ සංඛ්‍යාලේඛන කටයුතු වල නිරත වූ දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව අත්හැර දමනවා ඇත.)

(ඇ) සංඛ්‍යාති, ගණිතය, අර්ථ ශාස්ත්‍රය, ප්‍රජා විද්‍යාව, සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇති බව (ගෞරව උපාධිධාරීන් කෙරේ වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.)

(ඈ) ඉතා හොඳ චරිතයක් ඇති බව,

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් පරිදි තමාගේ සහතික පත්‍රවල පිටපත්, ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය :—

(1) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපත (බව්තීස්ම කිරීමේ සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා රීති අනුව නිකුත් කරන ලද උප්පැන්න සහතික වල පිටපත් භාරගනු නොලැබේ.)

(2) අයදුම්කරු ලබා ඇති උසස් ම අධ්‍යාපනික හෝ වෘත්තීය සහතික පත්‍රවල පිටපත්.

(3) මෙම තනතුර සඳහා අයදුම්කරු තමාගේ අධ්‍යාපනික සුදුසුකම්, චරිතය හැකියාව හා වෙනත් සුදුසුකම් මත ලැබූ චරිත සහතික පත් තුනක පිටපත් (මේ ඡේදය අනුව, දැනට රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් සහතික පත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

සංලක්ෂ්‍යය.—ඉහත සඳහන් මුල් සහතික පත්‍ර පුද්ගලිකව පවත්වන සම්මුඛ පරීක්ෂණයෙහිදී ඉදිරිපත් කරනු විනා තමන්ගේ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ජේදයේ මුල පළකර ඇති, රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි ද බලන්න.

7. 1964.8.7 දින අංක 14,135 දරණ ගැසට් නිවේදනයේ දැන්වීම අනුව අයදුම් පත් එවා සම්මුඛ පරීක්ෂණයට පැමිණි අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු නැත.

ධර්මසේන ජයනෙත්ති,
ජනලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ.

1964 දෙසැම්බර මස 4 වෙනිදා,
කොළඹ 7, තැ. පෙ. 563,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

## ආදර්ශ ආකෘති පත්‍රය

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය

(1) අයදුම් කරන තනතුර හා ඒ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයට සැසඳුම :————.

(2) සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.
(ඉතා පැහැදිලි ලෙස ලියන්න)

(3) උපන් දින, උපන් ස්ථානය :————.
හා 1964.12.31 දිනට වයස අවුරුදු :——; මාස :——; දින :————.

(4) විවාහක නම්, විවාහවූ දිනය හා ළමයින් ගණන :————.

(5) අධ්‍යාපනික සුදුසුකම් හා උපාධිය ලැබීම සඳහා ගත් විෂයයන් :————.
(සමර්ථවූ දිනය හා ප්‍රධාන විෂයය වෙන් වෙන්ව සඳහන් කරන්න)

(6) ඉගෙනීම ලැබූ විද්‍යාලයයන් හා එයින් අස්වූ දිනය :————.

(7) දැනට යෙදී සිටින රක්ෂාව හා දැනට ලබන වාර්ෂික වැටුප් :————.

(8) පාඨශාලා හැරයාමෙන් පසු යෙදී සිටි රක්ෂා හා ඉන් අස්වූ දින (රජයේ සේවයක යෙදී සිටියේ නම් ඒ පිළිබඳ සියලු තොරතුරු සඳහන් කළ යුතුයි.) :————.

(9) සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම හා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවය (සමර්ථවූ විභාග පිළිබඳ තොරතුරු සඳහන් කළ යුතුය.) :————.

(10) විශෙෂ සුදුසුකම් (වෘත්තීය, කාර්මික, ක්‍රීඩා, බාලදක්ෂ කටයුතු, සමාජ සේවා වැඩ, ශුභ සාධක වැඩ) :————.

(11) සංඛ්‍යාලේඛන පිළිබඳ පළපුරුදුකම්වල විස්තර :————.

(12) පිටපත් අමුණා ඇති චරිත සහතික ලබාගත් අයවලුන් තිදෙනකුගේ නම් හා ඔවුන්ගේ නිලතල :————.

(13) අයදුම්කරු පුද්ගලික වශයෙන් හඳුනන දෙදෙනෙකුගේ නම් හා ඔවුන්ගේ නිලතල (සහතික ලබාගත් අයගේ නම් හැර) ————.

————,
අයදුම් කරුගේ අත්සන.

දිනය :————.

12-661—64.12.11 දින අංක 14,255 දරණ ගැසට් පත්‍රය

---

## කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුව

### මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ උපදේශක තනතුරු

කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ උපදේශක තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 දෙසැම්බර් මස 29 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. **බඳවා ගැනීමේ සහ සේවා කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාල සීමාව කට යටත් වේ. රජයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරනා නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. **වැටුප් ක්‍රමය.**—රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් අනතුරුව රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩි වේ. රු. 4,080 ට සහ රු. 4,800ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත වේ.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 දෙසැම්බර් 29 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු, 40ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

(ii) විශිෂ්ට චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙකකට නො වැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂය යන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ,

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමර්ථ වී තිබීම, සහ

(iv) මෝටර් වාහන යාන්ත්‍රික වැඩ, මෝටර් කාර්මිකයින්ගේ වැඩ, මෝටර් වාහන විදුලි ශිල්පීන්ගේ වැඩ. යන මේවායින් එකක් පිළිබඳ ලන්ඩනයේ "සිටි ඇන්ඩ් ගිල්ඩ්" ආයතනයේ සහතිකය ,හෝ,

(v) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයීය සන්ධ්‍යා ඉංජිනේරු සහතිකය, හෝ

(vi) ලංකා කාර්මික විද්‍යාලයීය කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය, හෝ

(vii) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය, හෝ

(viii) සමාන සුදුසුකම්.

සටහන.—පත්කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, අවුරුදු 5කට අඩු පළපුරුද්දක් ඇති අයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබා ගන්නා තෙක් වසකට රු. 3,420 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් උඩ පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍රවලට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තිය සහතිකය

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(සැලකිය යුතුයි.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවමනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ජේදයෙහි පටන් ගැන්මෙහි පළකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

සී. ජ. වල්පිට,
අධ්‍යක්ෂ.

කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීම
පිළිබඳ දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 දෙසැම්බර් 2 වෙනි දින.

## ආදර්ශ ආකෘති පත්‍රය

**කා.අ. හා පු.දෙ. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. නිත්‍ය ලිපිනය :————.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය) :————.

4. ජාතිය :————.

5. උපන් ස්ථානය :—(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

6. විවාහක හෝ අවිවාහක බව :————.

7. දැන්වීමෙහි පලකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිනිය යුතුය) :————.

8. ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :————.

9. පාසැල හැර යාමෙන් පසු කල රක්ෂාවල්, ඒවායේ විස්තර : ————.

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද : එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම : (ඒවායේ පිටපත් ඇමිනිය යුතුයි) :————.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍යකරුනු බව මෙයින් සහතිකකර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත් වීමෙන් පසුව ඉහතකී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පුවුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-421—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුව

**වාණිජ උපදේශක තනතුරු**

කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ වානිජ උපදේශක තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 දෙසැම්බර් මස 29 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

2. **බඳවා ගැනීමේ සහ සේවා කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාථදරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාල සීමාව කට යටත් වේ. රජයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. **වැටුප් ක්‍රමය.**—රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් අනතුරුව රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩි වේ. රු. 4,080 ට සහ රු. 4,800ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත වේ.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 දෙසැම්බර් 29 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු, 40ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

(ii) විශිෂ්ට චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙකකට නො වැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂය යන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ,

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමර්ථ වී තිබීම, සහ

(iv) පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ විද්‍යාව හෝ අර්ථ ශාස්ත්‍රය පිළිබඳ උපාධිය, හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයීය, වාණිජ්‍යය පිළිබඳ හෝ ගණක ශාස්ත්‍රය පිළිබඳ හෝ ඩිප්ලෝමා සහතිකය, හෝ

(සටහන.—මෙම සුදුසුකම් ලත් අයට 5 අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්ද තිබිය යුතුයි. අවුරුදු 5කට අඩු යථෝක්ත පලපුරුද්ද නොමැති අයෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු 5 අවුරුදු පළපුරුද්ද ලබා ගන්නා තෙක් මසකට රු. 3,420 නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කරනු ඇත.)

(vi) බ්‍රිතාන්‍ය වාණිජ ගුරු සහතිකය හෝ සමාන සුදුසුකම් සමග අවුරුදු 15ක ඉගැන්වීම පිළිබඳ ප්‍රායෝගික පලපුරුද්ද, හෝ

(vii) සමාන සුදුසුකම්.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරි පත් කර නිර්දේශ කළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍රවලට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තිය සහතිකය

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(**සැලකිය යුතුයි.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුව මනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි පලකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ.

සී. ජ. වල්පිට,
අධ්‍යක්ෂ.

කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීම
පිළිබඳ දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 දෙසැම්බර් 2 වෙනි දින.

## (ආදර්ශ ආකෘති පත්‍රය)

**කා.අ.හා.පු. දෙ වානිජ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. නිත්‍ය ලිපිනය :————.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය) :————.

4. ජාතිය :————.

5. උපන් ස්ථානය :—(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

6. විවාහක හෝ අවිවාහක බව :————.

7. දැන්වීමෙහි පලකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිනිය යුතුයි) :————.

8. ඉගැනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :———.

9. පාසැල හැර යාමෙන් පසු කල රක්ෂාවල්, ඒවායේ විස්තර: ———.

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද: එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :———.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම: (ඒවායේ පිටපත් ඇමිනිය යුතුයි) :———.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :———.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍යකරනු බව මෙයින් සහතිකකර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහතකී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පුවුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12–422—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුව

### විදුලි කම්බි සවිකිරීම පිළිබඳ උපදේශක තනතුර

කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ විදුලි කම්බි සවි කිරීම පිළිබඳ උපදේශක තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම් කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 දෙසැම්බර් මස 29 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතු ය.

2. **බඳවා ගැනීමේ සහ සේවා කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. රජයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. **වැටුප් ක්‍රමය.**—රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් අනතුරුව රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් රුපියල් 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩි වේ. රු. 4,080 ට සහ රු. 4,800 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත වේ.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(1) 1964 දෙසැම්බර් 29 වැනි දිමට වයස අවුරුදු 25 ට නො අඩු, 40ට නො වැඩි විය යුතු ය. (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙකකට නො වැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ,

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී තිබීම, සහ

(iv) විදුලි ස්ථාපනය (ඉන්ස්ටොලේෂන්) වැඩ පිළිබඳ ලන්ඩනයේ "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" ආයතනයේ සහතිකය, හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලීය විදුලි ඉංජිනේරු සන්ධ්‍යා සහතිකය, හෝ

(vi) ලංකා කාර්මික විද්‍යාලයීය කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය, හෝ

(vii) සමාන හෝ උසස් සුදුසුකම්.

සටහන.—පත්කර ගනු ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබා ගන්නා තෙක් වසකට රු. 3.420 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් උඩ පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයෙහි නියුතු සුදුසු කම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණී යථෝක්ත ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්‍ර වලට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තිය සහතිකය

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(සැලකිය යුතුයි.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය).

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි පලකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමුකර වනු ලැබේ.

සී. ජ. වල්පිට,
අධ්‍යක්ෂ.

කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ පිළිබඳ
දෙපාර්තමේන්තුව, කොළඹ 10,
1964 දෙසැම්බර් 2 වෙනි දින.

### ආදර්ශ ආකෘති පත්‍රය

**කා. අ. හා පු. දෙ විදුලි කම්බි සවිකිරීම පිළිබඳ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.
2. නිත්‍ය ලිපිනය :———.
3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :——— ———.
4. ජාතිය :———.
5. උපන් ස්ථානය: (අ) අයදුම්කරු :———.
(ආ) අයදුම්කරුගේ පියා :———.
(ඇ) අයදුම්කරුගේ සීයා :———.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා : ———.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම් කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුය.

6. විවාහක හෝ අවිවාහක බව :———.
7. දැන්වීමෙහි පලකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිට පත් ඇමිනිය යුතුයි) :———.
8. ඉගැනුම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :———.
9. පාසැල හැර යාමෙන් පසු කල රක්ෂාවල්, ඒවායේ විස්තර: ———.
10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද: එසේනම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :———.
11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරාතිරම: (ඒ වායේ පිටපත් ඇමිනිය යුතුයි)
12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :———.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීමෙන් පසුව ඉහතකී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12–423—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව

### සැපයීම් ලිපිකරු තනතුරු සඳහා ඇබෑර්තු

අනියම් සැපයීම් ලිපිකරු තනතුරු සඳහා 1964 දෙසැම්බර් මස 22 වැනි දින තෙක් ලාංකිකයින්ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

සුදුසුකම් : අයදුම්කරුවන් විසින්, සිංහල විෂයයක් සහිතව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ, ඉංග්‍රීසි විෂයයක් සහිතව සිංහල මාධ්‍යයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සුදුසුකම් එකවර ලබා තිබිය යුතුය.

පළපුරුදුකම් : සැපයීම් වැඩ හා/ හෝ වාප්පු වැඩ පිළිබඳ, අඩු වශයෙන් වර්ෂ 2ක පළපුරුද්දක් ද, ඉංජිනේරු උපකරණ හා ද්‍රව්‍යය හා ඒවායේ වෙළඳපොළ පිළිබඳ මනා දැනුමක් ද, රේගු පිළිවෙත හා වරායෙන් බඩු ඉවත් කිරීම පිළිබඳ දැනුමක් ද අයදුම්කරුන් හට තිබිය යුතුය.

වයස : අවුරුදු 25 සිට 45 දක්වා.

වැටුප් ක්‍රමය : රු. 210—10 × 14—රු. 350 දක්වා (මසකට සියල්ල අඩංගු)

ඉහත සඳහන් පරිදි පළපුරුදුකම් ඇති ආධුනිකයින්, ඉහතින් දැක්වෙන වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තැබීම ගැන සලකා බලනු ඇත.

අයදුම් පත්, මෙම කාර්යාලයට පැමිණ හෝ තම ලිපිනය ලියූ ශත 10ක මුද්දරයක් සහිත කවරයක් එවීමෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රවල එවිය යුතුයි.

ලේකම්,
ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව.

තැ. පෙ. 194,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2.

12–434—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ටයර් සංස්ථාව

### ආරක්ෂක නිලධාරි තනතුර

ලංකා ටයර් සංස්ථාවේ ආරක්ෂක නිලධාරි තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් :—1. 1964. 11. 30 වෙනි දිනට වයස අවුරුදු 45 කට වැඩි නොවිය යුතුයි.

2. ලංකා පොලිස් හමුදාවේ නම්, යටත් පිරිසෙයින් උප පොලිස් පරීක්ෂකයකු ලෙස හෝ, යුද්ධ සේනාංකයකු නම්, යටත් පිරිසෙයින් 2/ලයිතන් කෙනෙකු ලෙස හෝ සේවය කර තිබීම, හා ආරක්ෂක වැඩ සංවිධානය කිරීම සම්බන්ධයෙන්, අවුරුදු 5 ක පළපුරුද්දක් තිබීම.

හෝ

පිළිගත් වාණිජ හෝ කර්මාන්ත ආයතනයක ආරක්ෂක නිලධාරියකු වශයෙන් අවුරුදු 5 කට නොඅඩු කාලයක් සේවය කර තිබීම.

වැටුප් :—තෝරාගත් අපේක්ෂකයා, සුදුසුකම් හා පළපුරුද්ද අනුව පහත දැක්වෙන සියලු දීමනා අඩංගු මාසික වැටුප් පරිමාණයේ සුදුසු ස්ථානයක පිහිටුවනු ලැබේ. රු. 500—20 × 15—රු. 800.

අයදුම්පත් :—අයදුම් පත් සහ වෙනත් විස්තර කොළඹ 3, ගාලු පාරේ අංක 292, දරණ ස්ථානයේ පිහිටි ලංකා ටයර් සංස්ථාවේ කාර්යාලයෙන් ලබා ගත හැක.

අයදුම්පත් තැපැල් මගින් ඉල්වා සිටින විට , ලිපිනය සඳහන් මුද්දර සහිත කවරයක් (ලොකු) එවිය යුතු යි.

අයදුම්පත්, කොළඹ 3, ගාලු පාරේ අංක 292, දරණ ස්ථානයේ පිහිටි ටයර් සංස්ථාවේ සභාපති වෙත, 1964. 12. 25 වෙනි සිකුරාදට පෙර ලැබෙන සේ එවිය යුතු යි.

රජයේ හෝ රජයේ සංස්ථාවල සේවකයින් තමන්ගේ අයදුම් පත්, ඔවුන් තෝරාගනු ලැබුවහොත් තම සේවයෙන් මුදවා හැරිය හැකි බව සඳහන් කොට, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

සභාපති.

1964 දෙසැම්බර් 4 දා

12–462—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### පළමු පංතියේ බෙලෙක්කරු තනතුර

කොළඹ වරාය කොමිෂන් සභාවේ වැඩ පරීක්ෂක අංශයේ ඉහත සඳහන් තනතුර උදෙසා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් වරාය කොමසාරිස් ‘ඉංජිනේරු අංශය’ යනුවෙන් ආමන්ත්‍රනය කොට 1964 දෙසැම්බර් මස 28 වෙනි දින අ. භා. 4.30ට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2. මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය දෛනික රු. 3.86—16—5.46. වසකට රු. 1,170—42—රු. 1,674 යි. රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනාද ගෙවනු ලැබේ. මෙම තනතුර ස්ථිරය, නමුත් විශ්‍රාම වැටුප් රහිතය.

3. තෝරාගනු ලබන අයදුම්කරු සයමසක සතුටුදායක සේවා කාලය කින් පසු මාසික වැටුප් ලබන සේවයට මාරුකරනු ලැබේ. එවිට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකත්වය හිමිවේ.

4. සෑම අයදුම්කරුවෙකුටම පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුය :—

(i) අවුරුදු 10 ට නොඅඩු කාලයක් කාර්මිකයෙකු වශයෙන් සේවය කර මින්, අවුරුදු 6 ක් පළමු පංතියේ කාර්මිකයෙකු වශයෙන් විය යුතුයි. මේ පිළිබඳ සහතික ඉදිරිපත් කල යුතුයි.

(ii) අවුරුදු 5 ට නොඅඩු කාලයක් දෙවන පංතියේ බෙලෙක්කරුවෙකු වශයෙන් සේවය කර තිබිය යුතුයි.

(iii) දෙනු ලබන වැඩ සඳහා අවශ්‍ය බඩු බාහිරාදිය ඇස්තමේන්තු කිරීමට දැනුමක් තිබිය යුතු අතර, ලිවීමට සහ කියවීමට හැකියාවක් තිබිය යුතුයි.

(iv) ලෝහ පයිප්ප සලකුණු කිරීම, කැපීම, අවශ්‍ය හැඩයට සකස් කිරීම සහ විවිධ කෝනාකාර සම්බන්ධ කිරීම් ගැන දැනුමක් තිබිය යුතුයි.

(v) “ රේඩියේටර්ස් ” අළුත්වැඩියා කිරීම ගැන මනා දැනුමක් තිබිය යුතුයි.

(vi) වයස අවුරුදු 25 ට වැඩිවිය යුතුයි.

5. වෘත්තීය පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

6. අවශ්‍ය වුවහොත් කෙටි දැන්වීමකින් පිට පළාත්වල වැඩට යෑමට, නියමිත වේලාවෙන් පසු වැඩ කිරීමට සහ වෙනත් මුරෙන් මුර වැඩ කිරීමට බැඳී සිටිය යුතුයි.

7. සෑම අයදුම්කරුවෙකුම පහත දැක්වෙන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ළඟදී ලබාගත් චරිත සහතිකයක්.

(ඇ) 4 වෙනි ඡේදයේ (i) සිට (v) දක්වා වෘත්තීය පළපුරුදුකම් පිළිබඳ සහතික.

8. ඉල්ලුම්කරුවන්ට ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීම් කිසිවක් නොගෙවන අතර, ඉල්ලුම්පත් ලැබුන බවද දන්වනු නොලැබේ.

9. ඉල්ලුම්පත්‍ර හෝ මෙම තනතුර සම්බන්ධ වෙනත් කරුණක් ගැන හෝ එවන සෑම ලිපියක්ම ඉදිරිපත් කළ යුත්තේ ‘ වරාය කොමසාරිස් තැන, ඉංජිනේරු අංශය ’ කියා මිස මෙම දෙපාර්තමේන්තුවේ වෙනයම් සෙසු නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොවන බව සැළකිය යුතුයි.

10. මෙම කරුණුවලට අදාළ නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. රජයේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) ඡේදයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාළ සෙසු කොන්දේසි ඉල්ලුම් කරුවන්ගේ සැළකිල්ලට යොමුවිය යුතුයි.

අ. න. සි. කුලසිංහ,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1964 දෙසැම්බර් මස 3 දින.

### ආකෘති පත්‍රය

**පළමු පංතියේ බෙලෙක්කරු තනතුර—වැඩ පරීක්ෂක අංශය**

(1) සම්පූර්ණ නම :————.

(2) පුද්ගලික ලිපිනය :————.

(3) වයස සහ උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපත ඇමිණිය යුතුයි) :————.

(4) පළපුරුදුකම පිළිබඳ විස්තර කෙටියෙන් (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.

(5) වෙනත් සුදුසුකම් :————.

12–493—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## මූලික කාර්මික අභ්‍යාස ආයතනය, රත්මලාන

### උපදේශක තනතුර

රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ උපදේශක තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙලකර ගත් ඉල්ලුම් පත්‍ර 1964 දෙසැම්බර් මස 26 වැනි දින දවල් 12ට හෝ ඊට පෙර හෝ ලැබෙන ලෙස මා වෙත එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය රු. 960—72—රු. 1,752 වන අතර කාර්යක්ෂමතාවය හා සේවා කාලය අනුව රු. 1,320—72—රු. 2,184 වාර්ෂික වැටුප් ක්‍රමය යටතේ, උපදේශක විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබීමට ද අවකාශ තිබේ.

තෝරාගනු ලැබූ අපේක්ෂකයාගේ කාර්යක්ෂමතාවය හා සේවයේ පළපුරුද්ද අනුව, භාණ්ඩාගාරයේ අනුමතියට යටත්ව, නියමිත වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක පිහිටුවනු ලැබේ.

3. **වයස් සීමාව.**—සෑම අපේක්ෂකයෙක්ම 1965 ජනවාරි මස 1 වැනි දිනට තම වයස අවුරුදු 25ට නොඅඩු බවටත් අවුරුදු 40ට නොවැඩි බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. මෙම වයස් සීමාවන් දෙපාර්තමේන්තු සේවකයන් වෙනුවෙන් බලපානු නොලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—

1. (අ) අටවැනි ප්‍රමාණයෙන් සමත්වීම,

(ආ) උපකරණ භාවිතය හා ඒවායේ නම් පිළිබඳ දැනීම,

(ඇ) කාර්මික ඇඳීම් පහදා ගැනීමට හැකියාව,

(ඈ) පිළිගන්නා ලද කර්මාන්තශාලාවක අවුරුදු 4කට නොඅඩු ආධුනික සේවා කාලයක් තිබීම,

(ඉ) පිළිගත් කර්මාන්තශාලාවක නිරීක්ෂණ කටයුතු සඳහා අවුරුදු 5ක පළපුරුද්දක් සහ ඉන් යටත් පිරිසෙයින් අවුරුදු 2ක් උපදෙස්දීමේ සේවයෙහි නිරතවීම,

(ඊ) සිංහලෙන් උපදෙස්දීමේ පළපුරුද්දක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ,

(උ) කර්මාන්තශාලා කටයුතු කිරීම පිළිබඳ මූලික සෛධාන්තික උපදෙස්දීම පිළිබඳ හැකියාවක් හා පළපුරුද්දක් ද, ඒ පිළිබඳ මනා දැනීමක් ද අවශ්‍යය.

හෝ

2. (අ) පිළිගත් කර්මාන්තශාලාවක පුහුණු කම්කරු ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු 10ක ප්‍රායෝගික සේවා පළපුරුද්දක් තිබීම,

(ආ) උපදෙස් දීම සිංහලෙන් කෙරෙන බැවින් මනා සිංහල දැනුමක් අවශ්‍යය,

(ඇ) යටත් පිරිසෙයින් අටවැනි ප්‍රමාණයෙන් සමර්ථ ව තිබිය යුතු අතර, එක් විෂයයක් ඉංග්‍රීසි නම් වඩාත් සුදුසුවේ,

(ඈ) කර්මාන්තශාලා කටයුතු කිරීම පිළිබඳ මූලික සෛධාන්තික උපදෙස්දීම පිළිබඳ හැකියාවක් හා පළපුරුද්දක් ද ඒ පිළිබඳ මනා දැනීමක් ද අවශ්‍ය ය.

5. හොඳ ශාරීරික සෞඛ්‍යයෙන් හා යහපත් චරියකින් සමන්විත විය යුතුය.

6. **පත්වීමේ කොන්දේසි.**—මේ පදවිය ස්ථිර හා විශ්‍රාම සහිතයි. පත් කරනු ලැබූ අපේක්ෂකයා වැන්දඹු සහ අනාථ දරු විශ්‍රාමාධාර අරමුදලට අවශ්‍ය පරිදි ගෙවිය යුතුය.

7. **සේවා කොන්දේසි.**—

(අ) පත්කරනු ලබන අපේක්ෂකයා වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) ආරම්භයේදී පත්කිරීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් විය යුතුය.

(ඇ) සේවා කොන්දේසි කර්මාන්තශාලා සේවා කොන්දේසිවලට සමානය.

(ඈ) ඉතා උසස් තත්ත්වයක කාර්යක්ෂමතාවයක් ඇති අවුරුදු 5ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වූවෙක් උපදේශක විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට සුදුසු අයෙක් වෙයි.

8. අපේක්ෂකයින් තමන්ගේ ඉල්ලුම් පත්‍රයට පහත දැක්වෙන සහතික ආදියේ පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය,

(ආ) උප්පැන්න සහතිකය (ආධාර ලබන පාසැල් සඳහා ඇති රෙගුලාසි මාලාව යටතේ නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ බවුතිස්ම සහතිකය මේ සඳහා භාරගනු නොලැබේ),

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මේ ධුරයට පත්කිරීමට ඇති සුදුසුකම් ආදිය පිළිබඳ මෑතදී ලබාගත් වැදගත් සහතික තුනක්.

**සැලකිය යුතුයි.**—මේ සඳහා ඉදිරිපත් කරනු ලබන සහතික පිටපත් ඈදිය ආපසු එවනු නොලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පටන් ගැනීමේ පළකර ඇති රජයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි. මේ දැන්වීම යටතේ අවශ්‍ය කරුණු කිසිවක් නොතකා හැරිය ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

10. මේ ධුරය පිළිබඳව සියළුම ඉල්ලුම් පත්‍ර හා ඒ පිළිබඳ ලියකියවිලි රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ වැඩබලන ප්‍රධාන ඉංජිනේරුතැනට ලැබෙන සේ එවිය යුතු අතර, පුද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුට නො එවිය යුතුයි.

ඇල්. එච්. සුමනදාස,
වැඩ බලන ප්‍රධාන ඉංජිනේරු තැන.

මූලික කාර්මික අභ්‍යාස ආයතනය,
රත්මලාන.
දිනය : 1964. 12. 4.

### ආදර්ශ පෝරමය

**රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ උපදේශක තනතුර**

(1) (අ) සම්පූර්ණ නම :————.

(ආ) ලිපිනය :————.

(ඇ) වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

(2) ජාතිය :————.

(3) විවාහක ද, අවිවාහක ද යන වග :————.

(4) අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් හා ඒවා ලැබූ දිනයන් (පිටපත් ඇමිණිය යුතුයි)

(5) සවිකිරීම/ලියවීම පිළිබඳ පළපුරුද්ද (විස්තර සමග සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.

(6) සිංහල දැනීම :————.
සිංහලෙන් උපදෙස් දීමට හැකිද ?

(7) සෛධාන්තික උපදෙස් දිය හැකිද ? :————.

(8) පාඨශාලාවෙන් අස්වූවාට පසු කළ රැකී රක්ෂාවල් :————.

(9) පළපුරුද්ද හා ලත් පුහුණුව පිළිබඳ විශේෂ සුදුසුකම් :————.

(10) චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා තත්ත්වය :————.

(ඥාතීන්ගෙන් නො විය යුතුයි)

(11) වෙනත් විස්තර :————.

(12) ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම් කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවොත් මා විසින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා පත්කිරීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-487—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

### හතරවන පංතියේ කුළුගසන්නන්ගේ තනතුරු (අනියම්)—ධීවර වරාය සහ වෙරළ ආරක්ෂක වැඩ

කොළඹ වරාය කොමිෂන් සභාවට අයත් ධීවර වරාය සහ වෙරළ ආරක්ෂක වැඩ අංශවල ඇතිවී තිබෙන ඉහත සඳහන් තනතුරු උදෙසා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් වරාය කොමසාරිස් "ඉංජිනේරු අංශය" යනුවෙන් ආමන්ත්‍රනය කොට 1964 දෙසැම්බර් මස 24 දින පස්වරු 4.30 ට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2. වැටුප් ක්‍රමය.—තෝරාගනු ලබන අයදුම්කරුවන්ට ගෙවනු ලබන්නේ රු. 1.60 ක ස්ථිර දෛනික වේතනයකි. රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා සහ විශේෂ ජීවනාධාර දීමනාද ගෙවනු ලැබේ. අනියම් සේවකයින්ට දින 250 ක සේවයෙන් පසු නිවාඩු සහ දුම්රිය බ. පත්‍ර පහසුකම් ද හිමිවනු ලැබේ.

3. මෙම තනතුරු අනියම් නිසා පත් කරගන්නා ලද අයදුම්කරුවන් නියමිත වැඩ කොටස අවසාන වූ පසු සේවයෙන් අස් කරනු ලැබේ.

4. සෑම අයදුම්කරුවෙකුටම පහත දක්වෙන සුදුසුකම් තිබිය යුතුයි :—

(i) අවුරුදු 2 කට නොඅඩු කාලයක් පිළිගත් ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක සේවය කර පළපුරුද්දක් තිබිය යුතුයි. මෙය ගැන සහතික ඉදිරිපත් කළ යුතුයි;

(ii) හොඳ කාය ශක්තියක් තිබිය යුතුයි ;

(iii) ගල් කැඩීම සඳහා කුළු ගෙඩිය පාවිච්චි කිරීමට මනා දැනුමක් තිබිය යුතුයි ;

(iv) කළුගල් කුට්ටි සහ කොන්ක්‍රීට් කැඩීමට මනා දැනුමක් තිබිය යුතුයි ;

(v) වයස අවුරුදු 18 ට වැඩිවිය යුතුයි.

5. වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

6. අවශ්‍ය වුවහොත් කෙටි දැන්වීමකින් දිවයිනේ කුමන පළාතක වුවත් සේවය කිරීමට, වේලාවෙන් පිටස්තර වැඩ කිරීමට සහ වෙනත් මුරෙන් මුර වැඩ කිරීමට බැඳී සිටිය යුතුයි.

7. සෑම අයදුම්කරුවෙකුම පහත දැක්වෙන සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි :—

(1) උප්පැන්න සහතිකය ;

(2) ලඟදී ලබාගත් චරිත සහතිකයක් ;

(3) 4 වෙනි ඡේදයේ (i) සිට (iv) දක්වා ඇති පළපුරුදුකම් පිළිබඳ සහතික.

8. ඉල්ලුම්කරුවන්ට ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීම් කිසිවක් නොගෙවන අතර, ඉල්ලුම් පත් ලැබුන බවද දන්වනු නොලැබේ.

9. ඉල්ලුම් පත්‍ර හෝ මෙම තනතුරු සම්බන්ධ වෙනත් කරුණක් ගැන හෝ එවන සෑම ලියමනක්ම ඉදිරිපත් කළ යුත්තේ "වරාය කොමසාරිස් තැන, ඉංජිනේරු අංශය" කියා මිස, මෙම දෙපාර්තමේන්තුවේ වෙනයම් සෙසු නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොවන බව සැලකිය යුතුයි.

10. මෙම කරුණුවලට අදාල නොවන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. රජයේ ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ප්‍රසිඩ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි ඉල්ලුම්කරුවන්ගේ සැලකිල්ලට යොමුවිය යුතුයි.

ලැ. ජේ. වීරරත්න,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1964 දෙසැම්බර් මස 3 දින.

### ආකෘති පත්‍රය

#### හතරවැනි පංතියේ කුළුගසන්නන්ගේ තනතුරු (අනියම්) ධීවර වරාය සහ වෙරළ ආරක්ෂක වැඩ

(1) සම්පූර්ණ නම :————.

(2) පුද්ගලික ලිපිනය :————.

(3) උපන් දිනය සහ වයස :————.
(උප්පැන්න සහතිකයේ පිටපත ඇමිණිය යුතුයි).

(4) ජාතිය :————.

(5) පළපුරුදුකම් පිළිබඳ විස්තර කෙටියෙන් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි).

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

12–492—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය

### හෑන්ඩ් ලාස්ටර්/වෙල්ටර් තනතුර

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ, හෑන්ඩ් ලාස්ටර්/වෙල්ටර් ඇබෑර්තු 7 ක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. 1964 දෙසැම්බර් 18 වෙනි දිනට හෝ ඊට කලින් සියලුම ඉල්ලුම් පත් පහත අත්සන් කරන අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතු අතර ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ උඩ වම් කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය.

**සුදුසුකම්.**—අතින් අච්චු ගැන්වීම සහ දුරපටි අතින් මැසීම පිළිබඳව අවුරුදු පහක පළපුරුද්දක් තිබිය යුතුය.

**වේතන ප්‍රමාණය.**—සංයුක්ත මණ්ඩලයීය වේතන පරිමානය මත දෛනික වැටුප් ලබන සේවකයින්ට ගෙවන, දිනකට සියළු දීමනා ඇතුළත්ව 5 වැනි ශ්‍රේණියේ—රු. 6.97 සිට 8.29 දක්වාය.

වෛද්‍ය පරීක්ෂණයකින් පසු තෝරාගනු ලබන අයැදුම්කරුවන් සය මසක කාලය ඇතුළත 4 වැනි ශ්‍රේණියේ එනම් සියළු දීමනා ඇතුළත්ව දිනකට රු. 5.65 ක මූලික වේතනයක් ගෙවනු ලැබේ.

ලේකම්.

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය,
147, පල්ලිය පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15,
1964 දෙසැම්බර් 7 වෙනිදා.

12–541—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12/1 (ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛන සේවයේ පහළ ශ්‍රේණියේ ලඝු ලේඛකයන් සඳහා 1961 ජූලි මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (සිංහල) විභාගය

1964 ජූලි 18 වැනි දින පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ ප්‍රවායන/පරීක්ෂණ කාලවලට යටත් ව පත්වීම් ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයන් හා ලඝු ලේඛිකාවන් ද ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| අයිරාංගනී, බු. පැ. (මෙනෙවිය) | සමුපකාර | ලඝු ලේඛනය |
| ජූලියස් සිංඤෝ, බ. | ගොවිජන සේවා | ලඝු ලෙඛනය හා සිංහල |
| ද සිල්වා, උ. ය. (මෙනෙවිය) | රජයේ වැඩ | සිංහල |
| සිල්වා, ද පී. | මිණුම් | සිංහල |

2. පහත සඳහන් නිලධාරීහු පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සම්පූර්ණ වශයෙන් දන් සමර්ථ වී ඇත්තාහ :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අයිරාංගනී, බු. පැ. (මෙනෙවිය) | සමුපකාර |
| ජූලියස් සිංඤෝ, බ. | ගොවිජන සේවා |
| ද සිල්වා, ඌ. ය. (මෙනෙවිය) | රජයේ වැඩ |

ල. අමරසිංහ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1964 දෙසැම්බර 7 වැනි දින,
කොළඹ. මහා භාණ්ඩාගාරයේ දී ය,

12–540/1—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12/1 (ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ ලඝු ලේඛකයන් සඳහා 1964 ජූලි මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ ඉංග්‍රීසි විභාගය

1964 ජූලි 10 හා 11 වැනි දිනවල පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී, ප්‍රවාසන/පරීක්ෂණ කාලවලට යටත් ව පත්වීම් ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයන්/ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| ආරියරත්න, ක. මු. | සෞඛ්‍ය | ලඝු ලේඛනය |
| එදිරිසිංහ, ජ. ල. | සෞඛ්‍ය | ලඝු ලේඛනය හා සිංහල |
| කැප්පිටිපොල, කිව්. | කොළඹ දිස්ත්‍රික් උසාවිය | ලඝු ලේඛනය |
| කුරේ, වා. ආ. ලි. (මහත්මිය) | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | ඉංග්‍රීසි |
| ගුණසේකර, දෙ. කු. | රජයේ විදුලි | ලඝු ලේඛනය |
| ජයසිංහ, ව. ය. ර. | පළාත් පාලන හා ස්වදේශ අමාත්‍යාංශය | ලඝු ලේඛනය |
| ද සිල්වා, ගෙව. සි. (මහත්මිය) | ආහාර | ලඝු ලේඛනය |
| ද සිල්වා, සු. කො. ල. | මෝටර් රථ ප්‍රවාහන | ලඝු ලේඛනය |
| පතිරත්න, සු. | පොලිස් | ලඝු ලේඛනය |
| පියසේන, මු. සි. ද සිල්වා | කොළඹ දිස්ත්‍රික් උසාවිය | ලඝු ලේඛනය |
| පීරිස්, මා. එ. | රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ | ලඝු ලේඛනය |
| පීරිස්, හ. වි. | ආනයන හා අපනයන පාලන | ලඝු ලේඛනය |
| පෙරේරා, ම. හ. වි. | අධ්‍යාපන | ලඝු ලේඛනය හා සිංහල |
| පෙරේරා, මා. ඩො. ජෝසා. | තැපැල් | ලඝු ලේඛනය |
| පෙරේරා, හ. ආ. හෙ. | ගොවිජන සේවා | ලඝු ලේඛනය හා ඉංග්‍රීසි |
| ප්‍රනාන්දු, කි. බ. | ඔඩිටර් ජනරාල්ගේ | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, ව. සෙ. | පරිවාස හා ළමාරක්ෂක | ලඝු ලේඛනය |
| රසීම්, අ. මො. | පොලිස් | ලඝු ලේඛනය |
| රාජකරුණා, ජී. | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | ඉංග්‍රීසි |
| විජේසූරිය, සො. (මහත්මිය) | ගුවන් විදුලි හා ප්‍රවෘත්ති | ඉංග්‍රීසි |
| විතාන, වි. දෙ. ජේ. | කෘෂිකර්ම | ලඝු ලේඛනය |
| සතියනාදන්, එ. ඩ. (මහත්මිය) | දේශීය ආදායම් | ලඝු ලේඛනය |
| සහබදීන්, මො. ම. | කෘෂිකර්ම | ලඝු ලේඛනය |
| සිරිවර්ධන, ගෞ. | අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවිය | ලඝු ලේඛනය |
| සිල්වා, කු. හැ. ජ. | පළාත් පාලන හා ස්වදේශ අමත්‍යාංශය | ලඝු ලේඛනය |
| සිල්වා, ලි. හ. ආ. | සෞඛ්‍ය | ලඝු ලේඛනය |
| සිල්වා, වෙ. වි. | රාජ්‍ය ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශය | ලඝු ලේඛනය |
| හෙට්ටි-ආරච්චි, පෝ. හෙ. ස්ටැ. | කොළඹ, ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය | ලඝු ලේඛනය, ඉංග්‍රීසි හා සිංහල |

2. පහත සඳහන් නිලධාරීහු පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සම්පූර්ණ වශයෙන් දන් සමර්ථ වී ඇත්තා හ :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ආරියරත්න, ක. මු. | සෞඛ්‍ය |
| එදිරිසිංහ, ජ. ල. | සෞඛ්‍ය |
| කැප්පිටිපොල, කිව්. | කොළඹ දිස්ත්‍රික් උසාවිය |
| ගුණසේකර, දෙ. කු. | රජයේ විදුලි |
| ජයසිංහ, ව. ය. ර. | පළාත් පාලන හා ස්වදේශ අමාත්‍යාංශය |
| පතිරත්න, සු. | පොලිස් |
| පියසේන, මු. සි. ද සිල්වා | කොළඹ දිස්ත්‍රික් උසාවිය |
| පීරිස්, මා. එ. | රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ |
| පෙරේරා, මා. ඩො. ජෝසා. | තැපැල් |
| පෙරේරා, හ. ආ. හෙ. | ගොවිජන සේවා |
| ප්‍රනාන්දු, කි. බ. | ඔඩිටර් ජනරාල්ගේ |
| විතාන, වි. දෙ. ජේ. | කෘෂිකර්ම |
| සතියනාදන්, එ. ඩ. (මහත්මිය) | දේශීය ආදායම් |
| සහබදීන්, මො. ම. | කෘෂිකර්ම |
| සිරිවර්ධන, ගෞ. | අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවිය |
| සිල්වා, වෙ. වි. | රාජ්‍ය ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශය |
| හෙට්ටි-ආරච්චි, ජෝ. හෙ. සටැ. | කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය |
| සිල්වා, ලි. හ. ආ. | සෞඛ්‍ය |

ල. අමරසිංහ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1964 දෙසැම්බර 7 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

12–540/2—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12/1 (ඒ).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ ලඝු ලේඛකයන් සඳහා 1964 අප්‍රේල් මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (දෙමළ) විභාගය

1964 අප්‍රේල් 18 වැනි දින පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී ප්‍රවාසන කාලයකට යටත් ව පත්වීම ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයා , ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් විෂයයෙන් සමර්ථ වී ඇති බව මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය |
|---|---|---|
| නඩරාජා, සි. ක. ... | ගුවන් විදුලි හා ප්‍රචාත්ති ... | ලඝු ලේඛනය |

ල. අමරසිංහ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1964 දෙසැම්බර 7 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

12—540/3—64.12.11දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12 (ඒ).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ ලඝු ලේඛකයන් සඳහා 1964 ජූලි මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (විශෙෂ) ඉංග්‍රීසි විභාගය

1964 ජූලි 10 හා 11 වැනි දිනවල පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී, ප්‍රවාසන කාලයකට යටත් ව පත්වීම ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයා ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ප්‍රනාන්දු, ජා. මා. ... | වරාය කොමිසන් සභා | ලඝු ලේඛනය හා ඉංග්‍රීසි |

ල. අමරසිංහ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1964 දෙසැම්බර 7 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

12—540/4—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1 (ඒ)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩ-ඉම් ඉංග්‍රීසි විභාගය 1964 ජූලි

1964 ජූලි 10 හා 11 වැනි දිනවල පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩ ඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛක/ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමත් වී ඇති බව මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| ගුණතිලක, චූ. නෙ. (මෙනෙවිය) ... | ... වාණිජ ... ... ... | ... ලඝු ලේඛනය, සිංහල හා ඉංග්‍රීසි |
| ගුණතිලක, ව. ලි. රෙ. හෙ. (මහත්මිය) | ... වාණිජ ... ... ... | ... ලඝු ලේඛනය, සිංහල හා ඉංග්‍රීසි |
| දිසානායක, කා. හෙ. බෙ. ... | ... මහනුවර රික්වෙස්ට් උසාවිය ... | ... සිංහල හා ඉංග්‍රීසි |
| රහුමන්, සි. ක. අ. (මෙනෙවිය) ... | ... සෞඛ්‍ය ... ... | ... සිංහල හා ඉංග්‍රීසි |
| රාජපක්ෂ, හේ. ප. ව. ... | ... මීගමුවේ මහෙස්ත්‍රාත් උසාවිය ... | ... ලඝු ලේඛනය |
| වීරසේකර, වී. මු. න. ... | ... තැපැල් ... ... | ... ලඝු ලේඛනය හා සිංහල |
| වැන්-හොෆ්, කො. (මෙනෙවිය) ... | ... අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම් සහ සැපයීම් අමාත්‍යාංශය | ලඝු ලේඛනය හා ඉංග්‍රීසි |

2. පහත සඳහන් අපේක්ෂකයා හා අපේක්ෂිකාවන් ද සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීම සඳහා දන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ගුණතිලක, චූ. නෙ. (මෙනෙවිය) ... | ... වාණිජ |
| ගුණතිලක, ව. ලි. රෙ. හෙ. (මහත්මිය) | ... වාණිජ |
| රහුමන්, සි. ක. අ. (මෙනෙවිය) ... | ... සෞඛ්‍ය |
| රාජපක්ෂ, හේ. ප. ව. ... | ... මීගමුවේ මහෙස්ත්‍රාත් උසාවිය |
| වැන්-හොෆ්, කො. (මෙනෙවිය) ... | ... අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම් සහ සැපයීම් අමාත්‍යාංශය |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩ-ඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද, එම පරීක්ෂණයට ඇතුළු වීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපැලෙන් යැවෙන ලිපියකින් වහා ම ඉල්ලා සිටිය යුතු ය.

ල. අමරසිංහ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්

1964 දෙසැම්බර 7 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය,

12—540/5—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩ ඉම් (විශේෂ) (ඉංග්‍රීසි) විභාගය—1964 ජූලි

1964 ජූලි 10 හා 11 වැනි දිනවල පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,910ක් වීමට ඉපර ඇති කාර්යක්ෂමතා කඩ-ඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ (විශේෂ) පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛකයන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමත් වී ඇති බව මෙයින් දැනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| අමරසේකර, දෙ. සැ. ආ. | කම්කරු ... | ලඝු ලේඛනය |
| ගුණරත්න, ක. දී. පී. ... | දේශීය ආදායම් ... | ලඝු ලේඛනය |
| ද සිල්වා, බ. රෙ. ම. ... | පොලිස් ... | ලඝු ලේඛනය |
| ද සිල්වා, ලි. හ. ජෝ. ... | ආහාර ... | ලඝු ලේඛනය හා සිංහල |
| දේවගිරි, වී. ... | අල්ලස් කොමසාරිස්ගේ | ලඝු ලේඛනය |
| නඩරාජා, නා. ... | පොලිස් ... | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, මෙ. සා. පී. ... | තැපැල් ... | ලඝු ලේඛනය |
| මාර්කස්, ස්ටී. පැ. ... | ආහාර ... | ලඝු ලේඛනය |
| වීරරත්න, ර. දෙ. සෝ. ... | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂකයන් ද සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීම සඳහා දැන් සුදුසුකම් ලබා ඇත:—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ද සිල්වා, බ. රෙ. ම. ... | පොලිස් |
| දේවගිරි, වී. ... | අල්ලස් කොමසාරිස්ගේ |
| නඩරාජා, නා. ... | පොලිස් |
| මාර්කස්, ස්ටී. පැ. ... | ආහාර |
| ගුණරත්න, ක. දී. පී. ... | දේශීය ආදායම් |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩ-ඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද, එම පරීක්ෂණයට ඇතුළු වීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් වහා ම ඉල්ලා සිටිය යුතු ය.

ල. අමරසිංහ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1964 දෙසැම්බර 7 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය,

12-540/6—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## 1962 සැප්තැම්බර් මස පවත්වන ලද මධ්‍ය ලිපිකාර විභාගය

1964 ජූලි මස 17 වෙනි දින අංක 14,108 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1964 ජූලි මස 3 වෙනි දින දරණ නිවේදනයට අමතර වශයෙනි. 1962 සැප්තැම්බර් මස පවත්වන ලද මධ්‍ය ලිපිකාර විභාගයේ ප්‍රතිඵල අනුව දුම්රිය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියට පත් කිරීම සඳහා පහත නම් සඳහන් අපේක්ෂකයින් ද තෝරාගෙන ඇති බව මෙයින් දන්වනු ලැබේ :—

| නම | ලිපිනය |
|---|---|
| 1. අබේරත්න බණ්ඩා, ඩබ්ලිව්. ඇම්. ... ... | ගෝනාදෙනිය, ගන්දෙස්ස. |
| 2. අමරසේකර, පී. සී. ... | අය අංශය 1, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 1. |
| 3. කාර්තිරේසු, ඇස්. ... | පුත්තලායි, දකුණු පුලෝලි, පේදුරුතුඩුව. |
| 4. ගුණසිරි, ඇන්. සී. ... | 128, කොලොන්නාව පාර, වැල්ලම්පිටිය. |
| 5. ජයතිස්ස, ඒ. ඇම්. ... | රබර් උපදේශක තැන භාරව, පැල්මඩුල්ල. |
| 6. ජයසූරිය, සී. සී. ... | කණ්ඩලම, මීරිගම. |
| 7. ප්‍රනාන්දු, එච්. ඊ. පී. ... | 754, කඩලාන, මොරටුව. |
| 8. ප්‍රනාන්දු, එල්. එච්. ඇන්. පී. ... ... | 431, දුම්රිය පොල ඉදිරිපිට, අඟුලාන මොරටුව. |
| 9. ප්‍රනාන්දු, ඩබ්. සී. ඊ. ... | 76, සේනානායක මාවත, නාවල රාජගිරිය |
| 10. ප්‍රේමදාස, ඇන්. පී. ... | "තිලක", මහපිටිය, පොතුහැර. |
| 11. මාරසිංහ, ඇම්. ඇම්. සී. ... | නාලවලාන, ගෝනාවිල. |
| 12. මැනුවෙල්, ඇම්. ... | "සැනසිල්ල", නාරන්ගොඩ පාලුව, රාගම. |
| 13. සිල්වා, එච්. ඇස්. ඩබ්. ද ... | 131, ඇහැලියගොඩ. |
| 14. සුමනදාස, ඒ. ඇම්. ... | 80, බෝවල, අංගම්පිටිය, මහනුවර. |
| 15. හෙන්ඩ්රිකස්, ජී. ඇම්. ... | 151/1, මාලිගාවත්ත පාර, මරදාන, කොළඹ 10. |

2. මෙම අපේක්ෂකයින්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනී. එහෙත් පුරප්පාඩු ඇතිවන හැටියට පත්වීම් දෙනු ලැබේ. සියළුම පත්වීම් අවුරුදු තුනක ආධුනික කාලයකට යටත් වේ. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට යටත් වන අතර, දුම්රිය ලිපිකාර සේවයේ කොන්දේසිවලට යටත් වෙනවා ඇත.

3. දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අපේක්ෂකයින්ට ලියා දන්වනු ලැබේ.

ඩී. සී. එල්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

මහා භාණ්ඩාගාරය, කොළඹ,
1964. 12. 2.

12-489—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## බිම් මැනීම හා තලමිතිය පිළිබඳ විශේෂ ප්‍රායෝගික පරීක්ෂණය

බිම් මැනීම හා තලමිතිය පිළිබඳව සර්වේ ජනරාල්ගේ බලපත්‍රය නිකුත් කිරීම සඳහා විශේෂ ප්‍රායෝගික පරීක්ෂණයක්, අපේක්ෂකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටියහොත්, 1965 පෙබරවාරි මස 22 වෙනි දින සිට පවත්වනු ලැබේ. සර්වේ ජනරාල්ගේ බලපත්‍රය සඳහා වූ පරීක්ෂණයේ ලිඛිත කොටසින් කලින් සමත්වී සිටින්නෝ පමණක් මෙම විභාගයට ඉල්ලුම් කිරීම සඳහා සුදුස්සෝ වෙත්.

2. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොළඹ දිස්ත්‍රික්කය ඇතුළතය.

3. ඉහත කී පරීක්ෂණයට ඇතුලත්වීම සඳහා ව්‍යවස්ථානුකූලව නියමිත ආකෘති පත්‍රවල අයදුම්පත් පිළියෙල කළයුතු වේ. මෙම ආකෘති පත්‍රය. කොළඹ 5, කිරුළ පාරේ සර්වේ ජනරාල් කාර්යාලයෙන් ලබාගත හැකිය.

4. අයදුම් පත්‍ර බාරගැනීම අවසාන වන දිනට, එනම්, 1965 ජනවාරි මස 8 වැනි දිනට, ප්‍රථමයෙන්, අයදුම්කරුවෝ පහත සඳහන් පරිදි විභාග ගාස්තු සර්වේ ජනරාල්ට ගෙවිය යුතුය :—

| | |
|---|---|
| බිම් මැනීම පමණක් පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා | රු. 30.00 |
| තලමිතිය පමණක් පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා | රු. 30.00 |
| බිම්මැනීම හා තලමිතිය පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා | රු. 50.00 |

5. ලිඛිත පරීක්ෂණයේ බිම් මැනීම හා තලමිතිය පිළිබඳ නිර්දේශ පත්‍රය අනුව පිළියෙල කරනු ලබන, පරීක්ෂණය පැවැත්වෙන වේලාව සහ ස්ථානය සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට යථා පරිදි දැනුම් දෙනු ලැබේ.

6. පරීක්ෂක තැන විසින් නියම කරනු ලබන වේලාවන් අතරතුර අයදුම්කරුවෝ ක්ෂේත්‍රයේ වැඩ කළයුතු අතර යහපත් තත්ත්වයක ඇති උපකරණ ඉදිරිපත් කළයුතුය. උපකරණවල ඇති දෝෂ සඳොස් වැඩ සම්බන්ධයෙන් සමාවට කාරණයක් සේ නොපිළි ගැනේ.

පරීක්‍ෂණ වේලාවලදී කිසිවෙක් හා කථා බස් කරන අයදුම්කරුවන් විභාගයට නුසුදුස්සන් සේ සලකනු ලැබේ.

7. සියළුම අයදුම්කරුවෝ, පෝල් පිටි, කූඤ්ඤ, ඇඳීමේ උපකරණ, ලිපි ද්‍රව්‍ය, යනාදී ස්වකීය උපකරණ සහ කම්කරුවන් සපයා ගත යුතු අතර, පරීක්‍ෂණයේදී ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපයාදීම සම්බන්ධයෙන් කුමන විධියේ හෝ ආධාරයක් නොදෙනු ඇත.

8. 1965 ජනවාරි මස 8 වෙනි දිනට පසුව කිසිම අයදුම්පතක් භාරගනු නොලැබේ.

9. පරීක්‍ෂණය සඳහා පෙනී සිටින සෑම අයදුම් කරුවෙක්ම, පරීක්‍ෂණයේදී විභාග පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. පහත සඳහන් ලිපි ලේඛන වලින් කුමක් වුවත් ඉදිරිපත් කිරීමෙන් එවැනි සාධක සැපයිය හැකිවේ :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක්.

(ආ) මෙම පරීක්‍ෂණය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු පාස් පෝට් පත්‍රයක්.

(ඇ) මෙම පරීක්‍ෂණය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරීත්වය යටතේ නිකුත් කරන ලද, අයිතිකරුගේ ඡායාරූපයක්ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්.

**සංලක්‍ෂ්‍යය** :—පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන අනන්‍යතා පත්‍ර සඳහා අයදුම්පත් පෝරම දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් ලබාගත හැකිය.

10. අවශ්‍ය පරිදි අනන්‍යතාව ඔප්පු කරන සාධක ඉදිරිපත් නොකළ හොත් කිසිම අයදුම්කරුවෙකුට එම පරීක්‍ෂණයට පෙනී සිටීමට හෝ පෙනී සිටීමට හිමිකම් ලැබීමටද අවසරයක් නොමැත.

11. සියළුම ලියකියවිලි පෞද්ගලිකව මා නමට නොව "සර්වේ ජනරාල්" නමට එවිය යුතුය.

ජේ. සී. චන්මුගම්,
වැඩ බලන සර්වේ ජනරාල්.

1964 දෙසැම්බර් මස 5 වැනි දින,
කොළඹ 5,
තැ. පෙ. 506,
කිරුළ පාරේ,
සර්වේ ජනරාල් කාර්යාලයේදී ය.

12-432—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

අංකය : 1/23/2/12 (ජී).

## සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවැනි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය

1961 ජනවාරි 25 වැනි දින පවත්වන ලද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අපේක්‍ෂකයින්, සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ 2 වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| අඟුනවල, බී. එම්. පී. | ... | සමූපකාර. |
| අන්තෝනිපිල්ලේ, කිව්. | ... | ආගමන හා විගමන. |
| අබයරත්න, ජී. ඩබ්ලිව්. ජී. | ... | කච්චේරිය, අම්පාරේ. |
| අබූබසිතා, එම්. | ... | වාරිමාර්ග. |
| අබේකෝන්, එස්. බී. | ... | කෘෂිකර්ම. |
| අබේගුණවර්ධන, ඩබ්ලිව්. ඩී. ඩබ්ලිව්. | | කච්චේරිය, ගාල්ල. |
| අබේගුනවර්ධන, සී. එස්. | ... | ආනයන හා අපනයන පාලන. |
| අබේදේව, එච්. ඩබ්ලිව්. සී. | ... | කච්චේරිය, හම්බන්තොට. |
| අබේවික්‍රම, එස්. සී. | ... | ලංකා තානාපති කාර්යාලය, චීනය. |
| අබේසිංහ, කේ. ඒ. | ... | රෙජිස්ට්රාර් ජනරාල්. |
| අබේසේකර, ආර්. බී. | ... | සෞඛ්‍ය. |
| අබේසේකර, වී. | ... | වොෂිංටනයේ ලංකා තානාපති කාර්යාලය. |
| ...හයකෝන්, එස්. ඩබ්ලිව්. | ... | දිස්ත්‍රික් උසාවිය, මීගමුව. |
| ...මරකෝන්, එස්. බී. | ... | රජයේ වැඩ. |
| ...මරයිරි. කේ. එච්. එස්. | ... | ඉඩම් නිරවුල් කිරීම. |
| ...මරසිංහ, ඩී. ඒ. | ... | කච්චේරිය, මාතර. |
| ...මරසිංහ, ඊ. වී. | ... | සිවිල් ගුවන් සේවා. |
| ...මරසේකර, ඒ. වී. | ... | අධ්‍යාපන අමාත්‍යාංශය. |
| ...මරසේකර, එච්. කේ. ඩබ්ලිව්. | ... | අධ්‍යාපන. |
| ...මරසේකර, එස්. | ... | සමූපකාර. |
| ...මරසේන, එම්. ඩබ්ලිව්. | ... | වාණිජ. |
| ...ල්විස්, පී. එල්. ජේ. | .. | අධ්‍යාපන. |
| ...සුරමුනි, කේ. | ... | කච්චේරිය, කළුතර. |
| ...හමත්, ටී. ඉසැඩ්. පී. | ... | සෞඛ්‍ය. |
| ...එදෙණිය. ඩබ්ලිව්. ජී. එල්. | ... | කච්චේරිය, මහනුවර. |
| ...නන්ද විජය, පී. ඩබ්ලිව්. | ... | සමූපකාර. |
| ...රියතිලක, ඒ. එන්. ජී. | ... | ගණන් පරීක්‍ෂක. |
| ...රියපාල, කේ. ටී. | ... | කච්චේරිය, කොළඹ. |
| ...න්සඳුර, ජේ. | ... | යුද්ධ හමුදා. |
| ...ලෝසියස්, ඒ. එම්. එස්. | ... | වන සංරක්‍ෂන. |
| ...ගලපොල, ඩී. බී. එස්. | ... | කච්චේරිය, කෑගල්ල. |
| ...න්ද්‍රසේන, කේ. ජී. | ... | වාරිමාර්ග. |
| ...හම්පරම්, කේ. | .. | ඇටෝර්නි ජනරාල්. |
| ...එප්පිටිය, අයි. එම්. පී. | ... | අල්ලස් කොමිසම. |
| ...බට්. ඊ. | ... | අධ්‍යාපන. |
| ...බ්‍රහිම්, එම්. යූ. එම්. | ... | ආහාර. |
| ...රින් බණ්ඩා, ඩබ්ලිව්. එම්. | ... | වාරිමාර්ග. |
| ...පසේන, ජේ. එම්. | ... | කම්කරු. |
| ...හයරත්න, එල්. ඩී. ද එස්. | ... | අධ්‍යාපන. |
| උභයරත්න, කේ. | ... | අධ්‍යාපන. |
| එඩ්මන්ඩ්, ඩී. ජී. | ... | කෘෂිකර්ම. |
| එඩ්මන්ඩ්, එම්. කේ. | ... | විභාග. |
| එඩ්වින්, ඩී. පී. | ... | පොලිස්. |
| එල්ගිරියෙවිතාන, එච්. | ... | ගණන් පරීක්‍ෂක. |
| ඒකනායක, එස්. බී. | ... | විදුලිබල. |
| ඒකනායක, එස්. බී. | ... | සෞඛ්‍ය. |
| ඕරුතිරන්, එම්. | ... | රා. සේ. අ. අ. කාර්යාලය. |
| කතිරවේළු, එස්. | ... | පළාත් පාලන. |
| කදිරගාමතම්බි. වී. | ... | වාරිමාර්ග. |
| කන්දසාමි, එස්. | ... | මහෙස්ත්‍රාත් උසාවිය, ඉල්ලක්කම්. |
| කමලනාදන්, ආර්. | ... | පළාත් පාලන. |
| කරලියැද්ද, එම්. බී. එස්. | ... | වැ. අ. වි. වැ. කාර්යාලය. |
| කරුණාතිලක, ජේ. එම්. එල්. | ... | කච්චේරිය, මාතලේ. |
| කරුණාදාස, සී. ඒ. | ... | රෙජිස්ට්රාර් ජනරාල්. |
| කරුණාදාස, පී. | .. | ආහාර. |
| කරුණාදාස. ආර්. ජී. | ... | කම්කරු. |
| කරුණාරත්න, පී. ඊ. | ... | වාණිජ. |
| කරුණාරත්න, ආර්. සී. එල්. ද එල්. | | වැ. අ. වි. වැ. කාර්යාලය. |
| කරුණාරත්න, ආර්. ඩී. | ... | සෞඛ්‍ය. |
| කරුණාරත්න, ඩබ්ලිව්. සී. | ... | ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත. |
| කරුණාසේන, ඒ. එල්. | ... | සෞඛ්‍ය අමාත්‍යාංශය. |
| කරුණාසේන, ඩී. ඩබ්ලිව්. ඩබ්ලිව්. | | කච්චේරිය, ගාල්ල. |
| කරුණාසේන, ඩබ්ලිව්. ඒ. | ... | රජයේ වැඩ. |
| කල්දේරා, එච්. පී. ඩබ්ලිව්. | ... | රජයේ ගබඩා. |
| කලඹටුවාව, එන්. බී. | ... | රාජ්‍ය භාෂා. |
| කලංසූරිය, යූ. | ... | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන. |
| කළුආරච්චි, ජී. | ... | වන සංරක්ෂන. |
| කිරිආරච්චි, ඩබ්ලිව්. | ... | කාලගුණවිද්‍යා. |
| කීර්තිපාල, කේ. ටී. ඒ. | ... | වැ. අ. වි. වැ. කාර්යාලය. |
| කුමාරගම, ඒ. ජී. බී. | ... | සෞඛ්‍ය. |
| කුමාරදාස, එච්. එම්. | ... | විභාග. |
| කුමාරසිංහ, බී. ඒ. | ... | මහෙස්ත්‍රාත් උසාවිය, කෑගල්ල. |
| කුමාරසේන, ඒ. වී. | ... | සමාජ සේවා. |
| කුමාරසේන, එන්. ඒ. | ... | රෙජිස්ට්රාර් ජනරාල්. |
| කුරුකුලආදිත්‍ය, එච්. ඩී. සී. ජී. | ... | අධ්‍යාපන. |
| කුරුම්බලපිටිය, ජේ. | ... | කෘෂිකර්ම. |
| කුලතිලක, බී. එච්. | ... | මැතිවරණ. |
| කුලතිලක, කේ. ඩී. ඒ. | ... | කච්චේරිය, කොළඹ. |
| කුලතුංග, පී. | ... | කෘෂිකර්ම. |
| කුලවීරසිංහම්, ටී. | ... | කෘෂිකර්ම. |
| කුලසේකර, අයි. පී. | ... | කච්චේරිය, කොළඹ. |
| කුලසේන, කේ. එම්. | ... | කම්කරු. |
| කොඩිකාර. ජී. එස්. | ... | රජයේ වැඩ. |
| කොලොන්ගහපිටිය. එච්. එම්. සී. | | කෘෂිකර්ම. |
| ගජමන්, යූ. ආර්. එච්. | ... | රෙජිස්ට්රාර් ජනරාල්. |
| ගම්ලත්, ටී. බී. | ... | ඉඩම් සංවර්ධන. |
| ගමගේ, ඩී. බී. | ... | දේශීය ආදායම්. |

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ගමගේ, එස්. | කච්චේරිය, මහනුවර. |
| ගම්ලත්ගේ, ඩී. එස්. ඒ. | විභාග. |
| ගවරත්නැ න, පී. | කච්චේරිය, මාතලේ. |
| ගෆූර්, පී. එම්. ඒ. | සෞඛ්‍ය. |
| ගුණතිලක, ජී. ජී. | ගොවිජන සේවා. |
| ගුණතිලක, එච්. ජී. | අධ්‍යාපන. |
| ගුණතුංග, යූ. ඩී. ඩී. | ගණන් පරීක්ෂක. |
| ගුණදාස, එච්. කේ. | ආහාර. |
| ගුණදාස, කේ. ඩබ්ලිව්. | වැ. අ. වී. වැ. කාර්යාලය. |
| ගුණදාස, එම්. ජී. | කච්චේරිය, මහනුවර. |
| ගුණදාස, ටී. ඒ. | අධ්‍යාපන. |
| ගුණපාල, ඩී. ජී. | ගණන් පරීක්ෂක. |
| ගුණරත්න, කේ. ඒ. | රෙජිස්ට්‍රාර් ජෙනරාල්. |
| ගුණවර්ධන, බී. ඒ. සී. | ගොවිජන සේවා. |
| ගුණවර්ධන, ඩී. ඩී. ඩබ්ලිව්. | විදුලිබල. |
| ගුණවර්ධන, ඩී. එල්. | දේශීය ආදායම්. |
| ගුණසිංහ, යූ. ඩී. ඒ. | දිස්ත්‍රික් උසාවිය, අවිස්සාවේල්ල. |
| ගුණසේකර, ජී. පී. | සෞඛ්‍ය. |
| ගුණසේකර, ජේ. | කච්චේරිය, ගාල්ල. |
| ගුණසේකර, එම්. ආර්. | කච්චේරිය, කෑගල්ල. |
| ගුණසේකර, ආර්. ජේ. එම්. | වන සංරක්ෂන. |
| ගුනවර්ධන, සී. ඒ. | රජයේ වැඩ. |
| ගුරුසිංහ, එස්. | සමූපකාර. |
| චන්ද්‍රදාස, බී. ඒ. ඩී. | රා. ආ. වී. අමාත්‍යාංශය. |
| චන්ද්‍රදාස, කේ. | අධ්‍යාපන. |
| චන්ද්‍රදාස, එන්. කේ. | ඉඩම් සංවර්ධන. |
| චන්ද්‍රසේන, පී. ඩී. | සෞඛ්‍ය. |
| ජයතිලක, එච්. එම්. | කෘෂිකර්ම. |
| ජයතිලක, එස්. | රජයේ වැඩ. |
| ජයතිලක, එස්. කේ. | අධ්‍යාපන. |
| ජයනෙත්ති, ඩී. එල්. එස්. | වාරිමාර්ග. |
| ජයනෙත්ති, ඩී. ආර්. පී. | විදුලි. |
| ජයමහ, ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. ජේ. | කච්චේරිය, පුත්තලම. |
| ජයමාන්න, ජේ. එම්. ඩී. | මෝටර් රථ ප්‍රවාහන. |
| ජයවර්ධන, ඩී. බී. ඒ. | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| ජයවික්‍රම, ඩී. | කෘ. ආ. ධී. අමාත්‍යාංශය. |
| ජයවීර, පී. | ආහාර. |
| ජයවීර, වී. | කච්චේරිය, කොළඹ. |
| ජයසිංහ, ඩී. | විභාග. |
| ජයසිංහ, ජී. බී. | කච්චේරිය, කුරුණෑගල. |
| ජයසිංහ, ජේ. එම්. එස්. | අධ්‍යාපන. |
| ජයසිංහ, එම්. ඒ. | ගොවිජන සේවා. |
| ජයසිංහ, එම්. කේ. ජේ. | දිස්ත්‍රික් උසාවිය, ගාල්ල. |
| ජයසීලන්, ඒ. වී. | කච්චේරිය, ත්‍රිකුණාමලය. |
| ජයසේකර, ඩී. ඩබ්ලිව්. | දිස්ත්‍රික් උසාවිය, යාපනය. |
| ජයසේකර, එච්. ඒ. | කෘෂිකර්ම. |
| ජයසේකර, එච්. ඩී. ඩී. | ගණන් පරීක්ෂක. |
| ජයසේන, එම්. ජී. | කච්චේරිය, රත්නපුර. |
| ජයසේන, ටී. ඩබ්ලිව්. | කම්කරු. |
| ජිනදාස, ටී. | ආනයන හා අපනයන පාලක. |
| ජිනදාස, ජී. | කච්චේරිය, ගාල්ල. |
| ජිනදාස, පී. එල්. | තක්සේරු. |
| ජෙෆ්රි, ඒ. එම්. | කෘෂිකර්ම. |
| ටිකිරිබණ්ඩා, කේ. ඒ. | ගුවන් විදුලි හා ප්‍රවෘත්ති. |
| ඩයස්, ඩබ්ලිව්. පී. | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත. |
| ඩැනිස්ටර්, එල්. පී. | ප. පා. සව. අමාත්‍යාංශය. |
| ඩේවිඩ්, ඩබ්ලිව්. | කම්කරු. |
| තංගරාජා, ටී. | කච්චේරිය, පුත්තලම. |
| තාබ්බෘ, එන්. ඩී. | ගණන් පරීක්ෂක. |
| තිරුණාවුකරසු, එස්. | නාවික හමුදා. |
| තිරුනාවුකරසු, කේ. | කෘෂිකර්ම. |
| තිලකපාල, එම්. | ආනයන හා අපනයන. |
| තිලකරත්න, ජී. | අධ්‍යාපන. |
| තිලකරත්න, ජී. කේ. ඒ. | අධ්‍යාපන. |
| තිලකරත්න, සී. එස්. | කච්චේරිය, කොළඹ. |
| තිසේරා, පී. එන්. | රා. ආ. වි. අමාත්‍යාංශය. |
| තෙන්නකෝන්, එස්. සී. ආර්. | වාරිමාර්ග. |
| ද අල්විස්, ජේ. එම්. එස්. | රජයේ දේශ සංචාරක. |
| ද කුරුකුල, ටී. ඒ. එස්. | සෞඛ්‍ය. |
| දන්තනාරායන, ඒ. | දේශීය ආදායම්. |
| දන්තනාරායන, ඩී. ඩී. | වරාය කොමසාරිස්. |
| දයානන්ද, එල්. ඩී. | රජයේ වැඩ. |
| දයාරත්න, එන්. කේ. | කම්කරු. |
| දයාරත්න, එස්. | සිවිල් ගුවන් සේවා. |
| දයාවංශ, කේ. ඩී. | කච්චේරිය, කළුතර. |
| ද සිල්වා, සී. ඩී. කේ. | නීතිපති. |
| ද සිල්වා, ඩී. | ලංකා වෙළඳ කොමිසම, එංගලන්තය. |
| ද සිල්වා, ඩී. ටී. එල්. | ඉඩම් සංවර්ධන. |
| ද සිල්වා, ජී. වී. ආර්. | රෙජිස්ට්‍රාර් ජෙනරාල්. |
| ද සිල්වා, ජී. ඩබ්ලිව්. එස්. | වන සංරක්ෂණ. |
| ද සිල්වා, එච්. එස්. | අ. බා. වෙ. සැ. අමාත්‍යාංශය. |
| ද සිල්වා, කේ. ඩී. එස්. | ගණන් පරීක්ෂක. |
| ද සිල්වා, කේ. ආර්. | අධ්‍යාපන. |
| ද සිල්වා, එම්. එච්. | අධ්‍යාපන. |
| ද සිල්වා, ටී. ඩබ්ලිව්. | වැ. අ. වි. වැ. කාර්යාලය. |
| ද සිල්වා, පී. ඒ. | වන සංරක්ෂණ. |
| ද සිල්වා, ආර්. එම්. පී. | සමූපකාර. |
| ද සිල්වා, එස්. ජේ. | ජාතික නිවාස. |
| ද සිල්වා, ටී. ඩී. එස්. ඩබ්ලිව්. | ආනයන හා අපනයන. |
| ද සිල්වා, ටී. එල්. | ගොවිජන සේවා. |
| ද සොයිසා, ඩී. බී. | කච්චේරිය, ගාල්ල. |
| දහනායක, ඩී. එස්. | වාණිජ. |
| දිසානායක, එම්. බී. | මහෙස්ත්‍රාත් උසාවිය, කුලියාපිටිය. |
| දිල්ලිමුනි, එන්. පී. | තක්සේරු. |
| දිසානායක, කේ. සී. | ප. පා. සව. අමාත්‍යාංශය. |
| දිසානායක, ඩී. ඊ. | ගොවිජන සේවා. |
| දිවාරත්න, එල්. බී. | පිස්කල් කාර්යාලය, මහනුවර. |
| දිසානායක, ඩී. ඇම්. කේ. බී. | රජයේ වැඩ. |
| දුනුවීර, එස්. | රාජ්‍ය භාෂා. |
| දේවමිත්ත, එස්. | දේශීය ආදායම්. |
| ධනපාල, බී. ජී. | රෙජිස්ට්‍රාර් ජෙනරාල්. |
| ධම්දස, කේ. එස්. | ඉතාලියේ ලංකා තානාපති කාර්යාලය. |
| ධම්පාල, පී. ආර්. | ඉඩම් සංවර්ධන. |
| ධම්පාල, ඩබ්ලිව්. | ගොවිජන සේවා. |
| ධම්ප්‍රිය, ජී. එල්. එල්. | කච්චේරිය, කොළඹ. |
| ධම්සිරි, ජේ. එල්. | කච්චේරිය, මාතර. |
| ධම්සේන, සී. | ආහාර. |
| ධම්සේන, ඩී. ජී. | අධ්‍යාපන. |
| ධම්සේන, ජී. ඒ. | කච්චේරිය, හම්බන්තොට. |
| නඩරාජා, කේ. | පොලිස්. |
| නඩරාජා, එස්. | රජයේ වැඩ. |
| නඩරාජා, එස්. | දිස්ත්‍රික් උසාවිය, කුරුණෑගල. |
| නන්දසේන, එන්. එස්. | ගම්බද උසාවිය, අම්බලන්ගොඩ. |
| නන්දිසේන, එස්. ටී. | අධ්‍යාපන. |
| නයිනන්කඩ, ජේ. | ගොවිජන සේවා. |
| නයිම්, ටී. | ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත. |
| නවරත්න, කේ. එම්. ආර්. | අධ්‍යාපන. |
| නවරත්නසිංහම්, එන්. | රජයේ වැඩ. |
| නාගහවත්ත, එස්. ඩී. | අධ්‍යාපන. |
| නානායක්කාර, පී. ඒ. ටී. | රා. ආ. වි. අමාත්‍යාංශය. |
| නිර්තනසුන්දරම්, ආර්. | ග්‍රා. ක. සං. අමාත්‍යාංශය. |
| පකීර්සයිබෝ, එම්. අයි. | රජයේ දේශ සංචාරක. |
| පඤ්ඤාදාස, එම්. එච්. | තැපැල් හා විදුලි පණිවුඩ අමාත්‍යාංශය. |
| පණ්ඩිතරත්න, ඩබ්ලිව්. | ගොවිජන සේවා. |
| පත්මනාතන්, ඒ. | සෞඛ්‍ය. |
| පත්මනාදන්, කේ. | දිස්ත්‍රික් උසාවිය, පේදුරුතුඩුව. |
| පත්මරාජා, එස්. | නාවික හමුදා. |
| පතිරණ, ඩී. | ගොවිජන සේවා. |
| පතිරණගේ, ඩී. එස්. | ගොවිජන සේවා. |
| පතිරන, ජේ. ඒ. | පිස්කල් කාර්යාලය, මාතර. |
| පතිරන, පී. ආර්. ඩබ්ලිව්. | කම්කරු. |
| පද්මනාතන්, ටී. | සුප්‍රීම් උසාවිය. |
| පරමනාතන්, ඊ. කේ. | ගණන් පරීක්ෂක. |
| පරමනාතර්, වී. | වාරිමාර්ග. |
| පලනිනාදන්, වී. | කම්කරු. |
| පලිහක්කාර, ටී. | කම්කරු. |
| පලිහක්කාර, වී. ඒ. | මහා භාණ්ඩාගාරය. |
| පලිහේන, ජේ. එච්. | මහා භාණ්ඩාගාරය. |
| පියතිලක, පී. ඒ. | කච්චේරිය, බදුල්ල. |
| පියදාස, ඊ. එල්. | සෞඛ්‍ය. |

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| රාජපක්ෂ, ටී. | විදුලි. |
| රාජපක්ෂ, ටී. | විභාග. |
| රාජපක්ෂ, පී. ජී. | සෞඛ්‍ය. |
| රාජපක්ෂ, එච්. | කාෂිකර්ම. |
| රාජපක්ෂ, පී. ජේ. | අධ්‍යාපන. |
| රාජපක්ෂ. ආර්. කේ. ජී. එස්. | අධ්‍යාපන. |
| රාජමන්ත්‍රි, එස්. | රා. ආ. වි. අමාත්‍යාංශය. |
| රාජරත්නම්, ඒ. | විරාය කොමිෂන් සභාව. |
| රාජරත්නම්, එස්. | කච්චේරිය, ත්‍රිකුණාමලය, |
| රාජේන්ද්‍ර, එස්. | ගණන් පරීක්ෂක. |
| රාමනායක, ජී. එන්. ජී. | කච්චේරිය, වවුනියාව. |
| රාමවික්‍රම, ඩී. | වාරිමාර්ග. |
| රූපසිංහ, ඩබ්ලිව්. එම්. ඩී. | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත. |
| රූfපස්, එම්. ඒ. ඩී. | රජයේ බඩු ගබඩාව. |
| රොබට්ස්, ඒ. එච්. | ගොවිජන සේවා. |
| ලයනල්, ජී. පී. | කච්චේරිය, හම්බන්තොට. |
| ලියනආරච්චි, උපසේන | අධ්‍යාපන. |
| ලියනගේ, ජී. වී. | දිස්ත්‍රික් උසාවිය, පානදුර. |
| ලියනගේ, ජේ. ඩී. | රා. ආ. වි. අමාත්‍යාංශය. |
| ලියනගේ, පී. කේ. | සමූපකාර. |
| ලියනගේ ආර්. | පළාත් පාලන. |
| ලීලාරත්න, ඩී. | පළාත් පාලන. |
| වණිගසේකර, කේ. | ගණන් පරීක්ෂක. |
| වත්තේගම, සී. | දේශීය ආදායම්. |
| වන්නිආරච්චි, කේ. ඩබ්ලිව්. | කච්චේරිය, කළුතර. |
| වනිගසේකර, ඩබ්ලිව්. ඩී. | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන. |
| වර්ණකුලසූරිය. සී. | අධ්‍යාපන. |
| වර්ණසූරිය, එන්. පී. | මහා භාණ්ඩාගාරය. |
| වලල්ලාවිට, ඩබ්ලිව්. කේ. කේ. | ධීවර. |
| වික්‍රම, ඩී. ඒ. එල්. | අධ්‍යාපන. |
| වික්‍රමආරච්චි, ඩබ්ලිව්. පී. | අධ්‍යාපන. |
| වික්‍රමතුංග, එස්. එච්. | අධ්‍යාපන අමාත්‍යාංශය. |
| වික්‍රමරත්න, ඒ. එච්. | කම්කරු. |
| වික්‍රමරත්න, ඩී. | අධ්‍යාපන. |
| වික්‍රමරත්න, එන්. ඒ. වී. | කච්චේරිය, කොළඹ. |
| වික්‍රමරත්න, ටී. | කච්චේරිය, කොළඹ. |
| වික්‍රමසිංහ, ඩී. එම්. | අධ්‍යාපන. |
| වික්‍රමසිංහ, ඩබ්ලිව්. ඩී. ඒ. එfජ්. එක්ස්. | සෞඛ්‍ය. |
| විජයදාස, කේ. ටී. | ධීවර |
| විජයවික්‍රම, ඒ. | ජාතික කෞතුකාගාර. |
| විජේගුණරත්න, කේ. පී. | අධ්‍යාපන. |
| විජේතුංග, ඩබ්ලිව්. ඒ. සී. | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| විජේදාස, ජී. එම්. එච්. | වාරිමාර්ග. |
| විජේදාස, ජී. | කම්කරු. |
| විජේදාස, එච්. ඩී. | මහා භාණ්ඩාගාරය. |
| විජේදාස, ජේ. | වැ. අ. වි. වැ. කාර්යාලය. |
| විජේපාල, ඩී. | පොලිස්. |
| විජේරත්න, පී. ජේ. ඩී. | වාරිමාර්ග. |
| විජේරත්න, එස්. | කෘෂිකර්ම. |
| විජේරත්න, එස්. ඒ. පී. | අධ්‍යාපන. |
| විජේරත්න බණ්ඩා, එච්. ඒ. | පොලිස්. |
| විජේසිරි, ඒ. ඒ. එන්. | අධ්‍යාපන. |
| විජේසිංහ, කේ. ජී. ඒ. | වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්. |
| විජේසිංහ, කේ. ජී. එස්. | ආනයන හා අපනයන පාලන. |
| විජේසිංහ, එල්. ටී. | රාජකීය ලංකා ගුවන් හමුදාව. |
| විජේසිංහ, ටී. ඒ. පී. | අධ්‍යාපන. |
| විජේසිංහ, ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. | දේශීය ආදායම්. |
| විජේසුන්දර, ඩී. එස්. | කච්චේරිය, පොළොන්නරුව. |
| විජේසූරිය, ඩී. | වාරිමාර්ග. |
| විජේසූරිය, ඩී. බී. | කම්කරු. |
| විජේසූරිය, ඩී. පී. | අධ්‍යාපන. |
| විජේසූරිය, එන්. ටී. | සෞඛ්‍ය. |
| විජේසූරිය, ආර්. | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| විජේසූරිය, එස්. | රජයේ මුද්‍රණාලය. |
| විජේසේකර, ඒ. | අධ්‍යාපන. |
| විදානපතිරන, ටී. | වාරිමාර්ග. |
| වින්සන්ට්, එච්. ඒ. | ඉඩම් සංවර්ධන. |
| වින්සන්ට් එම්. ජී. | පිස්කල් කාර්යාලය, ගාල්ල. |
| විපුලගුණ, ජේ. වී. | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| විමලදාස, ඩබ්ලිව්. එම්. | ගණන් පරීක්ෂක. |
| විමලරත්න, එම්. ඒ. | මහා භාණ්ඩාගාරය. |
| විමලසේන, ටී. එච්. | ආනයන හා අපනයන පාලක. |
| විමලසේන, එච්. ඒ. | මහා භාණ්ඩාගාරය. |

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| විමලසූරිය, ජේ. | සමූපකාර. |
| විමලසූරිය, ඩබ්ලිව්. ඩබ්ලිව්. එස්. | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| විමලසේන, ජේ. | ප. පා. සව. අමාත්‍යාංශය. |
| විමලසේන, කේ. එම්. ඩී. | වන සංරක්ෂක. |
| විමලසේන, එම්. ඒ. බී. | වන සංරක්ෂක. |
| විල්fප්‍රඩ්, ඒ. එච්. | කච්චේරිය, අම්පාරෙ. |
| විල්මට්, එච්. ඩී. | අධ්‍යාපන. |
| විල්මන්, එච්. ඩී. | ආනයන හා අපනයන පාලක. |
| විල්සන්, එම්. ඒ. | ඉ. වා. වි. අමාත්‍යාංශය. |
| විල්සන්, පී. | ජලසම්පාදන හා ජලාපවහන. |
| විරක්කොඩි, එස්. | ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත. |
| වීරක්කොඩිගේ, ඩී. ඩී. | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| වීරකෝන්, පී. | කෘෂිකර්ම. |
| වීරකෝන්, යූ. එච්. එල්. | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| වීරතුංග, ටී. වී. | ආනයන සහ අපනයන පාලක. |
| වීරතුංග, එල්. | මහා භාණ්ඩාගාරය. |
| වීරතුංග, එස්. ඒ. | දේශීය ආදායම්. |
| වීරවර්ධන, කේ. ඒ. ටී. බී. | අධ්‍යාපන. |
| වීරවර්ධන, එස් බී. ඒ. ඇම්. පී. | සෞඛ්‍ය. |
| වීරවර්ධන, එස්. බී. ඒ. එම්. එස්. | මිනුම්. |
| වීරසිංහ, ඒ. ඩී. | රජයේ වැඩ. |
| වීරසිංහ, එම්. ඩී. | ආහාර. |
| වීරසිංහ, එස්. | පුරාවිද්‍යා. |
| වීරසිංහ, ටී. එම්. | ගණන් පරීක්ෂක. |
| වීරසේකර, ජේ. ඩබ්ලිව්. පී. | ගොවිජන සේවා. |
| වීරසේකර, ජේ. එම්. | ගුවන් විදුලි හා ප්‍රවෘත්ති. |
| වෙත්තසිංහ, ජී. | විදුලි. |
| වෙල්තාසන්, එන්. | කච්චේරිය, කුරුණෑගල. |
| වේතසන්තරම්, එස්. | මෝටර් රථ ප්‍රවාහන. |
| වේලසියා. ඒ. | රජයේ වැඩ. |
| වේලරත්න, ඩී. | කච්චේරිය, කොළඹ. |
| ෂෙරිfජ්ඩීන්, එම්. ආර්. එම්. | පොලිස්. |
| සන්නසූරිය, ඩී. | කම්කරු. |
| සනී. කේ. | ආහාර. |
| සමරදිවාකර, ජී. ඩී. ඒ. | මහා භාණ්ඩාගාරය. |
| සමරදිවාකර, ආර්. කේ. බී. | ගණන් පරීක්ෂක. |
| සමරවීර, පී. ජී. | කච්චේරිය. මහනුවර. |
| සමරවීර, එස්. එම්. ඩී. කේ. | රෙජිස්ට්රාල් ජනරාල්. |
| සමරසිරි, එන්. බී. | අධ්‍යාපන. |
| සමරසිංහ, ඒ. | රජයේ වැඩ. |
| සමරසිංහ, එන්. පී. | අධ්‍යාපන. |
| සමරසිංහ, එස්. එම්. ජී. | අධ්‍යාපන. |
| සමරසිංහ, ටී. කේ. ඒ. | රෙජිස්ට්රාර් ජනරාල්. |
| සමරසිංහ. වයි. ජේ. | අධ්‍යාපන. |
| සමරසේකර, ජී. ජී. එස්. | රජයේ වැඩ. |
| සර්ධාසේන. කේ. | කම්කරු. |
| සරනපාල බණ්ඩා, ඩබ්ලිව්. එම්. | කෘෂිකර්ම. |
| සරවනපවන්. එස්. | මෝටර් ප්‍රවාහන. |
| සැම්සන්. ඩී. ඩී. | දේශීය ආදායම්. |
| සැමවෙල්. එන්. ඩබ්ලිව්. | කම්කරු. |
| සිරිපාල. එල්. | ආනයන හා අපනයන පාලක. |
| සිරිවර්ධන, ජී. ඩී. එන්. | රෙජිස්ට්රාර් ජනරාල්. |
| සිරිවර්ධන, ජේ. | කච්චේරිය, බදුල්ල. |
| සිරිවර්ධන, පී. කේ. ඩී, එච්. | විදුලි බල. |
| සිරිසේන, ඒ. කේ. | මහා භාරකාර. |
| සිරිසේන, ඒ. එස්. | පළාත් පාලන. |
| සිරිසේන, ජේ. ඒ. | නගර හා ග්‍රාම නිර්මාණ. |
| සිරිසේන. කේ. වී. | රජයේ ගබඩා. |
| සිරිසේන, කේ. ඩබ්ලිව්. | මැතිවරණ. |
| සිරිසේන. එම්. ඩී. | විභාග. |
| සිරිසේන, එම්. ඩී. | ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත. |
| සිරිසේන. එච්. එම්. ඒ. | වන සංරක්ෂණ. |
| සිරිසෝම. ඩී. | කච්චේරිය. මාතර. |
| සිල්වා, ඒ. එම්. එස්. | දේශීය ආදායම්. |
| සිල්වා. පී කේ. | ආනයන හා අපනයන පාලක. |
| සිල්වා. කේ. එස්. | මහා භාරකාර. |
| සිල්වා, පී. ඒ. ඒ. | මහා භාණ්ඩාගාරය. |
| සිල්වා, පී. එස්. | කම්කරු. |
| සිල්වා, එස්. ඒ. එල්. | ගොවිජන සේවා, |
| සිල්වා, එස්. සී. අයි, | විදුලිබල. |

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| සිල්වා, එස්. එම්. එස්. | ... | කච්චේරිය, මොණරාගල. |
| සිල්වා. යූ. ඕ. | | කච්චේරිය, මහනුවර. |
| සිවගුරු. එස්. | ... | කච්චේරිය, කළුතර. |
| සිවප තම්. කේ. | ... | ආහාර. |
| සුගතදාස. එච්. ආර්. | ... | කච්චේරිය, හම්බන්තොට. |
| සුගතපාල. ජී. එච්. | ... | කාර්මිකම්. |
| සුගතපාල. එස්. වයි. | ... | කම්කරු. |
| සුදසිංහ. එස්. පී. එච්. | ... | අධ්‍යාපන. |
| සුබ්‍රමණියම්, ආර්. | ... | මිනුම් භාරකාර. |
| සුමතිපාල. කේ. ඒ. | ... | අධ්‍යාපන. |
| සුමනදාස. ඩී. ඒ. | ... | විදුලිබල. |
| සුමනවීර. ඩී. කේ. | ... | වැ. අ. වි. වැ. කායසීලය. |
| සුමනසිරි, සී. ඩී. | ... | ගණන් පරීක්ෂක. |
| සුමනසේන, ඩී. එල්. | ... | ගණන් පරීක්ෂක. |
| සුමනසේන, එම්. ආර්. සී. | ... | රජයේ දේශ සංචාරක. |
| සුරනිමල්, ආර්. | ... | අධ්‍යාපන. |
| සූරසංගරන්, ටී. ජේ. | ... | දේශීය ආදායම්. |
| සෙනරත් බණ්ඩාර. ඒ. ඒ. | ... | කච්චේරිය, පොළොන්නරුව. |
| සෙනෙවිරත්න, එච්. එම්. ඒ. | ... | සමාජ සේවා. |
| සෙනෙවිරත්න, එච්. එම් ජී. | ... | ශ්‍රී ලංකා ජාතික කලායතනය. |
| සෙනෙවිරත්න, පී. ඩී. ඒ. ඒ. කේ. | | කාර්මිකම්. |
| සෙනෙවිරත්න, ඩබ්ලිව්. ජී. ඒ. | ... | අධ්‍යාපන. |
| සෙල්වේන්ද්‍රන්, කේ. | ... | වාරිමාර්ග. |
| සේනානායක, ඩබ්ලිව්. පී. ජී. ඩී. ඩී. | | රජයේ ගබඩා. |
| සේනාතිරාජා, එස්. | ... | වාරිමාර්ග |
| සේනාධීර, ඩබ්ලිව් කේ. | ... | මෝටර් ප්‍රවාහන. |
| සොයිසා, ඩබ්ලිව්. වී. | ... | ආනයන හා අපනයන පාලක. |
| සෝමදාස, ඒ. | ... | සිවිල් ගුවන් සේවා. |
| සෝමදාස, එස්. | ... | කච්චේරිය. ගාල්ල |
| සෝමපාල. ඒ. ජී. | ... | කච්චේරිය, කළුතර. |
| සෝමපාල. එච්. ඒ. | ... | ගණන් පරීක්ෂක. |
| සෝමරත්න. බී. ආර්. | ... | කච්චේරිය, රත්නපුර. |
| සෝමසිරි. ජේ. බී. ඒ. | ... | සෞඛ්‍ය. |
| හඳුන්පතිරාජ. එම්. පී. | ... | රාජ්‍ය ලේඛනාරක්ෂක. |
| හනන්, ටී. එම්. යූ. | | ගණන් පරීක්ෂක. |
| හරිදාස. එම්. එම්. | ... | ඉඩම් සංවර්ධන. |
| හල්පගේ. ජේ. | ... | කම්කරු. |
| හැරිස්. එම්. එච්. | ... | මහා භාණ්ඩාගාරය. |
| හිරිමතුගොඩ. පී. | ... | අධ්‍යාපන. |
| හෙට්ටිගේ. ඒ. | ... | කච්චේරිය, කොළඹ. |
| හේරත්. එච්. එම්. එම්. | ... | කාර්මිකම්. |
| හේරත්, එච්. එම්. පී. | ... | ගොවිජන සේවා. |

ඩී. සී. එල්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1964 නොවැම්බර් 24 වැනි දින,
කොළඹ. මහා භාණ්ඩාගාරයේ දී ය.

12–580—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

ගබඩා දෙපාර්තමේන්තුවේ. ගබඩා අධිකාරි තැන (ලිපිනය : තැ. පෙ. 418. පාර්සන්ස් පාර. කොළඹ 2) විසින් සී වයි. 6591 දරන බුයික් කාරය විකිණීම සඳහා. 1965.1.5 වන අඟහරුවාදා සවස 2.30 වන තුරු සීල් තැබූ ටෙන්ඩර් බාරගනු ලැබේ.

සතියේ දිනවල සවස 2 සිට 4 දක්වා කොළඹ, පාර්සන්ස් පාරේ, ගබඩා දෙපාර්තමේන්තුවේදී වාහනය පරීක්ෂා කළ හැකිය.

ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් විවෘත කරන ස්ථානයෙහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවන්ට ඉඩ දෙනු ඇත.

ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත් ෆෝර්මවල මාර්ගයෙන්, අනුපිටපතක් සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයේ රු. 500ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, 1965.1.2 වන සෙනසුරාදා දවල් 12 දක්වා ගබඩා අධිකාරිගෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය.

වැඩි විස්තර ගබඩා අධිකාරිගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1964 දෙසැම්බර් 2 දින,
ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව,
කොළඹ.

12–490—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

1965 ජනවාරි 1 වෙනිදා සිට 1965 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා තාරුහේන්සිට ලුණු ගබඩාවට (ඉරු දෙකේ) පොල් අතු 50.000ක් පමණ සැපයීමට සහ ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤ වීදියේ අංක 110. ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතෙහි ලුණු කොමසාරිස් තැන විසින් 1964 දෙසැම්බර් මස 23 වෙනි බදාදා පස්වරු 3 වනතුරු බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අග පිටපත සමඟ ලුණු කොමසාරිස් තැනගේ කායසීලයෙන් 1964.12.21 වෙනි දින දවල් 12 වනතුරු නිකුත් කරන ආකෘති පත්‍රවලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් කායසීලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ලුණු කොමසාරිස් කායසීලයේ මුදල් තැන්පත් කරන්නෙහි නම්, චෙක් පත්වලින් සැපයිය යුතුයි. වැඩි විස්තර ලුණු කොමසාරිස් කායසීලයෙන් ලබාගත හැකියි.

ජේ. ජේ. ජී. අමීර්තනායගම්,
වැඩ බලන ලුණු කොමසාරිස්.

1964 දෙසැම්බර් 11 වෙනි දින,
කොළඹ 2.

12–378—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## 'ඇප්' 1 ගුදමේ තිබෙන බඩු ටෙන්ඩර් මගින් විකිණීමයි

රේගු දෙපාර්තමේන්තුවේ "ඇප්" 1 දරන ගුදමේ තිබෙන පහත සඳහන් බඩු මිලයට ගැනීම හා ඉවත් කරගෙන යාම සඳහා, 1964 දෙසැම්බර් 30 දින දවල් 12 වන තෙක් ප්‍රධාන රේගු අයකැමි විසින් මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් දින එම වේලාවට ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටීමට අවසර ඇත.

3. ප්‍රධාන රේගු අයකැමි කායසීලයේ රුපියල් සියයක මුදලක් තැන්පත් කොට එම කුවිතාන්සිය රේගුවේ ප්‍රධාන ලිපිකරු වෙත ඉදිරිපත් කළ විට ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් ලැයිස්තුවේ ඇති ඕනෑම බඩු තොග එකකට හෝ ඊට වැඩි ගණනකට මිල ගණන් ඉදිරිපත් කළ හැක.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලන කවරවල වම් පස ඉහළ කෙළවරේ " 'ඇප්' 1 ගුදමේ ඇති බඩු සඳහා ටෙන්ඩර්" යයි සඳහන් කොට ප්‍රධාන රේගු අයකැමි වෙත එවිය යුතුය. ටෙන්ඩර් පත් භාර ගන්නා වේලාව ඉක්මීමට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් එවීමට හෝ මේ සඳහා ප්‍රධාන රේගු අයකැමි කායසීලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කිරීමට හෝ පුළුවන.

6. 'ඇප්' 1 දරන ගුදම භාර නිලධාරි තැන සමඟ කලින් සාකච්ඡා කොට අනුමත කර ගන්නා වේලාවක එම භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

7. ටෙන්ඩර් ඉදිරිපත් කළ භාණ්ඩයන්හි සම්පූර්ණ මිල ගෙවූ අනතුරුව පමණක් පිළිගන්නා ටෙන්ඩර්කරුවන්ට එම භාණ්ඩ භාර දෙනු ලැබේ.

8. ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂෙප කිරීමට හෝ බලය ප්‍රධාන රේගු අයකැමි සතුව ඇත. මේ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගත යුතුය.

9. යම් කිසි භාණ්ඩයක් සඳහා මිල ගණන් පිළිගෙන ඇතැයි යම් කිසි ටෙන්ඩර්කරුවෙකුට දනුම් දුන් දින සිට වැඩ කරන දවස් තුනක් ඇතුළත ඉවත් කරගෙන නොයන සෑම භාණ්ඩයක් සඳහා ම වැඩිදුර කුලී හා වරාය ගාස්තු වලංගුව පවතින ප්‍රමාණයන් අනුව ගෙවිය යුතුය.

10. යම් කිසි භාණ්ඩයක් සඳහා මිල ගණන් පිළිගෙන ඇතැයි යම් කිසි ටෙන්ඩර්කරුවෙකුට දනුම් දුන් දින සිට දින හතක් ඇතුළත සම්පූර්ණ මුදල ගෙවා එම භාණ්ඩය හෝ භාණ්ඩ ඉවත් කරගෙන නොගියහොත් ප්‍රධාන රේගු අයකැමිගේ අභිමතය පරිදි නැවත විකිණිය හැක. එවැනි ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පතුව රාජසන්තක කරනු ලැබේ.

11. ටෙන්ඩරය පිළිගත් අවස්ථාවේ සිට එම භාණ්ඩ ගුදමේ රැඳී පවතිනුයේ ටෙන්ඩර්කරුගේ වගකීම මත වේ.

12. භාණ්ඩවල තත්ත්වය, ස්වභාවය හා හිමිකම සම්බන්ධයෙන් ප්‍රධාන රේගු අයකැමි වග නොකියනු ඇත. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට පෙර ටෙන්ඩර්කරුවන් මෙම කරුණු සොයා දනගත යුතුය. ටෙන්ඩර් පිළිගත් පසු අනාවරණය වන අඩුපාඩු සම්බන්ධ ව අඩු කිරීමක් නොකරනු ඇත.

13. 1964 දෙසැම්බර් 29 වන දින දවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

14. වැඩිදුර විස්තර කොළඹ රේගුවේ ප්‍රධාන ලිපිකරු කාර්‍යාලයෙන් ලබාගත හැක.

බී. අයි. ගුණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංකය ඒඩී/ටීආර්/17,
1964 දෙසැම්බර් මස 5 දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

**විකිණීම සඳහා ඇති බඩු**

| | | |
|---|---|---|
| යකඩ සේප්පුවක් | විදුලි යන්ත්‍ර උපකරණ | රේයොන් කෑලි රෙදි |
| මහණ මැෂිමක් | කෘත්‍රිම පට කෑලි රෙදි | රසායන ද්‍රව්‍ය |
| සිගරට් පෙට්ටි සහ ලාච්චු කාටුන | කපු කෑලි රෙදි | මුද්‍රිත ද්‍රව්‍ය ආදිය |
| ඉතිහාස පොත් | මෝටර් වාහන අමතර කොටස් | |
| තේ පෙට්ටි ලෑලි | විලවුන් නිෂ්පාදන | |

12-476—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

**ජංගම වායු සංපීඩකයක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවමින් 1964.11.13 දා අංක 14,225 දරණ ගැසට් පත්‍රයේ 1495 වන පිටුවේ පළවූ ගැසට් නිවේදනය සම්බන්ධව, ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය 1964 දෙසැම්බර් මස 30 වෙනිදා පෙ. ව. 9.30 තෙක් දීර්ඝ කරන ලද බව මෙසින් දන්වමි.

2. ටෙන්ඩර් ලියකියවිලි 1964.12.28 වෙනිදා දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1964 දෙසැම්බර් 4 වැනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

12-564—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**පොළොන්නරුව උප කොට්ඨාශය**

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1965 ජනවාරි මස 5 වෙනි අඟහරුවාදා පෙරවරු 10.00 දක්වා පොළොන්නරුවේ ඊශාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේ ම එහි දී සිදු කෙරේ.

| | වැඩෙහි නම | ලියා පදිංචි ගණන | ටෙන්ඩර් තැන්පත් රු. ශ. |
|---|---|---|---|
| 1. | පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය යටතේ කඩා වෙන් කරන ලද කොටස් 292හි කුඹුක්කන්ආරු හරහා අමුණක් ඉදි කිරීම | රු. 30,000 හා ඊට වැඩි ... | 50 0 |
| 2. | ආනඋළන්දව වැව සංවර්ධනය කිරීම ... ... ... ... | රු. 20,000 හා ඊට වැඩි ... | 25 0 |

2. ඉහත සඳහන් 1 වෙනි ඡේදයේ එක් එක් වැඩ සම්බන්ධව දක්වා ඇති මිළ ගණන් හෝ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචි වී ඇති විවිධ සේවා සමුපකාර සමිති සහ වෙනත් සමිතිවලට ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. මෙම වැඩ සඳහා ටෙන්ඩර් ආකෘති පත් 1965 ජනවාරි 1 වෙනි සිකුරාදා හෝ එදිනට පෙර හෝ කාර්‍යාල වේලාවන් තුළ දී පොළොන්නරුව උප කො. වාරිමාර්ග ඉංජිනේරු මින්නේරිය, කවුඩුල්ල වාරිමාර්ග ඉංජිනේරු, හිඟුරක්ගොඩ මින්නේරිය වාරිමාර්ග ඉංජිනේරු යන ඉංජිනේරුවරුන්ගෙන් ලබාගත හැක. එසේ ලබා ගන්නා පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා තමන් පෝර්ම ලබා ගන්නට කැමැති වාරිමාර්ග ඉංජිනේරුවරුන් වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර පළමුවන ඡෙදයේ එක් එක් වැඩ ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණයට ටෙන්ඩර් තැන්පත් මුදල කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ලියා පදිංචි සමිතිවලට ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ.

4. මෙම ටෙන්ඩර් ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්‍යාලය වේලාවන් තුළ දී පොළොන්නරුව වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ගෝ ජී. පු. ගුණවර්ධන,
වාරිමාර්ග ඉංජිනේරු,
පොළොන්නරුව උප කොට්ඨාශය.

1964 දෙසැම්බර් මස 4 වෙනි දින,
පොළොන්නරුවේ වාරිමාර්ග කාර්‍යාලයේ දීය.

12-467—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වෙන්කලඩි උප කොට්ඨාශය

1. නැගෙනහිර පළාතේ තොඩුවිල් ආරු අමුනේ ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත් 1965 ජනවාරි මස 5 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000.00 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965 ජනවාරි මස 1 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී වෙන්කලඩි වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

සු. රාජේන්ද්‍රම්,
වාරිමාර්ග ඉංජිනේරු,
වෙන්කලඩි උප කොට්ඨාශය.

12–555—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පේරාදෙණිය

### මාන්කුලම් ක්ෂේත්‍ර අළුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථානයේ පාවිච්චියට ගත නොහැකි කොමර් පික්අප් වාහණයක් විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 ජනවාරි මස 1 වැනි දින පස්වරු 2.30 වන තෙක් පාවිච්චියට ගත නොහැකි කොමර් පික්අප් වාහණයක් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ෆෝර්මකොළ පේරාදෙණියේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රුපියල් 25ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ඒ. ටී. එම්. සිල්වා,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙණිය,
1964 දෙසැම්බර් මස 4 වැනි දින.

12–520—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම

මා විසින් 1964 නොවැම්බර් 27 වෙනි දින ගැසට් පත්‍රයෙහි පළකරන ලද දැන්වීමට වැඩි දුරටත්, නාත්තාන්ඩිය නි. මි. යෝ. ක්‍ර. ගබඩාවට හා රජයේ හාල්මෝලට 1965 වර්ෂයට කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීමේ ටෙන්ඩර් අවසාන දිනය 1964 දෙසැම්බර් 21 වැනි සඳුදා තෙක් දීර්ඝ කරන ලදී. ටෙන්ඩර් පත්‍ර 1964.12.21 දින දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

කේ. සිත්තම්බලම්,
ගො. ජ. සේ. කො. වෙනුවට.

1964 දෙසැම්බර් 11 දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

12–570—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් කෑගල්ල දිස්ත්‍රික්කය තුළ සෑදීම, අළුත් වැඩියා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම පිණිස පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

1. බෙලිගල් කෝරළේ නාපේ දෙනිපල්ලේ අමුන සෑදීම
2. —එම— බුරුන්නාවේ බුරුන්නාව වේල්ල සෑදීම
—එම— මාරුක්වතුරේ ඉහල නාගහකුඹුර අමුන සෑදීම
4. —එම— ලානුපානේ බෝකුඹුරයාය අමුන අළුත් වැඩියා කිරීම
5. —එම— මල්වානේ මහකුඹුර ආරක්ෂක බැම්ම සෑදීම
6. —එම— මැණික්කඩවර ගල්වලේ අමුන සෑදීම
7. —එම— අල්ගම රදාගෙ කුඹුර ආරක්ෂක බැම්ම සෑදීම
8. —එම— වද්දෙනියේ තොටපොල අමුන සෑදීම
9. —එම— හරිගල ගෝනිස්ගොඩ අමුන සෑදීම
10. පරණකුරු කෝරළේ ඔවිටිගමුවේ වියලිකුඹුර අමුනේ කොන්ක්‍රීට් පීල්ල සෑදීම
11. —එම— හේවාදිවෙල, කටුපඳුර අමුන සෑදීම
12. —එම— වලල්ගොඩ, වැලිකුඹුර අමුන ආරක්ෂක බැම්ම සෑදීම
13. ගල්බොඩ කෝරළේ වැලිමත්තේ ආඳාවල අමුන සෑදීම
14. —එම— උඩත්තව දෙනියේ කුඹුර ඇල කඩායාම සෑදීම
15. අටුළුගම් පනාවල් දෙකෝරළේ තලපිටියේ දිගපොතකුඹුර අමුන සෑදීම

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965 ජනවාරි මස 9 දින දවල් 12 දක්වා කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10ක් (රුපියල් දහයක) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින්ද දැක්විය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ. වම් කෙළවරේ "කෑගල්ල දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1964 ජනවාරි මස 12 දින දවල් 12 ට පෙර කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ, මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ විට පමණකි. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවාත් පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඇතුළත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණ සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන සවිර ඒවා විය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර්පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර්පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්‍යය සඳහා "ලාංකික" කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකික" යන වචනයේ අර්ථය නම්, "පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක් ය." යන්නයි.

14. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සළකනු ලැබේ.

15. වර්‍ෂ 1934 රෙගු, 19 වෙනි අංකය දරණ කම්කරු වන්දි ආඥා පනත (117 වෙනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුය.

16. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරණු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

17. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලේඛනයට තනි තනිව හෝ ඒ ලේඛනයේ නම සඳහන් වෙන සෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂතුමා විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැදෙනු නොලැබේ.

18. වැඩි විස්තර කුණ්ඩසාලේ කෘෂිකම් විද්‍යාලයේ විද්‍යාලයාධිපතිගෙන් හෝ පේරාදෙණියේ කෘෂිකම් විද්‍යාලයේ විද්‍යාලයාධිපතිගෙන් හෝ දැන ගත හැකිය.

ඒ. පී. එම්. සිල්වා,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1964.12.2 වෙනි දින,
පේරාදෙණියේ
කෘෂිකම් දෙපාර්තමේන්තුවේදිය.

12–491—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කොල්ලුපිටියේ රජයේ මස් හලේ ගවයින් හම් ගැසීම

කොල්ලුපිටියේ රජයේ මස් හලේ ඝාතනය සඳහා සිටින ගවයින් හම් ගැසීම සඳහා පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව සීල් තබා එවන ටෙන්ඩර්, කොළඹ ඕයුක් විදියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964.12.22 දින සවස 2.30 දක්වා භාර ගනු ලැබේ :—

2. (අ) (i) කොන්ත්‍රාත්කරු දිනපතා උදේ 6 ට ගවයින් ඝාතන මධ්‍යස්ථානයට පැමිණ, කොළඹ සත්ව නිරෝධායන මධ්‍යස්ථානයේ කොටු කර සිටින ගවයින් අතුරින් එදින ඝාතනය සඳහා වෙන් කරනු ලැබූ ගවයින් අල්ලා ඝාතන මධ්‍යස්ථානයට ගෙන යා යුතුය ;

(ii) ඝාතන මධ්‍යස්ථානයේදී ඝාතනය කළ යුතු ගවයින් බැඳ දමා කුදලා, බිම හෙලීම හා ඝාතනය කරන තැනැත්තාට සහාය විය යුතුය ;

(iii) ඝාතනය කරනු ලැබූ ගවයින්ගේ හම් ගැසීම හා උන්ගේ අභ්‍යන්තරීය ගොම මලමූත්‍ර ආදිය ඉවත් කළ යුතුය ,

(iv) ඝාතනය කරනු ලැබූ ගවයින්ගේ බොකු සෝදා පවිත්‍ර කර, වෙනම තැබීම හා පීකුදු, හිස, පෙනහැලි, ඇලදිව ආදිය වෙන් වශයෙන් තැබිය යුතුය ;

(v) එසේ කොටස් කරනු ලැබූ මළ කඳ අන්පා වශයෙන් කොටස් හතරකට වෙන් කර නියමිත පරිදි එල්ලා තැබිය යුතුය ;

(vi) මස් කිරා ගැනීමේදී, ලොරිවලට පැටවීමේදී හා ලොරිවලින් බෑමේදී සහාය විය යුතුය ;

(viii) ගෝ ඝාතක මධ්‍යස්ථානය මනාව සෝදා පවිත්‍ර කළ යුතුය.

(ආ) (i) සත්ව නිරෝධායන මධ්‍යස්ථානයේ ඇති ගවයින් ඝාතනය සඳහා ගෙන යා යුත්තේ, එම මධ්‍යස්ථානයේ බලධාරියෙකු විසින්, එදින ඝාතනය සඳහා සුදුසු යයි නම් කරනු ලැබූ ගවයින් පමණය ;

(ii) දිනකට දළ වශයෙන් ගවයින් 8-15 දක්වා ප්‍රමාණයක් හම් ගැසීමට සිදුවිනවා ඇත. මේ ප්‍රමාණය වැඩිවීමට ඉඩ ඇත ;

(iii) ගවයින් හම් ගැසීමේදී හම් නො කැපීම හා හම්වලට තුවාල සිදු නොකිරීමට වග බලා ගත යුතුය. හම් ගැසීම් සම්බන්ධයෙන් සත්ව නිරෝධායන මධ්‍යස්ථානයේ රජයේ පශු වෛද්‍ය නිලධාරියේ උපදෙස් පිළි පැදිය යුතුය.

මෙම කොන්ත්‍රාත්තුව 1965.1.1 දින සිට 1965.6.30 වැනි දින තෙක් පවරනු ලැබේ.

4. මෙහි පහත 11 වැනි ඡේදයේ සඳහන් "කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම" ගැනෙනුයේ දිනකට ගවයින් 15 බැගින් හය මාසයකට හම් ගැසීමේ මුදල තක්සේරු කිරීමෙනි.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින දවල් 12 තෙක් පමණි. ටෙන්ඩර් පත්‍රයක් ලබා ගැනීම සඳහා රු. 20ක් තැන්පත් කළ යුතුය. මෙම මුදල් තැන්පත් කිරීම, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක නැතහොත් කොළඹ මහා භාණ්ඩාගාරයේ කළ යුතුය.

තැන්පත් කළ මුදල් වෙනුවෙන් එම ස්ථානයකින් නිකුත් කරනු ලබන මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, **කොළඹ 1, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂක ගෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකිය.**

6. ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිසි අයුරු සම්පූර්ණ කර, අනු පිටපතකින් යුක්තව, කවරයක බහා සීල් තබා, "සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලය, තැ. පෙ. 536, කොළඹ 1", යන ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අතින්ම ගෙනවිත් භාර දිය හැකි ටෙන්ඩර් පත්‍ර ද යට කී ලෙස සකස් කර, එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ උඩ වම් කෙළවරේ **"කොල්ලුපිටියේ රජයේ මස් හලේ ගවයින් හම් ගැසීම"** යනුවෙන් ලියා එවිය යුතුය.

7. ටෙන්ඩර් ආකෘති ලබාගැනීම සඳහා එවන මුදල් කුවිතාන්සි හෝ ටෙන්ඩර් පත්‍ර සම්බන්ධයෙන් තැපෑලේදී වන ප්‍රමාද දෝෂ යන් හෝ නැතිවීම සම්බන්ධයෙන් ද වග කියනු නොලබන අතර, නොපැහැදිලි ලෙස ලියා ඇති, නියමිත ආකෘති පත්‍රවල සඳහන් නොකර ඇති, නියමිත කොන්දේසිවලට අනුකූල නොවන, නැතහොත් නියමිත දිනට පසු ලැබෙන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. ලියා පදිංචි කර එවන ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඉල්ලුම්කරුට දන්වා එවනු ඇත. එවැනි දැන්වීමක් කිසියම් ඉල්ලුම්කරුවකුට ටෙන්ඩර් විවෘත කිරීමට තිබූ දින සිට දින 4 ක් ඇතුළත නොලැබුණ හොත්, තෙවැනි ඡේදයේ සඳහන් කාර්යාලයෙන් විමසිය යුතුය. ටෙන්ඩර් විවෘත කර අවස්ථාවේදී අවශ්‍ය නම් ඉල්ලුම්කරුට ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

9. මේ සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි. ලාංකික යන්නෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසිකම ලබාගෙන ඇති බවය.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් නොවෙනස්වන ඒවා විය යුතුය.

11. තෝරාගත් කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10 ක් ඇතුළත කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමින් සියයට පහක් ඇප වශයෙන් 5 වැනි ඡේදයේ සඳහන් ස්ථානයක තැන්පත් කර, එම කුවිතාන්සිය කොළඹ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයට එවිය යුතුය. ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට එම කාර්යාලයෙන් දිනයක් දන්වනු ඇත.

12. ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ ගිවිසුම් පත්‍රයට අත්සන් කළ පසුය. යම් ලෙසකින් ඇප මුදල තැන්පත් නොකර හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු නොකරනු ලැබුවහොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ.

සන්තක කර, දෙපාර්තමේන්තුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඔහුගේ නම ද ඇතුළත් කරනු ලැබේ.

13. තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවිකයකු වෙනුවෙන් 1934 රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුය.

14. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දැනුම්දීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහුගේ නියෝජිතයාට (සමාගමක් නම් ව්‍යාපාරයේ නියෝජිතයා හෝ ලේකම් තැන) දුන්නොත් ඔහු විසින් සපයන ලද ඔහුගේ කන්තෝරුවේ/නිවසේ ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඒ ඔහුට භාරදුන්නා සේ සළකනු ලැබේ. යම්කිසි ලෙසකින් කොන්ත්‍රාත්කරු ඔහුගේ කන්තෝරුවේ/නිවසේ ලිපිනය වෙනස් කර තිබේ නම්, ඒ බව කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙත දැනුම් දිය යුතුයි. කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙත දැනුම් දීමකින් ඒ බව දන්වන තුරු පොරොන්දු පත්‍රයේ සඳහන් ලිපිනයට සියළුම ලියුම් හෝ දැන්වීම් හෝ වෙනත් ලියවිලි යැවීමෙන් ඒවා භාරදුන් බවට ඒත්තු ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කාරයන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් කෙනෙකුගේ නම් සමග ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

16. තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු විසින් ඇප කරුවන් දෙදෙනකු සොයාගෙන ඔහුගේ වියදමින් ම පොරොන්දු පත්‍රයට අත්සන් තැබිය යුතුය. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කළ යුතුය.

17. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමට ද, වුවමනා ප්‍රමාණයන් සපයා දෙන ලෙස නියම කිරීමට ද බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

18. පොරොන්දු පත්‍රයකට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ කොන්ත්‍රාත්කරු විසින් ම ගෙවිය යුතුය.

19. වැඩි විස්තර කොළඹ 2, සත්ව නිරෝධායන මධ්‍යස්ථානයේ පශු වෛද්‍ය නිලධාරීගෙන් ලබාගත හැකිය.

ඒ. ටී. එම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂක.

1964 12.5,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 395, කොළඹ 1.

12–498—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිස් ටින් හා හිස් කවර විකිණීම

පහත සඳහන් විස්තර දක්වා ඇති ද්‍රව්‍ය ඒ ඒ ගොවිපලවලින් මිළ දී ගෙන යාම සඳහා, සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර, කොළඹ 1, ඩියුක් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1964.12.22 වැනි දින, පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

| ගොවිපල | ද්‍රව්‍ය විස්තර | ලබාගත හැකි දළ ප්‍රමාණය |
|---|---|---|
| රිදියගම ... | හිස්ටින් (ගැළුම් එකේ) ... | 16ක් පමණ |
| එම ... | හිස්ටින් (ගැළුම් හතරේ) ... | 18ක් පමණ |
| එම ... | ඩ්‍රම්ස් (ගැළුම් හතරේ) ... | 18ක් පමණ |
| එම ... | ඩ්‍රම්ස් (ගැළුම් පහේ) ... | 117ක් පමණ |
| වැලිසර ... | හිස්ටින් (අවුන්ස 12) ... | 52,500ක් පමණ |
| කුණ්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානය | හිස්ටින් (කිරිටින්) ... | 200ක් පමණ |
| එම ... | හිස්ටින් (මෝරතෙල් ටින්) | 500ක් පමණ |
| එම ... | හිස් කඩදසි බෑග් ... | 5,000ක් පමණ |
| නිකවැරටිය ... | හිස්කඩදසි බෑග් ... | 1,400 පමණ |

2. මේ සඳහා ටෙන්ඩර් පෝරම, කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර එවිය යුතුය. ටෙන්ඩර් පෝරම දෙනු ලබන්නේ, මේ සේවාව සඳහා රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුය. මුදල් තැන්පත් කිරීම, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක, නැතහොත් කොළඹ මහා භාණ්ඩාගාරයේ කළ යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දින දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කෙරේ. මෙම කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝරම වලම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලබන්නේ, කොන්ත්‍රාත්තුව සතුටුදයක ලෙස ඉටුකළ පසුය. අවශ්‍ය වුවහොත්, ඇප මුදලක් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයකට බැඳීමටත් කොන්ත්‍රාත්කරු සතුටුවිය යුතුය. එසේ වුවහොත්, ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ටෙන්ඩරයකින් කොටසක් පිළිගැනීම හෝ, ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීම ආණ්ඩුව බලතල යටතේ වන්නේය.

5. 1934 රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥ පනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ සේවකයකු හෝ සේවකයන් වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

6. පත්කරනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් සේවාවන් ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් යෙදවිය යුතුය. ලාංකික යනුවෙන් අදහස් කරන්නේ, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකා පුරවැසි අයිතිය ලබා ඇති බව ය.

7. කලින් නියම කර ගත් දිනක ඉහත සඳහන් ද්‍රව්‍ය පරීක්ෂා කර බැලීම සඳහා, ඒ ඒ ගොවිපල්වල කළමනාකරුවන්ගේ සහාය ලබාගත හැකිය.

8. වැඩි විස්තර ඒ ඒ ගොවිපල්වල කළමනාකාරවරුන්ගෙන් ලබාගත හැකි ය.

ඒ. ටී. ඇම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1964.12.7 වැනි දින,
කොළඹ 1, ඩියුක් වීදියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

12-499/1—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිස් ගෝනි විකිණීම

සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ගොවිපල් වල ඇති හිස් ගෝනි විකිණීම සඳහා, කොළඹ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 දෙසැම්බර් මස 22 වැනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. එක ගෝනියකට ගෙවන මිල හෝ තොග වශයෙන් ගැනීමේ දී ටොන් එකකට හෝ හොන්ඩරයකට ගෙවන මිල ටෙන්ඩර් පෝරමයේ සඳහන් කළ යුතුයි. තෝරා ගන්නා ලද ටෙන්ඩර්,කරු 1965.1.1 වැනි දින, සිට 1965.9.30 වැනි දින දක්වා ඒ ඒ ගොවිපලින්, මාසයකට වරක් සෑම මාසයේ ම 15 වැනි දිනට පෙර මේ හිස් ගෝනි මිල දී ලබා ගත යුතුයි. සාමාන්‍යයෙන් ගොවිපල් වලින් මාස්පතා දළ වශයෙන් ලබා ගත හැකි යයි බලාපොරොත්තු වන ගෝනි ගණන් මෙහි පහත දක්වේ :—

| | | | කිට්ටුම දුම්රිය පොළ |
|---|---|---|---|
| 1. | බෝපත්තලාව සත්ව ගොවිපල... | 2,000 ... | තලවකැලේ |
| 2. | රිදියගම සත්ව ගොවිපල ... | 1,500 ... | අම්බලන්තොට |
| 3. | පොලොන්නරුව සත්ව ගොවිපල | 1,250 ... | පොලොන්නරුව |
| 4. | අඹේවෙල සත්ව ගොවිපල ... | 1,000 ... | අඹේවෙල |
| 5. | වැලිසර සත්ව ගොවිපල ... | 500 ... | රාගම |
| 6. | උඩුගොඩ රජයේ කිරි පට්ටිය ... | 300 ... | පොල්ගහවෙල |
| 7. | කන්දකඩුව සත්ව ගොවිපල ... | 200 ... | වැලිකන්ද |
| 8. | කුන්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානය | 100 ... | මහනුවර |
| 9. | කොටුකච්චිය එළුවන් ගොවිපල | 100 ... | පුත්තලම |
| 10. | කරගොඩ - උයන්ගොඩ සත්ව ගොවිපල | 150 ... | මාතර |
| 11. | වීරවිල කපු බීජ මධ්‍යස්ථානය ... | 100 ... | තිස්සමහාරාමය |
| 12. | නිකවැරටිය සත්ව ගොවිපල ... | 60 ... | මාහෝ |
| 13. | කුන්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානය | 50 ... | මහනුවර |
| 14. | යාපනේ, තින්නවැලියේ කෘතිම සිංචන මධ්‍යස්ථානය | 50 ... | යාපනය |
| 15. | මාරවිල සත්ව ගොවිපල ... | 100 ... | නාත්තන්ඩිය |

සැ. යු.—බෝපත්තලාව, රිදියගම, වැලිසර, කන්දකඩුව, කුන්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානය, කොටුකච්චිය, කරගොඩ-උයන්ගොඩ, වීරවිල, නිකවැරටිය, කුන්ඩසාලේ මධ්‍යම කෘතිම සිංචන මධ්‍යස්ථානය, මාරාවිල යන ගොවිපල් වල හා ආයතන වල පළමු මාසයේ දී ඉහත සඳහන් දළ ඇස්තමේන්තුවට වඩා තොග ලබා ගත හැකි ය.

3. ගොවිපල් සියල්ලට ම හෝ එක් එක් ගොවිපලට වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් ඉල්ලුම් පත් එවිය හැකියි. එහෙත් එක් එක් ගොවිපල වෙනුවෙන් රු. 10 බැගින් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සි හෝ කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන්, කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලනය හා සෞඛ්‍ය කාර්යාලයෙන් ටෙන්ඩර් ආකෘති ලබා ගත යුතුයි. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ දවල් 12 වනතුරු ටෙන්ඩර් ආකෘති නිකුත් කරනු ලැබේ. මුදල් තැන්පත් කිරීම 5 වැනි ඡෙදයේ සඳහන් ස්ථානයක කළ යුතුය.

4. ටෙන්ඩර් ඉල්ලුම් පත් පිටපත් දෙකම, නියිසේ සම්පූර්ණ කර සීල් තබා, "සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලනය හ සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ල, ඩියුක් වීදිය, කොළඹ 1" යන ලිපිනයට ලියා පදිංචි කර එවිය යුතුයි. ලියුම් කවරයේ වම් කෙළවරේ (ගෝනි මිලට ගැනීමට බලාපොරොත්තු වන ගොවිපලේ නම පැහැදිලිව ලියා, ඉල්ලුම් කරුගේ ලිපිනය ද සඳහන් කරන්න.

5. තෝරාගත් කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා දින දහයක් ඇතුළත කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමෙන් සියයට 5ක් ඇප වශයෙන් පේරාදෙනියේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක නැතහොත් මහා භාණ්ඩාගාරයේ තැන්පත් කොට පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. පොරොන්දු පත්‍රයට අත්සන් කරනු ලබන්නේ කොළඹ 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ දී ය. ඇප මුදල තැන්පත් කර පොරොන්දු පත්‍රයට අත්සන් කළ වහාම ගෝනි මිලට ගැනීම ආරම්භ කළ හැකිය. තම තමන් විසින් මිල දී ලබා ගන්නා ලද ගෝනි දින 2ක් ඇතුළත ගොවිපලෙන් අස්කර ගත යුතුයි.

6. ටෙන්ඩරයකින් කොටසක් පමණක් පිළි ගැනීම හෝ සියල්ලම නිෂ්ප්‍රභා කිරීමේ බලය රජය වෙත පැවරේ.

7. ලියා පදිංචි කර එවන ඉල්ලුම් පත් ලැබුනු බව එදිනම ටෙන්ඩර් කරුවන් වෙත දන්වනු ලැබේ. ඉල්ලුම් කරුවන් කැමති නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. කොළඹ ඉහත සඳහන් ස්ථානයේ පිහිටි සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේදී එකී වේලාවට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

8. 1934 රේ, 19 වැනි අංකය දරණ කම්කරුවන්ගේ වන්දි ආඥා පනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

9. ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ පොරොන්දු පත්‍රයට අත්සන් කළ පසුයි. යම්කිසි විධියකින් නියමිත ඇප මුදල තැන්පත් නො කර හෝ පොරොන්දු පත්‍රයකට අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු කරනු නො ලැබුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කර ඔහුගේ නම දෙපාර්තමේන්තුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

10. කලින් නියම කර ගත් දිනක ඉහත සඳහන් ගෝනි පරීක්ෂා කර බැලීමට ගොවිපලේ කළමනාකාර තැනගේ සහාය ලබා ගත හැකියි. වැඩි විස්තර ඒ ඒ ගොවිපලේ කළමනාකාර තැනගෙන් දැන ගත හැකියි.

11. ගෝනි තෝරා වෙන් කර ගැනීමට ඉඩ දෙනු නො ලැබේ.

ඒ. ටී. ඇම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1964.12.5 වැනිද,
කොළඹ 1, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

12—499/2—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය

### කරඩියන් ආරු, රජයේ ගොවිපලේ පාවිච්චියට ගත නොහැකි ෆේපර්ඩිසන් මේජර් ට්‍රැක්ටරයක් විකිණීම සඳහා ටෙන්ඩර්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 ජනවාරි මස 1 වැනි දින පස්වරු 2.30 වන තෙක් පාවිච්චියට ගත නොහැකි ෆේපර්ඩිසන් මේජර් ට්‍රැක්ටරයක් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. පෝර්මකොළ පේරාදෙණියේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රුපියල් 25 ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ඒ. ටී. එම්. සිල්වා,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙණිය,
1964 දෙසැම්බර් මස 4 වැනි දින.

12–562—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### බෝල හණලනු සැපයීම

අංක 14,239 සහ 1964.11.27 දින දරණ ගැසට් පත්‍රයෙහි I වැනි කොටස, (II) ඡෙදයෙහි (පළකිරීම්) පළවී ඇති දැන්වීම සම්බන්ධවයි. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දිනයන්, ටෙන්ඩර් පත්‍ර බාරගැනීමේ දිනය සහ ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේ දිනය පහත සඳහන් අන්දමට වෙනස් කර ඇත :—

(අ) ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමේ කාල සීමාව :—
1964.11.30 දින සිට 1964.12.21 දින දවල් 12 දක්වා.

(ආ) ටෙන්ඩර් පත්‍රිකා බාරගැනීමේ අවසාන දිනය :—
1964.12.22 පෙ.ව. 10 දක්වා.

(ඇ) ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන දිනය සහ වේලාව :—
1964.12.22 දින පෙ.ව. 10ට.

ආර්. ඇල් ආනෝල්ඩ්,
වැඩ බලන පෝස්ට්මාස්ටර් ජනරාල්.

1964 දෙසැම්බර් 2 දින,
කොළඹ, ප්‍රධාන තැපැල් කාර්‍යාලයේදීය.

12–427—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිද දිවයින පුරා සියලුම වර්ගයේ බඩු ප්‍රවාහනය කිරීම සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තැන (බෙදාහැරීම) විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

1. කොළඹ සහ වැලිසර පිහිටි ස. තො. ස. ගබඩාවේ සිට දිවයින පුරා පිහිටි සතොස ගබඩාවෙකි.
2. දුම්රිය ගබඩාවන්හි සිට දුම්රිය ගබඩාවන් අසල පිහිටි සතොස ප්‍රාදේශීය ගබඩාවන්ට.
3. ප්‍රාදේශීය ගබඩාවන් සිට ප්‍රාදේශීය ගබඩාවන්ට අයත් ශාඛා ගබඩාවලට.

තෝරාගනු ලබන ටෙන්ඩර්කරුවන් අප සංස්ථාවේ ස්ථිර කොන්ත්‍රාත් කරුවන් ලෙස ලියාපදිංචි කරනු ලබන අතර ක්‍රමානුකූලව සේවයන්හි යොදවනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ හැකියාවන් අනුව ඉහත සඳහන් කුමන අන්දමේ ප්‍රවාහන සේවයකට හෝ සේවයන්ට ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය. මේ සම්බන්ධ සියලුම විස්තර ටෙන්ඩර් පත්‍රිකා සහ ටෙන්ඩර් කොන්දේසි යනාදිය, කොළඹ, මැකලම් පාරේ අංක 85, දරණ ස්ථානයේ පිහිටි ස. තො. ස. රථවාහන දෙපාර්තමේන්තුවේ, කළමනාකාරතැන ගෙන් ලබාගත හැකිය.

1964 දෙසැම්බර් මස 29 වෙනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

1964 දෙසැම්බර් මස 30 වෙනි දින අ. භා. 2 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වේ.

සාමාන්‍යාධිකාරී තැන (බෙද.හැරීම්).

සමුපකාර තොග වෙළඳ සංස්ථාව,
21, චොක්ෂෝල් වීදිය,
කොළඹ 2.

12–435—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## ගල්ඔය සීනි කර්මාන්තය

කොං / සන්වරේටඩ් සල්පරික් ඇසිඩ් සම්පාදනය කිරීම සඳහා ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පෝරම සහ ටෙන්ඩර් කොන්දේසි ඉරක්කාමම්, හිඟුරාණ, ගල්ඔය සීනි කර්මාන්තයේ ගබඩා අධිකාරී තැනගෙන් හෝ කොළඹ, බුලර්ස් පාරේ අංක 415 දරන ස්ථානයේ මණ්ඩලීය කායාලයෙන් හෝ ලබා ගැනීමට පුලුවන.

අම්පාරේ ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන නමට ටෙන්ඩර් පත් එවිය යුතු අතර ටෙන්ඩර් පත් භාර ගැනීම 1965 ජනවාරි මස 15 වෙනි සිකුරාදා සවස 2.15 ට අවසාන කරනවා ඇත. තමාගේ ටෙන්ඩරය ලැබුන බව ස්ථිරවම දැන ගැනීමට කැමති සියළුම ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවෙහිදී පැමිණ සිටීමට පුළුවන.

හිඟුරාණ,
1964.11.26 වෙනි දින

ගබඩා අධිකාරී,
ගල්ඔය සීනි කර්මාන්තය.

12–430—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## උඩවලවේ යෝජනා ක්‍රමය

1. විදින කටු වානේ අවශ්‍යතා—අවසාන දිනය 64.12.31

2. ගොඩනැගිලි උපකරණ සහ ජල සම්පාදන සවි කිරීම්—අවසාන දිනය 64.12.17.

3. ටැලිපෝන් සේවා සඳහා උපකරණ—අවසාන දිනය 64.12.30.

කොළඹ, බුලර්ස් පාරේ අංක 415, ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කායාලයේ උඩවලවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. එක එක විෂය ඉදිරියෙහි ඇති දින යන්හි අපරභාග 2.30 ට ටෙන්ඩර් අවසාන කරනවා ඇත.

ටෙන්ඩර් ආකෘති සහ කොන්දේසි කොළඹ 7, බුලර්ස් පාරේ අංක 415, ගල්ඔය සංවර්ධන මණ්ඩල කායාලයෙන් ලබා ගැනීමට පුළුවන.

ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවෙහි තමාගේ ටෙන්ඩරය ලැබී තිබෙන බවට තෘප්තිමත් වීම සඳහා ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර තිබේ.

සාමාන්‍යාධිකාරී,
උඩවලවේ යෝජනා ක්‍රමය,
ගල්ඔය සංවර්ධන මණ්ඩලය.

1964 දෙසැම්බර් මස 1 වෙනි දින,
කොළඹ.

12–431—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## පී. වී. සී. බහන් සැපයීමේ ටෙන්ඩර් සම්බන්ධවයි

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 19ංං ක් වූ පෙබරවාරි මස 16 වන අඟහරුවාදා පූ. භා. 10.00 දක්වා ඉඩම්, වාරි වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 1ංo ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්ම වලයි. වර්ෂ 1965 පෙබරවාරි මස 12 වන දින අ. භා. 2.00 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1965 ක් වූ පෙබරවාරි මස 16 වන අඟහරුවාදා පූ. භා. 10.00ට හැවු මූවදෙර මහා ලේකම් කාර්යාලයේ නො. 3ං5 ගේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබද අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඇස්. ඩබ්ලියු. පීරිස්,
වැඩබලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540, කොළඹ 10.
1964 ක් වූ දෙසැම්බර් මස 11 දින දී ය.

12–474—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**වවුනියා දිස්ත්‍රික්කයේ පාවට්කුලම් ව්‍යාපාරයේ ජනපද නිලධාරි නිවාසයක්, ඕවර්සියර් නිවාසයක් හා කාර්යාලයක් ඉදි කිරීම සඳහා ටෙන්ඩර්**

ඉහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 1965 ජනවාරි 8 වන දින පෙරවරු 11 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1965.1.7 වැනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක් අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කායාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. තැන්පත් මුදල ආපසු ඉල්ලන විට රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට නොඇමිණිය යුතුයි.

4. සියලු ටෙන්ඩර් කවරයන්හි වම්පස ඉහළ කෙළවරේ "පාවට් කුලම් ව්‍යාපාරයේ ජනපද නිලධාරී නිවාසයක්, ඕවර්සියර් නිවාසයක් හා කාර්යාලයක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම්පස පහළ කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාර දිය යුතුයි. එසේ නැතහොත් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 30ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැක.

6. ටෙන්ඩර්කරුවන් විසින් 1965 මැයි මස 30 වැනි දිනට ප්‍රථමයෙන් වැඩය නිම කළ යුතුයි.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු ගොඩනැගිලි සෑදීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුලත් වන්නේය.

8. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1965.1.8 වැනි දින දාවල් 11ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අඩුම ගණනේ රු. 25,000කට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූවන් පමණක් ටෙන්ඩර් කළ යුතුය. වැඩ සතුටුදායක ලෙස සම්පූර්ණ කළ බවට සෑහෙන සාක්ෂිද ඉදිරිපත් කළ යුතුය.

10. වැඩි විස්තර සඳහා ඉ: ස: අ: තැන විමසන්න.

සී. ද පොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1,
1964. .2. 5.

12–530—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## සංශෝධනය

"1964.11.27 වන දින පළ කරණ ලද රජයේ ගැසට් නිවේදනයේ 1746 සහ 48 යන පිටුවලද, 1561—62 සහ 63 යන පිටුවලද ප්‍රසිද්ධ කොට ඇති. 18.12.64 දින භාරගැනීම පිණිස නිවේදනය කොට තිබෙන මගේ 18.11.64 සහ 20.11.64 දින දරණ සිංහල සහ ඉංග්‍රීසි ටෙන්ඩර් දැන්වීම් පිළිවෙලින් පහත සඳහන් අයුරින් සංශෝධනය විය යුතු බැව් සියලුම ටෙන්ඩර්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ දිනය 18.12.64 නොව 17.12.64 දින බවත් ටෙන්ඩර් පත්‍ර මහනුවර අධ්‍යාපන කාර්යාලයෙන් නිකුත් කිරීමේ දිනය 17.12.64 නොව 16.12.64 දින බවත් දන්වන අතරම මුල් දැන්වීමේ සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සහ නිකුත් කිරීමේ වේලාවන් එසේම පවතින බවත් සිහිතබා ගත යුතුය.

යූ. බී. අයි. සිරිසේන,
මධ්‍ය ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක.

අධ්‍යාපන කාර්යාලය,
මහනුවර, 1964 ක් වූ දෙසැම්බර් මස 4 වෙනි දින දීය."

ම. ප්‍ර. ස. අ. අ. වෙනුවට.

අධ්‍යාපන කාර්යාලය,
මහනුවර, 1964.12.4.

12–484—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1965 ජනවාරි මස 1 වැනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2 මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාසැලේ නම | කළයුතු වැඩ. |
|---|---|
| 1. මාර/බෙරලපනාතර මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල |
| 2. මාර/මාකඳුර මහා විද්‍යාලයය | රසායනාගාර ගොඩනැගිල්ල. |
| 3. මාර/ගන්දර මහා විද්‍යාලයය | රසායනාගාර ගොඩනැගිල්ල. |

**සංලක්ෂය** :—මාර=මාතර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ රු. 100 ක තැන්පත් මුදලක් සඳහා කුවිතාන්සියක් මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 17,000 ට නොඅඩු ගණනකට ඉහත සඳහන් වැඩ අංක 1 සඳහා ද, රු. 26,000 ට නොඅඩු ගණනකට වැඩ අංක 2 සහ 3 සඳහාද ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති අයට 1964 දෙසැම්බර් මස 31 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 3 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. චෙක්පත් මුදල් ඕඩර්, ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසැල් ගොඩනැගිලි අංශයේ අධ්‍යාපනාධ්‍යක්ෂ වෙතින් හෝ මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ වෙතින් හෝ ලබා ගත යුතුයි. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචිවූ බවට සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතුයි.

3. පූර්වෝක්ත 2 වන ඡේදයේ නියමිත වශයෙන් දැක්වෙන මුදල් ප්‍රමාණයන් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචිවී තිබේ නම් මෙකී වැඩ සඳහා අනුමත කළ සමිති වලටද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිවේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණ ලබන හෙයින් ඔවුන්ගේ ටෙන්ඩර් එකී ෆෝර්මයේ ලියා ඉල්ලුම් කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කළ සමිති නිදහස්ය. යථෝක්ත දෙවන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් සමිතිවලට විශේෂ ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරණු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගතහැකිවූද ඔවුන්ගේ කාර්යාලයේදී සැලැස්මවල් බලාගත හැකිවූද මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂක ගෙන් පූර්වෝක්ත 2 සහ 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචිකළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. තැපැල් මඟින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2 මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචිකළ තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකැමැති වන්නේ නම් ටෙන්ඩර් කරුගේ විස්තර, නම ලිපිනය, සහ වැඩයේ විස්තර කවරයේ දැක්වෙන සේ සීල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝජිතයකු විසින් හෝ කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තුමා වෙත පුද්ගලිකව ඉදිරිපත් කොට එතුමාගෙන් ටෙන්ඩරය භාරදුන් බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. 1965 ජනවාරි මස 1 වැනි සිකුරාදා පස්වරු 2.30 ට කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරණු ලබන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලබන නිලධාරි තැන විසින් පැමිණ සිටින අයට ඇසෙන සේ ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිළ ගණන් ද කියවනවා ඇත.

6. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වන දින සිට සති හයක කාල පරිච්ඡේදයක් දක්වා තමන් විසින් ඉල්ලුම් කළ මිළ ගණන්වලට වැඩය භාරගැනීමට ටෙන්ඩර් කරුවන් කැමැතිවිය යුතුයි.

7. තවදුරටත් අවශ්‍ය විස්තර ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කිරීම පිණිස මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

8. උළු සෙවිලි කළ යුතු ගොඩනැගිලි වලට මෙරට උළු යෙදිය යුතුයි. මෙම උළුවල තරාතිරම නියත වශයෙන් දැනගැනීමට පරීක්ෂණයක් අවශ්‍ය වුවහොත් එය පැවැත්වීම සපයන්නාගේ වියදමෙන් ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය මඟින් කරගත හැකි වේ.

පී. ඊ. ජී. මැන්ඩිස්,
මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

1964 දෙසැම්බර් මස 5 වැනි දින,
මාතර අධ්‍යාපන කාර්යාලයේදීය.

12–527—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### විජේබාහුකන්ද, වීරකැටිය, නිකවැරටිය, සමන්තුරෙයි සහ කල්පිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය

විජේබාහුකන්ද, වීරකැටිය, නිකවැරටිය, සමන්තුරෙයි සහ කල්පිටිය නගරවල නළ මඟින් ජලය සැපයීමේ යෝජනා ක්‍රම පිහිටුවීම සඳහා, පළාත් පාලන කොමසාරිස් වෙතින් ලබාගත හැකි ආකෘති පත්‍ර වලින් වූ පිටපත් දෙකකින් යුක්ත මුද්‍රිත ටෙන්ඩර් පත්‍ර, 1965.1.27 වැනි දින පූ.භා. 9.30 දක්වා, කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාර ගනු ලැබේ. මෙදිනම පූ. භා. 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන් හට අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල කාමරයට පැමිණ සිටිය හැකිය.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965.1.20 වැනි දින අ. භා. 3 දක්වා නිකුත් කරනු ලැබේ. ඒවා එසේ නිකුත් කරනු ලබන්නේ රු. 1,50,000 කට නොඅඩු ජල කර්මාන්ත හා ජල ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව ඇති අයවළුන්හට, එකී ලියාපදිංචිවීම පිළිබඳව සාක්ෂි හා එක් එක් යෝජනා ක්‍රමය සඳහා රුපියල් 250 ක මුදලක් කොළඹ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ද ඉදිරිපත් කර සිටි විටය.

3. සියලුම ටෙන්ඩර් පත්‍රවල මුද්‍රා තැබිය යුතු අතර, එම කවරයේ ඉහළ වම් කෙළවරේ "විජේබාහුකන්ද, වීරකැටිය. නිකවැරටිය. සමන්තුරෙයි සහ කල්පිටිය සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් ඒ ඒ කාරණයේ හැටියට සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු හෝ එම කාර්යය සඳහා පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

ඩබ්ලිව්. ඩී. වී. මහතන්තිල,
පළාත් පාලන කොමසාරිස්.

1964 දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹ දී ය.

12–494—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### සිලිම් පංකා හා මේස පංකා සැපයීම සඳහා මිල ගණන්

56" සිලිම් පංකා 25ක් හා 12" මේස පංකා 12ක් සැපයීම සඳහා පහත සඳහන් අය විසින් 1964 දෙසැම්බර් මස 21 වැනි දින දහවල් 12 දක්වා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

මිල ගණන් ඇතුළත් කවරයෙහි "පංකා සැපයීම සඳහා මිල ගණන්" යන්න සඳහන් කළ යුතුය.

සභාපති.

ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
181, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2, 1964 දෙසැම්බර් 4 දින.

12–542—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

කොළඹ, මහලේකම් කාර්යාලයේ ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් පාලාවි දුම්රිය අංගනයේදී අඟල් 1½රේ කළුගල් කියුබ් 2,500ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ජනවාරි 6 වැනි දින බදාදා පෙරවරු 11 දක්වා බාරගනු ලැබේ. පසුදින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. අංක 370) මේ සඳහා පෝරම කොළ ලබාගෙන සම්පූර්ණකර අනු පිටපතක් සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙනයාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

1964 දෙසැම්බර් 23 වෙනි බදාදා පස්වරු 4 දක්වා ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 250 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු. 10ක්ද තැන්පත්කර ලබාගත් පිසිට්පත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1964 දෙසැම්බර් 5 වැනි දින,
කොළඹ දී ය,
තැ. පෙ. අංක 370.

12–577—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

කොළඹ, මහලේකම් කාර්යාලයේ ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් මදුරන්කුලි දුම්රිය අංගනයේදී අඟල් 1½රේ කළුගල් කියුබ් 2,500ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ජනවාරි 6 වැනි දින බදාදා පෙරවරු 11 දක්වා බාරගනු ලැබේ. පසු දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. අංක 370) මේ සඳහා පෝම් කොළ ලබාගෙන සම්පූර්ණකර අනු පිටපතක් සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

1964 දෙසැම්බර් 23 වෙනි බදාදා පස්වරු 4 දක්වා ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 250 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු. 10 ක්ද තැන්පත්කර ලබාගත් පිසිට්පත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1964 දෙසැම්බර් 5 වැනි දින,
කොළඹ දී ය,
තැ. පෙ. අංක 370.

12–575—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

කොළඹ තැ. පෙ. අංක 500, පරණ මහ ලේකම් කාර්යාලයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ලියාපදිංචි වී ඇති ටෙන්ඩර් කරුවන්ගෙන් කොළඹ සිට මරදානේ (කැළණි වැලි) බඩු ගබඩාවන්හි සහ පැති මාර්ගයන්හි, 1965.2.1 වෙනි දින සිට 1965.9.30 වෙනි දින තෙක් ඇති අට මසක කාල සීමාව තුළ බඩු පැටවීමේ සහ බෑමේ සේවාව උදෙසා 1964.12.30 වෙනි දින පෙ. ව. 11 වන තෙක් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

කොළඹ තැ. පෙ. 355, දුම්රිය කාර්යාලයේ වාණිජ අධිකාරීගෙන් සියළු විස්තර සහ තොරතුරු ලබාගත හැකිවන් හැර, 1964.12.28 වෙනි දින ප. ව. 3 වන තෙක් ඔහුගෙන් ලබාගත හැකිවූ ආකෘති පත්‍රවල (දෙපිටපතකින් යුතුව) ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

12–579—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව— රත්මලාන

කොළඹින් දකුණේ පිහිටි නගරවල ජලසම්පාදන යෝජනා ක්‍රමයේ දෙවැනි පියවර සඳහා සේවක නිවාස 9 ක් සහ ගරාජ් 2 ක්ද තැනීම පිණිස එවනු ලබන ටැන්ඩර් පත්‍ර, කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටි පළාත් පාලන හා සවදේශ කටයුතු අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් වර්ෂ 1965 ජනවාරි මස 29 වැනි සිකුරාදා පෙරවරු 10.30 දක්වා බාරගනු ලැබේ. ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන වේලාව වන එදිනම පෙරවරු 10.35 ට ටැන්ඩර් ඉල්ලුම් කරුවන්ට පැමිණ සිටිය හැකිය.

2. මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාන හා නඩත්තු පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ටැන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන පිටපත් දෙකකින් යුතුව ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධව සියළු විස්තර හා තොරතුරුද ඔහුගෙන් ලබාගත හැකිවන අතර ඒ පිළිබඳ වූ සැලැස්මද එකී කාර්යාලයේදී බලා ගත හැකිය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවක හෝ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,50,000 අඩු නොවන ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් පමණක් පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් ටැන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සන් වන්නෝය.

(අ) ලියා පදිංචිය පිළිබඳ සාක්ෂි.
(ආ) ටැන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 250 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය.

මේවා 1965 ජනවාරි මස 15 වැනි සිකුරාදා දහවල් 12 ට ප්‍රථම ඉහත සඳහන් ප්‍රධාන ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. ටැන්ඩර් තැන්පත් මුදල රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

ආර්. වී. පෙරුමසිනාර්,
ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ වෙනුවට.

1964 දෙසැම්බර් 6 වැනි දින,
රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන
දෙපාර්තමේන්තුවේදීය.

12–578—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ප්‍රවෘත්ති මුද්‍රණ කඩදාසි සඳහා මිල ගණන් කැඳවීම

22½" × 35"/ග්‍රෑම් 50/52 වර්ග මීටර් ප්‍රමාණයේ සුදු ප්‍රවෘත්ති මුද්‍රණ කඩදාසි රීමකට කොළ 500 ක් වශයෙන් සැපයීමට විදේශීය නියෝජකයන්ගෙන් කෙළින්ම ඉල්ලීම් කැඳවනු ලැබේ. ටොන් 500 බැගින් 1965 ජනවාරි හා පෙබරවාරි මාසවල ලැබීම සඳහා ඒවා නොකඩගත කළ යුතුය. ගෙවීම් ක්‍රමය නයවර ලිපි මගිනි.

ලියන ලද ඉල්ලීම් සීල් තබන ලද කවරයක බහා " ප්‍රවෘත්ති මුද්‍රණ කඩදාසි සැපයීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කොට සභාපති, නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, 70, යෝක් වීදිය, කොළඹ 1, ලංකාව යන ලිපිනයට 1965 ජනවාරි 5 දිනට ප්‍රථම ලැබෙන්නට සැලැස්විය යුතුය. කේබල් ඉල්ලීම් " එපෙම්කෝප් " කොළඹ, ලංකාව යන ලිපිනයට එවිය යුතුය.

ඔබගේ ඉල්ලීම් එවන අවසාන දිනයේදී සැම්පලයක්ද එවිය යුතු බව කරුණාවෙන් සලකන්න.

සභාපති,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

70, යෝක් වීදිය,
කොළඹ 1,
1964 දෙසැම්බර් 7 දින.

12–594/1—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

පහත සඳහන් සේවයන් සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

(1) රජයේ මුද්‍රණාලයේ හා අනිකුත් ස්ථානවල ඉවත ලන ලද කඩදාසි වාලච්චකේට ගෙන යෑම සඳහා දුම්රිය ඔබු පෙට්ටි වලට, මිටි බැඳ ප්‍රවාහනය හා පැටවීම සඳහා.

(2) නිමවූ බඩු ලොරිවලින් බා රජයේ ගබඩාවෙහි හා රජයේ මුද්‍රණාලයෙහි අඩුක්කු කිරීම සඳහා.

කම්කරු ගාස්තු හා අනිකුත් දේ ඇතුළුව ටොන් එකකට අයකරන මිල ගණන 1964.12.29 දින අ. භා. 2 ට පෙර " ඉවත ලන ලද කඩදාසි මිටි බැඳීම හා ප්‍රවාහනය කිරීම සඳහා මිල ගණන් කැඳවීම " යනුවෙන් සඳහන් කර සීල් තබන ලද මිල ගණන් නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුය.

සභාපති,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. 70, යෝක් වීදිය,
කොළඹ 1,
1964 දෙසැම්බර් 5 දින.

12–594/2—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : ඇෆ්. ටී. බී. 50/63.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### වෛද්‍ය ආයුධ සඳහා විෂබීජ නාශකයන් (ස්ටරිලයිසර්ස්) සැපයීම සඳහා ටෙන්ඩර්

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට වෛද්‍ය ආයුධ සඳහා විෂබීජ නාශකයන් (ස්ටරිලයිසර්ස්) සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 මාර්තු 23 වෙනි අඟහරුවාද උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ, පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි, 6 වැනි ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1965 මාර්තු 22 වෙනි සඳුදා උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය ආමාත්‍යාංශය, තැ.පෙ. 500 පළමුවෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලුමුවදොර, කොළඹ, යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ " වෛද්‍ය ආයුධ සඳහා විෂබීජ නාශකයන් (ස්ටරිලයිසර්ස්) සැපයීම සඳහා ටෙන්ඩර් 1965 මාර්තු 23 දින උදේ 10 ට " යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර්පත් ගාලු මුවදෙර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍ය යයි හැඟේ නම්, සීල් තබන ලද ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැනටවත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ භාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහා ද යනවග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු වේ. එම ටෙන්ඩර්පත් බාර ගැනීම සඳහා ඉහත කී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. (අ) සුප්‍රසිද්ධ නිශ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිශ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කල යුතුවේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ). හෝ,

(බී) කොළඹ කච්චේරියෙන් පිට ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ මුදලින් රු. 100 ක් මගේ නමට තැන්පත් කල බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල විටද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් සරනු ලැබේ.

6. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඔස්ට්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවෙකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, ආදී රටවල් වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත් ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලබා ඇත්තේ විය යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර පහත සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘතිපත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතකල හැක්කේ ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡෙදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින් ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිශ්පාදක මූලික වරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්තානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන

සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හන්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව (බොම්බායේ) සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින්ගෙන්.

10. මෙහි 1 වැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර් කරුවෙකුට ම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

ආර්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
355, ඩීන්ස්පාර, කොළඹ.
1964 දෙසැම්බර් 5 වැනි දින.

## අදල උපලේඛනය

| විෂය අංකය | වර්ගය | ඇස්තමේන්තු කරණ ලද අවශ්‍ය ප්‍රමාණය | | අවශ්‍ය ඇණවුම |
|---|---|---|---|---|
| (1) | ආයුධ සඳහා විදුලි විෂබීජ නාශකයන් (ස්ටරිලයිසර්ස්) ප්‍රමාණය 11" × 5½" × 4"<br>අමතර කොටස් : ස්ටෙරිලයිසර්ස් 90<br>හීටින් ඇලිමන්ට් සම්පූර්ණ කට්ටල 24ක්, ඕවර්හීට් ආරක්ෂක සුවිච් 12 යි, තමොස්ටික් සුවිච් 12 යි. | 90 ක් පමණයි | ... | ඕනෑම සුදුසු ඇණවුම් ක්‍රමයක |
| (2) | ආයුධ සඳහා විදුලි විෂබීජ නාශකයන් (ස්ටරිලයිසර්ස්) ප්‍රමාණය 14" × 6½" × 5"<br>අමතර කොටස් : ස්ටෙරිලයිසර්ස් 20<br>හීටින් ඇලිමන්ට්ස් සම්පූර්ණ කට්ටල 8 ක් ඕවර්හීට් ආරක්ෂක සුවිච් 4 යි, තමොස්ටික් සුවිච් 4 යි. | 20 ක් පමණයි | ... | එම |
| (3) | ආයුධ සඳහා විදුලි විෂබීජ නාශකයන් (ස්ටරිලයිසර්ස්) ප්‍රමාණය 20" × 10" × 7"<br>අමතර කොටස් : ස්ටෙරිලයිසර්ස් 100<br>සම්පූර්ණ හීටින් ඇලිමන්ස් කට්ටල 24ක්, ඕවර් හීට් ආරක්ෂක සුවිච් 12 යි, තමොස්ටික් සුවිච් 12 යි. | 100 ක් පමණයි | ... | එම |

### වෛද්‍ය ආයුධ සඳහා විෂබීජ නාශකයන්ගේ (ස්ටරිලයිසර්ස්) විස්තර

මෙම විදුලි විෂබීජ නාශකයන් ඉහත සඳහන් කරන ලද විදුලි බල ප්‍රමාණයට හා ඉහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුක්ත විය යුතුයි.

ඇනස්තටික් වාශ්ප පිපිරීමට තරම් තද නොමැති වායු ගුණයක් පවතින ආයතනයන්හි ප්‍රයෝජන සඳහා මෙම ස්ටරිලයිසර්ස් අවශ්‍යය. සම්පූර්ණ විස්තර පහත සඳහන් අයුරු වේ :—

(ඒ) ද්‍රව්‍ය : මෙම ස්ටරිලයිසර්ස් සෑදීමට ගන්නා ද්‍රව්‍ය හා එහි පියන සහ පෙට්ටිය සෑදීම සඳහා බී.ඇස්. 2904 : 1957 වර්ගයේ ලෝහය ප්‍රයෝජනයට ගත යුතුවේ.

(බී) පියන : එහි පියන පැතලි හෝ අර්ධ ගෝලාකාරව ශක්තිමත්ව සවිකර තිබිය යුතු අතර, ජලය බවට හැරුණු වාශ්ප නැවත බොයිලේරුවට වැටෙන අයුරු තෙරු ගැටීමක් ද පියනෙහි තිබිය යුතු වේ. තවද ඇල්ලීම සඳහා රශ්මිය නොවදින සේ ආවරනය කරන ලද අඬුවක්ද සවිකර තිබිය යුතුයි. විවෘත කළ විට පියන වඩා පිටුපසට යෑම වැලැක්වීම සඳහා අවයක් තිබිය යුතු වේ.

(සී) සවිකිරීම : ස්ටරිලයිසරය අතින් පිරවීමට සුදුසු පරිදි හා ලොකු හිලක් සහිත ඩරේන් වැල් එකකින් ද, ගලවා නැවත සවිකිරීමට හැකි නයිලෝන් වොෂර්ද තිබිය යුතුයි. මෙම ඩරේන් වැලය පහසු සුද්ධකළ හැකි පරිදි ක්‍රමයක විය යුතු අතර එහි උණුසුම නොවදින සේ ආවරණය කරන ලද අඬුවක් ද සවිවිය යුතුවේ. මෙම සවිකිරීම් සියල්ලම බී.ඇස්. 2904 : 1957 විය යුතුවේ. වැල් සියල්ල ම ක්‍රෝමියම් ගානලද ඒවා විය යුතුවේ. මෙම ස්ටරිලයිසරය සමග උණුසුම නොවදින පරිදි ආවරණය කරණ ලද ද්‍රව්‍යයන් අඩි 4 ක් ද තිබිය යුතුවේ.

(ඩී) ඇතුළත සවිකිරීම් : මෙම ස්ටරිලයිසරය සමග මල නොබැඳෙන කම්බි දැලකින් සෑදූ කූඩයක් හෝ හිල් විදින ලද තහඩුවක් ද සැපයිය යුතුවේ. වතුර ගලායෑමට බොයිලේරුවේ උඩ මෙම බාස්කට් රඳවා ගැනීම සඳහා ආධාරකාරී දෙයක් සවිකර තිබිය යුතුයි.

(ඊ) උණුසුම් කිරීමේ උපකරණය : මෙයට උණුසුම් ඇතිකිරීම සඳහා ගන්නා ලද මූලික ද්‍රව්‍ය ඉතා උසස් වර්ගයෙන් තිබිය යුතු අතර ඊට සම්බන්ධ කරන ලද කම්බි ලණුවෙන් විදුලි ලැබෙන අයුරු පිළියෙල වූවක් විය යුතුවේ. එම උණුසුම ඇතිකිරීමේ ද්‍රව්‍ය එහි ඇති ලෝහ කොටසට තදින් අල්ලා ගැනීමෙන් ස්ථිර තමෝල් ක්‍රියා කාරීත්වයක් ඇති කරන පරිදි සකස් වූ තදින් අල්ලා ගන්නා සුලු වර්ගයෙන් විය යුතුවේ. ඒවා පහසුවෙන් ගලවා නැවත සවිකිරීමට හැකිවිය යුතුයි. ක්‍රියාකාරී අවස්ථාවේ දී මෙම ද්‍රව්‍යයන්, ස්ටරිලයිසරයේ ඇති වැඩි වතුර යෑමෙන් ආරක්ෂාවන පරිදි විය යුතුයි.

(එෆ්) ආරක්ෂක උපක්‍රමය : ස්ටරිලයිසරයේ වතුර හිඳී යෑමෙන් පසුන් රත්වීම වැලැක්වීම සඳහා රිසැට් සුවිච් වර්ගයක් හෝ තර්මොස්ටික් සුවිච් වර්ගයක් ආරක්ෂක උපක්‍රමයක් වශයෙන් තිබිය යුතුවේ. මෙම උණුසුම දෙන උපකරණය, උණුසුම් ක්‍රම දෙකකට පාලනය විය යුතුයි. වතුර උතුරන තත්වයට පැමිණීමෙන් පසු මෙම රත්වීමේ උපකරණයේ කොටසක ඇති තර්මොස්ටෙට් සුවිච් එක නිවී යෑම සිදුවිය යුතුවේ.

(ජී) සම්බන්ධය : ස්ටරිලයිසර්ස් වලට විදුලිය සැපයීම සඳහා මධ්‍යභාග 3 ක නැමෙන සුලු ලණුවක් සැපයිය යුතුවේ. මෙයින් එක් මධ්‍ය භාගයකින් එකක් පොලව හා සම්බන්ධ විය යුතු අතර, ස්ටරිලයිසරයේ පිටත ඇති සෑම ලෝහයකම ඇති විදුලිය සමග සම්බන්ධයක් තිබිය යුතුයි. මෙම කේබලය දිග යටත් පිරිසෙයින් දිගින් අඩි 6ක් වත් තිබිය යුතු අතර ඒ සමග විදුලි ප්‍රමාණය අනුව ඇම්පියස් 5 හෝ 15 ප්‍රමාණයේ පින් 3 නේ ප්ලග් එකක් ද සැපයිය යුතුවේ.

(එච්) පොදු : මෙම භාණ්ඩය සාමාන්‍යයෙන් බී.ඇස්. 2904 : 1957 වර්ගයෙන් සම්පූර්ණ විය යුතුයි.

(අයි) සම්මත ප්‍රමාණය හා පැටවීම : සම්මත ප්‍රමාණය සහ පැටවීම මේ ආකාරයට විය යුතුයි :—

ප්‍රමාණය—11" × 5½" × 4"—වොට්ස් 900—ඇම්. 5 ප්ලග් එකකින් යුත් කේබලයක් සවිකල යුතුයි.
ප්‍රමාණය—14" × 6½" × 5"—වෝට්ස් 1,200—ඇම්පියස් 5 ප්ලග් එකක් සහිත කේබලයක් සවිකල යුතුයි.
ප්‍රමාණය—20"—10"—7"—වෝට්ස් 2,400—ඇම්පි. 15 ප්ලග් එකක් සහිත කේබලයක් සවිකල යුතුයි.

(ජේ) මෙම ස්ටරිලයිසරය වෝල්ට්ස් 230 × 6% සයිකල් 50 එක ෆේස් සැපයීම අනුව ප්‍රයෝජනයට ගත හැකි පරිදි සුදුසු එකක් විය යුතුයි.

(කේ) අවසානය : ස්ටරිලයිසරය සහ රත්කරණ උපකරණයේ පිටත තද නිකල් ගා තිබිය යුතු අතර ස්ටරිලයිසරයේ පිටත හොඳින් මැද තදින් ක්‍රෝමියම් ගා තිබිය යුතුවේ.

බාරදීමේ ක්‍රමය : මෙම සැපයීමේ සම්පූර්ණ තොගය ඇනයුම් කළ දින සිට මාස 2 ක් ඇතුළත දී කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට එක තොගයෙන් ම ගෙනැවිත් බාර දිය යුතු වේ. ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස රජයෙන් ඉල්ලා සිටින්නේ නම් මෙම සැපයීමේ ඇණවුම් හා අනිකුත් සියලුම ගාස්තු සහිතව, මිල සහ කොළඹට ගෙනඒමේ ගාස්තු සහිතව මිල, භාණ්ඩ නිශ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතුවේ.

නාවික මාරු කිරීම්වලට අවසර දෙනු නොලැබේ.

මෙම සැපයීමේ සියලු ම භාණ්ඩයක ම සහ භාණ්ඩ බහා ඇවන සෑම භාජනයකම " ඔටුන්න ලකුණ " සහ " සී/සීඇම්ඇස්. 2027-63/64 " යනුවෙන් සඳහන් කර තිබිය යුතුවේ.

12-581—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1965 ජනවාරි 1 වනද සිට 1965 දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම ඇතුළත් ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමු වන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කළුතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිතී ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, මාතලේ, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි වෙත " ට කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැම්මෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරණ මිළ ගණන් සඳහන් කළ යුතු යි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම්, ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම අළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම, පිළිපැදිය යුතුද වන්නේ ය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

ඇෆ්. සී. ස්පිටල්,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි.

1964 දෙසැම්බර් 3 වැනි දින,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දීය.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | (3) ඇප මුදල රු. ශ. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාළු | සේවකයින්ට: මස් | සේවකයින්ට: කරවල | සේවකයින්ට: එළවළු | රෝගීන්ට: මාළු | රෝගීන්ට: මස් | රෝගීන්ට: කරවල | රෝගීන්ට: එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පනාපිටිය මාතෘ නිවාසය | 100 0 | 200 0 | 64.12.21 | 92 | 92 | 96 | 385 | 21 | 13 | 13 | 67 |

12-398—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ගාල්ල කොට්ඨාශය කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1965 ජනවාරි 1 වෙනිද සිට 1965 දෙසැම්බර් 31 වනද දක්වා කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැති පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කලුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන ෆොනම් ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි ත්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උප ලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල" කියා එවිය යුතුයි" සිල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ට ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළහැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත්‍ර තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

ඒ. නාගෙන්ද්‍රන්,
සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල.

1964 දෙසැම්බර් මස 1 දින, ගාල්ලේ
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු: | (3) ඇප මුදල රු: | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට — මාළු | සේවකයින්ට — මස් | සේවකයින්ට — කරවල | සේවකයින්ට — එළවළු | නොගෙවන රෝගීන්ට — මාළු | නොගෙවන රෝගීන්ට — මස් | නොගෙවන රෝගීන්ට — කරවල | නොගෙවන රෝගීන්ට — එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අහංගම ග්‍රාමීය රෝහල ... | 100 | 400 | | 150 | 150 | 150 | 600 | 500 | 550 | 550 | 2,150 |
| බටපොල ග්‍රාමීය රෝහල | 100 | 600 | 64.12.29 | 50 | 50 | 50 | 250 | 400 | 350 | 400 | 1,500 |
| හබරාදුව ග්‍රාමීය රෝහල | 100 | 600 | පෙ.ව.10.00 | 100 | 150 | 150 | 550 | 550 | 550 | 550 | 2,250 |
| හබුරුගල මාතෘ නිවාසය | 100 | 300 | | 100 | 100 | 100 | 450 | 100 | 100 | 100 | 450 |
| තෙලුව මාතෘ නිවාසය ... | 100 | 300 | | 150 | 100 | 150 | 600 | 200 | 200 | 200 | 900 |

12–350—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ-නුවර පාරේ 49 සහ 50 සැතපුම්වලට "සීල්කෝට්" වැඩ සඳහා අඟල් ¾ ගල් කියුබ් 115ක් සහ අඟල් ½ ගල් කියුබ් 70ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 ජනවාරි මස 27 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ. එදිනට පස්වරු 2.30ට අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේදී ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

2. කෑගල්ලේ ර. වැ. දෙ. විධායක ඉංජිනේරු කායඹාලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්‍ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර විධායක ඉංජිනේරු තැන ගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතනවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන, නිදර්ශන: චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති සහ,

(ඈ) සමූපකාර සමිති රෙජිස්ත්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1965 ජනවාරි 22 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. ටැන්ඩර් ඉදිරිපත් කිරීම ලාංකිකයින්ට සහ ලාංකික වෙළඳ සහ අනිකුත් සමාගම්වලට සීමා කර තිබේ.

ඈස්. සෙල්ලදුරේ,
රජයේ වැඩ අධ්‍යක්‍ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1964.12.7.

12–572—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කළුතර රෝහලේ ඇඳන් 69 ක මාතෘ වාට්ටුවක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, විරාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 ජනවාරි මස 20 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කළුතර ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 දෙසැම්බර් මස 24 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,68,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්‍ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේදීය,
1964.12.7.

12–576—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1964 නොවැම්බර් මසතුළදී පිළිගත් ටෙන්ඩර්**

| | සේවය | ටෙන්ඩර් | සාර්ථක වූ ටෙන්ඩර්කරු | පිළිගත් ගාස්තුව රුපියල් |
|---|---|---|---|---|
| 1. | ගැලොම් 1,000ක ධාරිත්වය ඇති ඩීසල් ඇන්ජින්වලින් ක්‍රියා කරන පොම්ප 4ක් සැපයීම | 4 ... | සීමාසහිත බ්‍රවුන් සහ සමාගම, තැ. පෙ. 200, කොළඹ ... | 20,400 |
| 2. | විදුලි බලයෙන් පාස්සන පරිවර්තක 2ක් සැපයීම ... | 2 ... | හැරිසන් ලිස්ටර් ඇන්ජිනියරිං, තැ. පෙ. 69, කොළඹ ... | 3,930 |
| 3. | බුස්සේ ඉඩම් සංවර්ධන වැඩ පොලෙහි විදුලි ස්ථාපනය ... | 9 ... | ශ්‍රී ලංකා විදුලි කාර්මිකයින්ගේ සමූපකාර කම්කරු සමිතිය, 52–2/1, මැලිබන් වීදිය, කොළඹ | 2,096 |

12–531—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

### කොළඹ වරාය කොමිෂන් සභාව

**1964 රේ මැයි සිට නොවැම්බර් දක්වා මාසවල ටෙන්ඩර් ප්‍රතිඵල**

| | සැපයීම | ලැබුණු ටෙන්ඩර් ගණන | ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ |
|---|---|---|---|---|
| 1. | පාවිච්චි නොකළ හැකි බඩු විකිණීම ... | 9 ... | ඩී. ඇම්. උපනන්ද ... | විෂයයන් 12 සහ 23 පිළිවෙළින් රු. 23 සහ රු. 31 ගණනේ |
| | | | ඇමල්ගමේටඩ් කොන්ස්ට්‍රක්ෂන් සහ ඩිවෙලොප්මන්ට් සමාගම | 9 විෂයය රු. 3,611 |
| | | | අයි. කේ. සොලමන් පෙරේරා ... | 19 විෂයය රු. 27 |
| | | | වී. ලෝගනාදන් ... | 21 විෂයය රු. 50 |
| | | | ඇස්. රාමනාදන් ... | විෂයයන් 3, 8, 10, 14, 17, 20 පිළිවෙළින් රු. 77.75, රු. 287.35, රු. 26.55, රු. 7.55, රු. 7.25, රු. 9.55 |
| | | | කේ. පෙරේරා ... | 1 විෂයය රු. 276, 2, 4, 5, 6, 7, 11, 13, 14, 15, 16, 18, 22, 24, සහ 25 යන විෂයයන් ප්‍රතික්ෂෙප කරන ලදී |

| සැපයීම | ලැබුණු ටෙන්ඩර් ගණන | ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ |
|---|---|---|---|
| 2. මාතර පොල්හේන වෙරළට කළුගල් 1,500 ක් සහ කැලි ගල් කියුබ 40 ක් සැපයීම | 1 ... | අයි. ජී. ප්‍රේමදාස ... | ටොන් 1/2 සිට ටොන් 1 දක්වා ඇති ගලක් රු. 13.40 ගණනේද අඟල් 9-12 සහ අඟල් 4-6 කැලි ගල් කියුබ එකක් රු. 39 ගණනේ |
| 3. තෙල් කඹ සැපයීම ... ... | 6 ... | සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරණ ලදී | |
| 4. කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් සැපයීම ... | 22 ... | සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරණ ලදී | |
| 5. ටොන් 40 ට්‍රේලරයක් සහ ට්‍රක් එකක් සැපයීම | 11 ... | බ්‍රිටිෂ් ට්‍රේලර් සහ සමාගම ... | ට්‍රේලරය—පවුම් 3870 |
| | | සීඩාන් ඩීසල් විහිකල් සමාගම ... | ට්‍රක් එක—පවුම් 5339 |
| 6. වරාය පෝමන් සඳහා ලෝන්ච් යාත්‍රාවක් සැපයීම | 3 ... | සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරන ලදී | |
| 7. ගාලු වරායට කැලිගල් කියුබ 6,000 ක් සැපයීම | 2 ... | ඇල්. එච්. සැම්සන් ද සිල්වා ... | I විෂයය—රාත්තල් 28 සිට හොණ්ඩරය දක්වා බර ඇති කැලි ගල් කියුබ එකක් රු. 34 ගණනේ II විෂයය—හොණ්ඩරයට වඩා බර ඇති කැලි ගල් කියුබ එකක් රු. 27 ගණනේ |
| 8. ගාලු වරායට ගංගා වැලි කියුබ 2,000 ක් සැපයීම | 2 ... | ඇල්. එච්. සැම්සන් ද සිල්වා ... | කියුබ එකක් රු. 24.10 ගණනේ |
| 9. ගාලු වරායට ටොන් 3–4 රේ කළුගල් 750 ක් සහ ටොන් 4 ට වැඩි කළුගල් 750 ක් සැපයීම | 2 ... | ඇල්. එච්. සැම්සන් ද සිල්වා ... | ටොන් 3–4 කළුගලක් රු. 75 ගණනේ සහ ටොන් 4 ට වැඩි කළුගලක් රු. 90 ගණනේ |
| 10. ලොරි දෙකක් සහ වෑන් දෙකක් සැපයීම | 9 ... | වෝකර් පුත්‍රයෝ ... සමූපකාර තොග වෙළඳ ආයතනය | ලොරි දෙක එක ලොරියක් රු. 19,900 ගණනේ වෑන් දෙක, වෑන් එකක් රු. 16,000 ගණනේ |
| 11. කප්පරතොටට කැලි ගල් සහ කළුගල් සැපයීම | 1 ... | අයි. ජී. ප්‍රේමදාස ... | අඟල් 9–12 සහ අඟල් 4–6 කැලිගල් කියුබ එකක් රු. 39 ගණනේ සහ ටොන් ½ සිට ටොන් 1 ගලක් රු. 17 ගණනේ |
| 12. පෝක්ලිප්ට් ට්‍රක්ස් 2 ක්, ටෝ මෝටර්ස් 2 ක් සහ ජංගම දොඹකරයක් සැපයීම | 15 ... | මැගිනා මෝටර්ස් ... | I විෂයය—පෝක්ස්ලිප්ට් ට්‍රක්ස් දෙකක්, එකක් රු. 25,980 ගණනේ ගබඩාවට බාරදීමට |
| | 8 ... | ක්‍රවුන් ඒජන්තවරුන් මගින් මර්කරි ට්‍රක්ස් සහ ට්‍රැක්ටර් සමාගම | II වන විෂයය—ටෝ මෝටර්ස් දෙකක් සැපයීම, එකක් නැව් කුලී ඇතිව රු. 22,153 ගණනේ |
| | 14 ... | ක්‍රවුන් ඒජන්තවරුන් මගින් බ්‍රිටිෂ් ක්‍රෙන් සහ එක්ස්කැවේටර් කෝපරේෂන් | III විෂයය—ජංගම දොඹකරය නැව් කුලී ඇතුළුව රු. 2,04,748.80 |
| 13. වෑන් 6 ක් සහ ලොරි 4 ක් සැපයීම ... | 6 ... | කොලට්ස් සමාගම ... | I වන විෂයය—වෑන් 3 ක් එකක් රු. 13,300 ගණනේ ගබඩාවට භාරදීමට |
| | 7 ... | ක්‍රවුන් ඒජන්තවරුන් මගින් ඔස්ටින් සමාගමෙන් | II වන විෂයය—වෑන් එකක් නැව්කුලිය ඇතිව පවුම් 816 |
| | 8 .. | වකර්ස් සමාගම ... | III විෂයය—ලොරි 2 ක් සැපයීම එකක් රු. 16,833.83 ගණනේ ගබඩාවට භාරදීමට |
| 13. වෑන් 6 ක් සහ ලොරි 4 ක් සැපයීම | 9 ... | ක්‍රවුන් ඒජන්තවරුන් මගින් තෝර්ඩ්ස් සමාගම | IV විෂයය—ටිපින් ලොරි දෙකක්, එකක් නැව් කුලී ඇතිව රු. 24,400 ගණනේ |
| | 10 ... | ක්‍රවුන් ඒජන්තවරු මගින් වොක්ස්හෝල් මෝටර්ස් | V විෂයය—යුටිලිටි වෑන් දෙකක් නැව් කුලී ඇතිව, එකක් රු. 10,403 ගණනේ |

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1964 දෙසැම්බර් 2 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

12–560—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

හල්මිල්ල, පානක්කා, රාන, හුලංහික් ආදී කොටගත් කඳන් 60 කින් සමන්විත ඝන අඩි 672.8 කින් යුත් දැව තොගයක් ගොඩවල් 12 කට වෙන් කර 1964 දෙසැම්බර් මස 23 වෙනි බදාදා උදය 10 ට කල්මුනේ මධ්‍යම දැව ගබඩාවේදී නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසියට පෙර පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මගෙන් හෝ කල්මුනේ මධ්‍යම දැව ගබඩාවේ ගබඩාකරුගෙන් විමසන්න.

වී. රා. නානායක්කාර,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරී.

1964 දෙසැම්බර් 2 වැනි දින,
මඩකලපුවේ දිසා කැලෑ කාර්යාලයේදීය.

12–549—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීම

පහත උපලේඛනයේ සඳහන් බුරුත, හල්මිල්ල, රාණි හා පලු යන I, II, හා III පංතීන්ට අයත් කඳන් හා ඉරූ දව මෙහි දක්වා ඇති දිනයන්හි හා ස්ථානයන්හි දී උතුරු මැද දිසා භාර කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වැඩි විස්තර මගෙන් හෝ අඩවි වන නිලධාරින්ගෙන් හෝ ගබඩා පාලකයින්ගෙන් හෝ පැමිණ ලබාගත හැක.

ජ. ආ. ද සිල්වා,
දිසා කැලෑ නිලධාරි, (උ.මැ.දි.).

1964 නොවැම්බර් මස 28 දින,
ත්‍රිකුණාමලයේ දිසා වන කාර්‍යාලයේ දීය.

### උපලේඛනය

| වෙන්දේසි කරන ස්ථානය | දව විස්තර | දිනය හා වේලාව |
|---|---|---|
| දව ගබඩාව, වීනවරාය ... | ... I හා II පන්තිවල ඉරූ දව තොග 3යි, ඝන අඩි 296·9 ... ... | 64.12.23 පෙ.ව. 9.30 |
| අඩවි වන කාර්‍යාලය, අනුරාධපුරය | ... I, II හා III පන්තිවල කඳන්, තොග 7යි, ඝන අඩි 64.2යි, තේක්ක රිටි තොග 1යි, ඝන අඩි 4.7යි | 64.12.21 පෙ.ව. 10.00 |
| දව ගබඩාව, මැදවච්චිය ... | ... I හා II පන්තිවල ඉරූ දව, තොග 10යි, ඝන අඩි 798.9යි, කඳන් තොග 3යි, ඝන අඩි 237.9යි. | 64.12.21 ප.ව. 2.30 |

12–557—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසියේ විකිණීමයි

කැලෑ දෙපාර්තමේන්තුවේ දකුණු දිශාව භාර කැලෑ නිලධාරි විසින් බූස්සේ මධ්‍යම දැව ගබඩාවෙහි තිබෙන පළමුවැනි දෙවැනි සහ තුන්වැනි පංතියේ ඉරූ පු ලී, කඳන්, පිටපළු ආදිය තොග 34 ක් 1964 දෙසැම්බර් මස 22 වැනි දින පෙරවරු 9.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේදී දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන්නන්ට ඒ ඒ ස්ථානයන් වෙත ගොස් දැව පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

2. වෙන්දේසියේදී දව ඉල්ලුම් කිරීමට අදහස් කරන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩි දුරටත් විස්තර අවශ්‍ය අයට දකුණු දිශා භාර කැලෑ නිලධාරි කාර්‍යාලයයෙන් හෝ බූස්සේ මධ්‍යම දැව ගබඩාවේ වන පාලක නිලධාරි තැනගෙන් හෝ පැමිණ ලබා ගත හැක.

ඒ. ඞී. ආර්. රත්නරාජ,
දකුණු දිසා වන නිලධාරී.

1964.11.17 දින,
ගාල්ලේ,
දිසා වන නිලධාරි කාර්යාලයයේ දීය.

12–312—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුවේ දව වෙන්දේසියේ විකිණීමයි

III වෙනි පන්තියේ රිටි 74 ක් එක ගොඩකට ද, පාවිච්චි කරන ලද කම්බි කණු 63 ක් ගොඩකටද, පාවිච්චි කරන ලද ගේට්ටුවක කෑලි 13 ක් එක ගොඩකටද වෙන් වශයෙන් තබා 1964 දෙසැම්බර් මස 14 වන සඳුදා උදය 10 ට මඩකලපුවේ දර හා රිටි ගබඩාවේ දී, නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවනට දැව වෙන්දේසියට පෙර පරීක්‍ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ මඩකලපුවේ රිටි/හා දර ගබඩාවේ ගබඩා ඕවර්සියර්ගෙන් දැන ගත හැක.

වී. රා. නානායක්කාර,
නැගෙනහිර දිසාවේ, දිසා වන නිලධාරී.

1964.11.23 දින,
මඩකලපුවේ,
දිසා කැලෑ කාර්‍යාලයේදීය.

12–433—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියයි

පහත සඳහන් බඩු රේගුවේ නිවාරණ නිලධාරි තුමාගේ කාර්‍යාලයෙහි 1964 දෙසැම්බර් මස 16 වෙනි දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ඇත.

මෙම බඩු මෙදින පෙරවරු 9 යේ සිට ගැනුම්කරුවන්ට සෝදිසි කර බැලිය හැක. වෙන්දේසියේ කොන්දේසි හා වැඩි විස්තර සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිවාරණ නිලධාරී තුමාගෙන් විමසන්න.

නිවාරණ කාර්‍යාලය,
රජයේ රේගුව,
කොළඹ, 1964 දෙසැම්බර් මස 4 වෙනි දිනදීය.

ඞී. අයි. ගුණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

කපු සහ කෘතිම සේද සාරි සහ රෙදිපිළි වගී
ට්‍රාන්සිස්ටර් රේඩියෝ
සෙල්ලම් බඩු
ඇලුමිනියම් පිඟන් යනාදිය.

12–454—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### පරණ නිල ඇඳුම් ආදිය වෙන්දේසියේ විකිණීම

පරණ නිල ඇඳුම්, සපත්තු, වැහි කබා, ඇළ තොප්පි සහ පාපැදි ආදිය මඩකලපුවේ නැගෙනහිර දිසාවේ සහකාර පොලිස් අධිකාරිගේ ගබඩාවේදී 64.12.22 වන දින පෙරවරු 10 ට වෙන්දේසියේ විකුණනු ලැබේ.

1964.12.22 වන දින පෙරවරු 8 සිට ඉහත සඳහන් ස්ථානයේදී ද්‍රව්‍ය බැලිය හැක.

වෙන්දේසිය අවසන්වූ විගස මුදල් ගෙවිය යුතුයි.

කේ. වී. රාමනාදන්,
සහකාර පොලිස් අධිකාරි,
මඩකලපුව.

64.11.30.

12–347—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

අංකය : ඒ.එක්ස්. 4168.

### තොටුපල් රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය 1965

1964 දෙසැම්බර් මස 18 වැනි දින රජයේ නිවාඩු දිනයක් නිසා, 1964 දෙසැම්බර් මස 4 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වැනි ඡේදයේ පළකරන ලද දැන්වීමේ සඳහන් ටෙන්ඩර් 1964 දෙසැම්බර් මස 21 වන දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලබන බැව් මෙයින් දන්වනු ලැබේ.

බී. එච්. ද සොයිසා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1964 දෙසැම්බර් 7 වන දින,
කොළඹ දිසාපති කාර්යාලයේදීය.

12-571—64.12.11 දින අංක 14,255 දරන ගැසට් පත්‍රය

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

---

ලංකාවේ වැලිවේරියෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි